# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT
# 2011

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශය
රණවිරු සේවා අධිකාරිය

பாதுகாப்பு நகர அபிவிருத்தி அமைச்சு
ரணவிரு சேவை அதிகாரசபை

**MINISTRY OF DEFENCE & URBAN DEVELOPMENT**
**RANAVIRU SEWA AUTHORITY**

# රණවිරු සේවා අධිකාරිය

## වාර්ෂික වාර්තාව

## 2011

**නො. 301 , 4 වන මහළ,**
**ටී.බී.ජයා මාවත, කොළඹ 10.**

පටුන


පිටුව

01. රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම 04
02. පෙරවදන 05
03. අපගේ කාර්යයභාරය 06
04. ඉලක්කගත ප්‍රතිලාභීන් 07
05. අරමුණ/2011 වර්ෂයට ප්‍රවේශය / ව්‍යාපෘති අයවැය 08
06. කළමනාකරණ මණ්ඩලය 09
07. රණවිරු සේවා අධිකාරියේ කාර්යය මණ්ඩලය / ව්‍යාපෘති කළමනාකරු හා පරිපාලන නිළධාරී තනතුර/අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 10
08. මුල්‍යමය ආධාර ලැබීම **11**
09. 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් 12
10. ඉලක්ක සහ අරමුණු ජයගැනීම ක්‍රියාත්මක ක්‍රමවේද **13**
11. දත්ත හා තොරතුරු අංශය **14-17**

12. කායික හා මානසික සවිබල ගැන්වීමේ අංශය
- i. මනෝ සමාජීය ව්‍යාපෘතිය **18-24**
- ii. ආබාධිත සුභසාධන ව්‍යාපෘතිය **25-28**

13. අධ්‍යාපන නිපුණතා හා ආර්ථික සංවර්ධන අංශය
- i. නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය **29-48**
- ii. නිවාස ණය **49-54**
- iii. අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය **55-59**
- iv. මාපිය කැපකරු වැඩසටහන **60-65**
- v. මාපිය සුරැකුම වැඩසටහන **65-68**
- vi. නිවාස ආධාර ව්‍යාපෘතිය **68-70**

14. රණවිරු ගෞරවය හා අභිමානය අංශය
- i. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය **71-73**
- ii. ඉඩම් ව්‍යාපෘතිය **74-76**

15. සමාජීය හා සංස්කෘතික අංශය
- i. සංසද ව්‍යාපෘතිය **77-81**
- ii. රණවිරු ගම්මාන ව්‍යාපෘතිය **81-86**
- iii. සංස්කෘතික අංශය **87**

16. සමාප්තිය **88**

17. විගණකාධිපති වාර්තාව

18. මුල්‍ය ප්‍රකාශය

# රණවිරු සේවා අධිකාරිය

දැක්ම

## රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම

### අපගේ මෙහවර ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ ඒකීය භාවය සුරක්ෂිත කරනු වස් ජීවිත පූජා කළ, අතුරුදහන් වූ සහ ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජීය ස්ථාවරත්වයක් ඇති කිරීම හා සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම.

# පෙරවදන

1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද රණවිරු සේවා අධිකාරිය එදා මෙදා තුර කාලය තුළ විවිධ බාධක හා දුෂ්කරතා ජයගනිමින් පැමිණ ඇති දුර වර්ෂ දොළහක් වැනි සීමිත කාල පරිච්ඡේදයක් වුවත් එ මගින් ලබා තිබෙන අත්දැකීම් සම්භාරය අසමසම ය. රණවිරු සේවා අධිකාරියට පැවරී තිබෙන කාර්යභාරය දෙස බැලීමේ දී එය සුවිශේෂි ලෙස ඉස්මතු ව පෙනෙන්නට විද්‍යාමාන හේතු රාශියකි. විශේෂයෙන් ම දේශිය හා විදේශිය කුමන්ත්‍රණකාරීන්ගේ සටකපටකම්වලට හසු ව අවනත වූ කෲරතර ත්‍රස්තවාදයෙන් ශ්‍රී ලංකාව නැමැති අපගේ සදාදරණීය මාතෘභූමිය බේරා ගෙන රටේත් ජනතාවගේත් නිදහස ගෞරවය , ස්වෛරිභාවය හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කිරීමේ උදාර අපේක්ෂාවන් පෙරදැරිව අභීතව ජීවිත පරිත්‍යාග කළ, අතුරුදහන් වූ සහ සිය ශරීරාංග කැප කළ ජාතියේ වීරෝධාර රටේත් ජනතාවගේත් නිදහස ගෞරවය, ස්වෛරිභාවය හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කිරීමේ උදාර අපේක්ෂාවන් පෙරදැරි ව අභිත ව ජීවිත පරිත්‍යාග කළ, අතුරුදහන් වූ සහ සිය ශරීරාංග කැප කළ ජාතියේ වීරෝධාර රණවිරුවන්ගේ දූ පුතුන්ට, බිරින්දෑවරුවන්ට හා දෙමාපියන්ට අනාගත දිවි පැවැත්ම උදෙසා ශක්තිමත් අත්වැලක් සැපයීම හේතු කොට ගෙන රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය සැබැවින් ම උත්තරීතර වෙයි.

2011 වර්ෂය තුළ මෙම උත්තරීතර කාර්යභාරය ඉෂ්ට කිරීම සදහා රණවිරු සේවා අධිකාරිය විසින් විවිධ ව්‍යාපෘතින් හා වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ වුවද රණවිරු ප්‍රජාව වෙනුවෙන් ප්‍රාමාණික සේවාවක් ලබා දීමට හැකිවීම සාමුහික ධෛර්යය පිළිඹිබු කරන්නක් බව ප්‍රකාශ කරන්නේ ද එයට සහාය ලබා දුන් සියළු දෙනාට ම ගෞරව පිණිස ය.

රණවිරු සේවා අධිකාරියේ ක්‍රියාත්මක වැඩසටහන් එහි සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකිරී වැඩසටහනට අවිරෝධී ව සංවිධානය කිරීම කෙරෙහි මෙම වර්ෂය තුළ විශේෂ අවධානයක් යොමු කරන ලදී. එහි දී අප ලැබූ අත්දැකීම් සියල්ල ලබන වර්ෂයේ දී වඩාත් ක්‍රමවත් හා ඵලදායක ප්‍රගතියක් ඇති කර ගැනීමෙහි ලා බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමි.

ඕනෑ ම ආයතනයක කාර්ය සාධනය අපේක්ෂිත ඉහළ මට්ටමින් පවත්වා ගැනිම සදහා ආයතනයේ කාර්යභාරය, එම කාර්යභාරය යථාර්ථයක් බවට පත් කිරීම සදහා කටයුතු සම්පාදනය කරන කණ්ඩායම සහ එම කණ්ඩායමට අයත් පුද්ගලයන් යන ක්ෂේත්‍ර තුන ම එක හා සමාන ව ක්‍රියාත්මක විය යුතු ය. මෙයින් අදහස්වන්නේ කාර්යභාරය නිසි පරිදි හදුනා නොගැනීම සහ එය සාමුහික ප්‍රයන්තය තුළින් සාර්ථක කර නොගැනීම නිසා කණ්ඩායම තුළ භේදභින්න ඇතිවීමට එය බෙහෙවින් බලපාන බවයි. මෙවැනි භේදභින්නතා කිසියම් ආයතනයක් තුළ වර්ධනයවීම හේතුවෙන් කණ්ඩායමේ එක් එක් සාමාජිකයන් සැහීමකට පත්වීමේ ප්‍රවනතාව බිදවැටී සමස්ත කාර්යභාරයට එයින් අහිතකර බලපෑම් ඇති විය හැකිය.

මෙම ත්ත්වය අප විසින් පැහැදිලි ව තේරුම් ගෙන ඇති නිසා රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය විධිමත් ලෙස ඉෂ්ට කර ගැනීමටත් ඒ හරහා කාර්යමණ්ඩලයේ සාමුහික ප්‍රයන්ත ඒකරාශි කොට පුද්ගල මානසිකත්වය උසස් තලයකට පත් කර ගැනීමටත් ලබන වර්ෂය තුළ දී ජය ගැනීමට අපෙක්ෂා කරන විශේෂිත අරමුණක් බව සදහන් කරමි.

මේ සම්බන්ධයෙන් ආරම්භ කර ඇති වැදගත් ම පියවරක්වන්නේ රණවිරු සේවා අධිකාරියේ කාර්යමණ්ඩල ව්‍යුහය වඩාත් ඵලදායක ලෙස නුතන අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය පියවර ගැනීමයි. එය ලබන වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට පියවර ගැනෙමින් තිබේ

මෙවැනි යහපත් සංවර්ධනයක ප්‍රවේශයක් අනුගමනය කිරීම මගින් අප ප්‍රධාන වශයෙන් ම අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාව නැමැති අපගේ මාතෘභූමිය ආසියිවේ ආශ්චර්යය බවට පත්කර ගැනීමේ ලා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එම අරමුණු ජයග්‍රහණය කරවීම සදහා දුරදර්ශි ව කටයුතු සම්පාදනය කරන ආරක්ෂක ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් අපේක්ෂා කරන නිදහස් නිවහල් ස්වෛරී දේශයක් ගොඩනැංවීම සදහා ක්‍රියාත්මක කර තිබෙන සංවර්ධන වැඩසටහන් සාර්ථක කර ගැනීම සදහා රණවිරු සේවා අධිකාරියේ වගකීම් සම්භාරය නොපිරි හෙළා ඉෂ්ට කිරීම යි.

මේ සද් කාර්යභාරය සදහා පසුගිය වසරවල දී මෙන් ඉදිරියේ දී රණවිරු අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ සියළු ම සාමාජික මහත්ම මහත්මීන්ගේ ද, රණවිරැ සේවා අධිකාරියේ සියළු ම කාර්ය මණ්ඩලයේ ද සක්‍රීය සහයෝගය ගෞරවයෙන් අපේක්ෂා කරමි.

පද්මා වැත්තැව,
**සභාපතිනිය,**
රණවිරු සේවා අධිකාරිය.

# අපගේ කාර්ය භාරය

(1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතට අනුව )

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධින සැලැස්වීම.

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල හා පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ

(ii) ක්‍රියාන්විතයේ දී මිය ගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට
නිවාස සැපයීම සහ එහි ලා සහායවීම

(ඇ) :i) ක්‍රියාන්විකයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට
වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහායවීම

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට
ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා දීමෙන් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීම සඳහා ඔවුන්ට අවස්ථාව සලසා දීම

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ
(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට
සඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහායවීම

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණු ඇති ව කාර්මික, කෘෂි කාර්මික හෝ වානිජ ව්‍යවසායයන් පිහිටුවීම සහ

(උ) අධිකාරියේ කාර්යභාරයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා කටයුතු ක්‍රියාත්මක කිරීම

# ඉලක්ක ගත ප්‍රතිලාභීන්

රණවිරු සේවා අධිකාරියේ මෙහෙවර වී ඇත්තේ නිශ්චිත වර්ගීකරණයක් යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන් සමූහයකගේ සුභසාධනය ඇති කිරීමයි. එම ප්‍රතිලාභීන් නම්

- රටදැය වෙනුවෙන් දිවිපිදූ අතුරුදහන් 29,934 කට අධික රණවිරුවන්ගේ යැපෙනන්
- මාතෘභූමියේ සුරක්ෂිතභාවය ඇති කරනු සඳහා වූ ක්‍රියාන්විතයේ දී ආබාධිත වූ රණවිරුවන්

2011 වර්ෂය වන විට දිවිපිදූ / අතුරුදහන් හා ආබාධිත රණවිරුවන් සංඛ්‍යාව පළාත් වශයෙන්

| පළාත | දිවි පිදූ රණවිරුවන් (අතුරුදහන් රණවිරුවන් ද ඇතුළත් ව ) | ආබාධිත විශ්‍රාමාක රණවිරුවන් | මුළු රණවිරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දකුණු පළාත | 3899 | 591 | 4490 |
| බස්නාහිර පළාත | 4681 | 1185 | 5866 |
| මධ්‍යම පළාත | 4505 | 771 | 5276 |
| සබරගමුව පළාත | 2963 | 440 | 3403 |
| වයඹ පළාත | 4616 | 850 | 5466 |
| ඌව පළාත | 3064 | 384 | 3448 |
| උතුරු මැද පළාත | 4352 | 760 | 5112 |
| උතුරු හා නැගෙනහිර පළාත | 1854 | 184 | 2038 |
| එකතුව | **29934** | **5165** | **35099** |

2011 වර්ෂය වන විට දිවිපිදූ / අතුරුදහන් රණවිරු පවුල් සංඛ්‍යාව පළාත් වශයෙන්

| පළාත | විවාහක | අවිවාහක |
|---|---|---|
| දකුණු පළාත | 1154 | 2740 |
| බස්නාහිර පළාත | 1603 | 3078 |
| මධ්‍යම පළාත | 1403 | 3102 |
| සබරගමුව පළාත | 890 | 2073 |
| වයඹ පළාත | 1458 | 3158 |
| ඌව පළාත | 909 | 2155 |
| උතුරු මැද පළාත | 1465 | 2887 |
| උතුරු හා නැගෙනහිර පළාත | 799 | 1060 |
| එකතුව | **9681** | **20253** |

# අරමුණු

1. රණවිරු නාමය ට ගෞරවයෙන් හා අභිමානයක් ඇති වන පරිදි දිවයින පුරා තනි පවුල් වශයෙන් විසිරී සිටින රණවිරු පවුල් එක්රැස් කොට මනා සන්නිවේදනයක් ඇති කිරීම.

2. ආත්ම විශ්වාසයෙන් යුතු තෘප්තිමත් රණවිරු පවුල් සාමාජිකයින් පිරිසක් බිහි කිරීම.

3. සෑම රණවිරු පවුලකට ම ස්ථිර නිවසක හිමිකම ලබා දීම

4. ඉඩම් නොමැති රණවිරු පවුල් සඳහා නිවාස තැනීමට සුදුසු ඉඩම් ලබා දීම.

5. රණවිරුවන්ගේ මෙන් ම ඔවුන්ගේ සමීපතම ඥාතීන්ගේ හදිසි අවස්ථාවන්හි දී එම අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍යමය වශයෙන් රුකුල් දීම.

6. රණවිරු පවුල්වල සාමාජිකයින්ට ස්වශක්තියෙන් නැගී සිටීම සඳහා අවස්ථාව උදාකර දීම.

7. ආබාධිත රණවිරුවන් ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන පිරිසක් බවට පත් කිරීම.

8. රණවිරු නාමය මූර්තිමත් කරන ආදර්ශ ගම්මාන ඇති කිරීම.

9. රණවිරුවන්ගේ උත්තරීතර මෙහෙයට ජනතාවගේ භක්තිපූර්වක කෘතවේදිත්වය පිළිබිඹු වන අයුරින් ජාතික රණවිරු අනුස්මරණ උත්සව පැවැත්වීම.

10. ජීවිත පරිත්‍යාගයෙන්, අතුරුදහන්වීමෙන් හා සිය ශරීරාංග පුද කිරීමෙන් මාතෘභූමියේ ස්වෛරීභාවය, නිදහස හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කර දුන් රණවිරුවන් ශ්‍රී ලාංකීය වංශකථාව තුළ අමරණීයත්වයට පත් කිරීම.

# 2011 වර්ෂයට ප්‍රවේශය

2000 වර්ෂයේ දී ආරම්භ වී මේ වන විට වසර 11 ක් සම්පූර්ණ කොට ඇති දේශයේ ස්වාධීනත්වය උදෙසා සිට ජීවිත පූජා කළ හා අතුරුදහන් වූ රණවිරුවන්ගේ, පවුල් සාමාජිකයින්ගේ හා ක්‍රියාන්විතයේ දී සිය අඟපසඟ පූජා කර වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධනය සලසනු වස් වසර 2000 දී ආරම්භ වූ රණවිරු සේවා අධිකාරිය පුමුඛ ක්ෂේත්‍ර 10 ක් ඔස්සේ 2010 වර්ෂය දක්වා සිය වැඩසටහන් වාර්ෂික ව සැලසුම් කොට ක්‍රියාත්මක කර ගෙන යනු ලැබූ අතර, 2011 වර්ෂයේ දී අංශ 05 ක් යටතේ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. මීට අමතර ව, දැනට සේවයේ නියුතු රණවිරුවන්ගේ චිත්ත ධෛර්යය නංවනු සඳහා ඔවුන් වෙනුවෙන් ද සුබසාධන සේවා සලසා ඇත.

# ව්‍යාපෘති අයවැය

2011 වර්ෂය වෙනුවෙන් අධිකාරියේ අංශ 05 ක් යටතේ හා මාධ්‍ය අංශය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් අයවැය ඇස්තමේන්තු කළමනාකරන මණ්ඩලය වෙත ඉදිරිපත් කොට එම අනුමැතියෙන් සුබසාධන සේවා සඳහා වැය දරන ලදී.

ව්‍යාපෘති ප්‍රගතිය එම ව්‍යාපෘති ශීර්ෂ යටතේ ඉදිරියේ ඉදිරිපත් කර ඇත.

# කළමනාකරණ මණ්ඩලය

2011 වර්ෂය ආරම්භ වන විට කළමණාකරන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

පද්මා වැත්තැව මහත්මිය - සභාපති

නීතිඥ ආර් එස් ආරියප්පෙරුම මහතා - උපසභාපති

මේජර් ජෙනරල් පාලිත ප්‍රනාන්දු මහතා USP, psc - හමුදා සම්බන්ධීකරණ නිළධාරී ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිත

අයිවන් තිසේරා මහතා - අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ නියෝජිත

මල්කාන්ති ජයවර්ධන මහත්මිය - අධ්‍යක්ෂිකා, සන්නද්ධ හමුදා සහ පොලිස් සුභසාධන අංශය

දිලිත් ජයවීර මහතා

රියර් අද්දිරාල් එස් එම් බී වීරසේකර මහතා RSP,USP,ndu,psu නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදාව

එයාර් වයිෂ් මාෂල් එච් ඩී අබේවික්‍රම මහතා , නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී , ශ්‍රී ලංකා ගුවන් හමුදාව ,

ඩී එස් වානගුරු මහතා, නියෝජ්‍ය පොලිස්පති (සුභසාධන දිශාව), ශ්‍රී ලංකා පොලීසිය

මේජර් ජෙනරාල් ඊපීද ඉසඩ් අබේසේකර මහතා USP,විධායක ජෙනරාල්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

හිරන්සා කළුතන්ත්‍රී මහත්මිය, සහකාර අධ්‍යක්ෂිකා, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

එයාර් වයිෂ් මාෂල් එච් ඩී අබේවික්‍රම මහතා, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, මෙතුමාගේ ඉවත් ව යාමෙන් පසු 2011 මැයි 16 වන දින එයාර් වයිෂ් මාෂල් කේ ඒ ගුණතිලක මහතා එම පුරප්පාඩුවට පත් විය.

මේජර් ජෙනරාල් ඊපීද ඉසඩ් අබේසේකර මහතා USP, විධායක ජෙනරාල්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මෙතුමාගේ ඉවත් ව යාමෙන් පසු 2011 මැයි 26 වන දින සිට මේජර් ජෙනරාල් ආර් එම් ඩී රත්නායක මහතා මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාව එම පුරප්පාඩුවට පත් විය.

රියර් අද්මිරාල් එස් එම් බී වීරසේකර මහතා RSP,USP,ndu,psu නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදාව,
මෙතුමාගේ ඉවත් ව යාමෙන් පසු 2011.06.20 වන දින සිට රියර් අද්මිරාල් එම් ටී ඩී ජේ ධර්මසිරිවර්ධන මහතා, අධ්‍යක්ෂක ජෙනරාල් සේවා, නාවික හමුදාව එම තනතුරට පත්විය.

**ඩී එස් වානගුරු මහතා, නියෝජ්‍ය පොලිස්පති (සුභසාධන දිශාව), ශ්‍රී ලංකා පොලීසිය,**
**මෙතුමාගේ ඉවත් ව යාමෙන් පසු 2011.06.28 වන දින සිට නියෝජ්‍ය පොලිස්පති එච් එස් පී එච් හෙක්ටර් ධර්මසිරි මහතා එම පුරප්පාඩුවට පත්විය.**

## රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය

ස්ථිර,කොන්ත්‍රාත් සේවා සහ අනුයුක්ත වශයෙන් රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය සමන්විත ව ඇත. ආරම්භයේ දී අධිකාරිය මගින් සිය සේවා දායකයින් උදෙසා ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාවට වඩා විශාල ප්‍රමාණයක් 2010 වර්ෂය වන විට ක්‍රියාත්මක කළ ද කාර්ය මණ්ඩලයේ වැඩිවීමක් සිදු නොවිණි. මෙම කාරණය සම්බන්ධව හා එහි අවශ්‍යතාව පිළිබ්ව 2011 වර්ෂයේ දී රණවිරු සේවා අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ උපදෙස් පරිදි මහාභාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කොට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. ඒ අනුව 2011 වර්ෂයේ දී ඒ හා සම්බන්ධ කටයුතු සැලසුම් කරන ලදී. පසු ගිය වර්ෂ දෙකෙහි දී ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මගින් පුහුණුවට අනුයුක්ත කරනු ලැබුවන් කොන්ත්‍රාත් පදනමින් 14 දෙනෙකු බඳවා ගනු ලැබුව ද 2011 වර්ෂය තුළ දී ඉන් 10 දෙනෙකු සේවයෙහි යොදවන ලද අතර,ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරිමේ අධිකාරියේ පුහුණුවන්නන් 04 දෙනෙකු ද මෙම වසරේ දී බඳවා ගත් අතර, අධිකාරියේ කටයුතු හොඳින් කරගෙන යාමට එය බෙහෙවින් උපකාරී විය.
ඊට අමතරව ත්‍රිවිධ හමුදාවේ හා පොලිසිය මගින් අධිකාරියේ කටයුතුවල දී අදාළ සේවාවන් හා සම්බන්ධ ව කටයුතු පහසුවෙන් කරගෙන යෑම සඳහා සේවයක පරිසක් අනුයුක්ත කරන ලදී.

## ව්‍යාපෘති කළමනාකරු තනතුර හා පරිපාලන නිළධාරී තනතුර

ව්‍යාපෘති කළමනාකාර ධුරයත්, පරිපාලන නිළධාරීධුරයත් සඳහා කළමනාකරන මණ්ඩලයේ අනුමැතිය ට අනුව කොන්ත්‍රාත් පදනමින් නිළධාරීන් දෙදෙනකු පත් කරන ලදී.

## අධිකාරියේ ප්‍රධාන කාර්යාලය

රණවිරු සේවා අධිකාරියේ ආරම්භයේ සිට මුහුණ දුන් ප්‍රධානතම ගැටලුවක් වූයේ රණවිරු සේවා අධිකාරිය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීමයි. එහෙත් 2009 වර්ෂයේ දී රණවිරු සේවා අධිකාරිය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් බම්බලපිටිය නගරාසන්නයේ ගාළු පාරට මායිම් ව මිළ දී ගැනීමට හැකියාව ලැබුනු අතර 2010 වර්ෂයේ දී එම ගොඩනැගිල්ල අමතර මහල් සහිත ව කාර්යාලය සඳහා සුදුසු වන පරිදි ඉදිකිරීම ආරම්භ කරන ලදී. කෙසේ වෙතත් රණවිරු සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය එම ගොඩනැගිල්ලට ගෙන යාම 2012 වර්ෂයේ මුල් කාර්තුව තුළ සිදු කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# මූල්‍යමය ආධාර ලැබීම

රණවිරු සේවා අධිකාරියේ ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලැබීම පහත පරිදි සිදු වේ.

1. පරිපාලන සහ අනෙකුත් දෛනික කටයුතුවලට අවශ්‍ය මූල්‍ය සම්පත් වාර්ෂික ව මහා භාණ්ඩාරයෙන් ලැබේ.
2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජයවිරු ලොතරැයිය පසු ව සුපිරිවාසනා සම්පත මගින් ලබා දෙන මූල්‍ය දායකත්වය.

මීට අමතර ව රණවිරු සේවා අධිකාරියේ විවිධ ව්‍යාපෘතීන් මගින් ක්‍රියාත්මක කරන සුභසාධන කටයුතු සඳහා දේශීය විදේශීය දානපතීන් විසින් මූල්‍යමය හා ද්‍රව්‍යමය පරිත්‍යාග ලබා දෙන ලදී.

රණවිරු සේවා අධිකාරි පනතේ වගන්තිවලට අනුරූප ව රණවිරු ප්‍රතිලාභීන්ගේ විවිධ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සැලසුම් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කර ගැනීමේ ක්‍රමෝපායක් ඇති කිරීමේ අරමුණින් බැංකුවල මුදල් ආයෝජනය කර ඒ මගින් අමතර ආදායම් ඉපැයීමේ ක්‍රියාවලියක නියැලුණි. ඒ සඳහා වඩාත් ම උචිත ආයෝජන ක්‍රමයන් තෝරා ගන්නා ලදී.

2011 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් හා ලොතරැයියෙන් ලැබුණු ආදායම් පිළිබඳ ව විස්තර සහිත ව මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් අවසන් ගිණුම් වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

# 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්

## 1. රණවිරු සැමරුම් සතිය

අතිගරු ජනාධිපතිතුමන් හට රණවිරු කොඩිය පැළඳවීමේ උත්සවය මැයි මස 11 වැනි දින අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහනට සමගාමී ව ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද රණවිරු අනුස්මරණ සතිය වෙනුවෙන් (මැයි 11 වැනි දින සිට මැයි 18 දක්වා) දිවයින පුරා විවිධ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ අතර, විශේෂයෙන් ම ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පළාත් රණවිරු අනුස්මරණ උත්සව ද පවත්වන ලදී.

## 2. ජාතික රණවිරු අනුස්මරණ දිනය

දේශයේ සුරක්ෂිතභාවය වෙනුවෙන් සිය ජීවිත පූජා කළ රණවිරුවන් අනුස්මරණය කිරීම උදෙසා රණවිරු සේවා අධිකාරියේ වන ප්‍රධානතම ජාතික උත්සවය 2011 ජුනි මස 18 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ පිහිටි රණවිරු පිහිටි රණවිරු ස්මාරකය අභියස දී සාම්ප්‍රදායානුකූල ව ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ උත්තමාචාරය මැද ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු කථානායකතුමන්, ප්‍රධාන කොට සර්ව ආගමික නායකතුමන්ලා , මැති ඇමතිවරුන් , ආණ්ඩුකාරවරුන් , පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් , ගරු ජනාධිපති ලේකම්, ගරු ආරක්ෂක ලේකම් ප්‍රධාන රාජ්‍ය නිළධාරීන්, ඒකාබද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන් හා පොලිස්පතිතුමන් රජයේ ආයතනික ප්‍රධානීන් මෙන් ම තානාපතිවරුන් හා තානාපති කාර්යාලවලට අනුයුක්ත ආරක්ෂක නියෝජිතයින් හා දිවිපිදූ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟ ම ඥාතීන් හා ආබාධිත රණවිරුවන්ගේ ද ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම උත්සවය සෑම වසරක ම මැයි මාසයේ පැවැත්වීමට කටයුතු කෙරේ.

## 3. දැයට කිරුළ

රජයේ සංවර්ධන ක්‍රියාදාමය ජනතාව වෙත සන්නිවේදනය කරනු සඳහා සියලු ම රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශය ද සම්බන්ධ කර ගනිමින් පෙබරවාරි 04 සිට 09 වැනි දා දක්වා බුත්තල දී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා රණවිරු සේවා අධිකාරිය මගින් ද ප්‍රදර්ශන කුටියක් සංවිධානය කොට පවත්වන ලදී. රණවිරු ප්‍රජාව වෙත අධිකාරිය මගින් ලබා දෙන සුබසාධන සේවාවන් හා අනෙකුත් වැඩසටහන් පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම ට එම ප්‍රදර්ශනය බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

## 4. ත්‍රී රෝද රථ ප්‍රදානෝත්සවය

**රණවිරු සේවා අධිකාරියේ ආබාධිත සුබසාධන ව්‍යාපෘතිය හා සහන ණය ව්‍යාපෘතිය ඒකාබද්ධ ව ක්‍රියාත්මක කරනු ලබන ආබාධිත රණවිරුවන් සඳහා ත්‍රී රෝද රථ ප්‍රදානය කිරීමේ උත්සවය අතිගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා ත්‍රිවිධ හමුදාපතිවරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් සහභාගීත්වයෙන් 2011 නොවැ. 18 වැනි දින ගාලු මුවදොර යුධ හමුදා ක්‍රීඩාංගනයේ දී පැවැත්විනි. එහි දි ආබාධිත රණවිරුවන් 170 දෙනෙකු සඳහා ත්‍රී රෝද රථ ප්‍රදානය කරන ලදී.**

## 5. උත්තම පූජා ප්‍රණාම පදක්කම් උත්සවය

රණවිරුවා රණබිමට පරිත්‍යාග කළ රණවිරු දෙමාපියන්, බිරින්දෑවරුන්, දරුවන් ඇගයීමක් සඳහා උත්තම පූජා පදක්කම් ප්‍රදානය කිරීම දිස්ත්‍රික්ක පදනමින් ක්‍රියාත්මක කිරීම. ඒ අනුව දිස්ත්‍රික්ක 17 ක් ආවරණය වන පරිදි මෙම වසරේ දී උත්තම පූජා ප්‍රණාම පදක්කම් උත්සව පවත්වා ඇත.

# ඉලක්ක සහ අරමුණු
# ජය ගැනීම සඳහා ක්‍රියාත්මක ක්‍රමවේද

මෙහෙවර ප්‍රධාන වශයෙන් ඉලක්කයන් දෙකක් ඔස්සේ ව්‍යාපෘතීන් 10 ක් ක්‍රියාත්මක කිරීම අධිකාරිය මගින් ක්‍රියාවට නැංවිය. ඒ අනුව

01. ශක්තිමත් මානසිකත්වයකින් යුතු ව අභිමානවත් දැක්මක් සඳහා රණවිරු පවුල් සමාජගත කිරීම.

02. සමාජීය වශයෙන් උසස් ජීවන තත්ත්වයක් ළගා කර දීමට රණවිරුවන් හා එම පවුල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික සම්පත් ප්‍රමුඛතා පදනමක් මත ලබා දීම.

මෙම දෙඅංශය ඔස්සේ දිවෙන ව්‍යාපෘතීන්, දිවයින පුරා විසිරී සිටින රණවිරු ප්‍රජාවගේ යෝජනා හා අදහස් මෙන් ම විශේෂඥ දැනුම ද සංකලනය කරමින් සකස් කොට ඇත. එසේ සැකසුන ක්‍රියාත්මක සැලැස්ම නැවත රණවිරු ප්‍රජාවගේ එකගතාව ලබා ගනිමින් ක්‍රියාත්මක වේ.

01. ශක්තිමත් මනසකින් යුතුව අභිමානවත් දැක්මක් සමාජ ගත කිරීම සඳහා පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

01. රණවිරු සංසද ව්‍යාපෘතිය
02. මනෝ සමාජීය ව්‍යාපෘතිය
03. ආබාධිත සුබසාධන ව්‍යාපෘතිය
04. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය
05. රණවිරු ගම්මාන ව්‍යාපෘතිය

02. සමාජීය වශයෙන් උසස් ජීවන තත්ත්වයක් ළගා කර දීමට රණවිරුවන් හා එම පවුල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික සම්පත් ප්‍රමුඛතා පදනමක් මත ලබා දීමට ක්‍රියාත්මක ව්‍යාපෘති,

01. නිවාස ව්‍යාපෘතිය
02. සහන ණය ව්‍යාපෘතිය
03. ඉඩම් ව්‍යාපෘතිය
04. ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
05. නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

2011 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතීන් ඒ ඒ විෂයන් ගේ සමානත්වය සලකා බලා අංශ 05 ක් යටතේ ක්‍රියාත්මක විය. ඒ අනුව,

01. දත්ත හා තොරතුරු අංශය

02. කායික හා මානසික සවිබල ගැනීවීමේ අංශය

03. අධ්‍යාපන, නිපුණතා හා ආර්ථික සංවර්ධන අංශය

04. රණවිර ගෞරවය හා අභිමානය අංශය

05. සමාජීය හා සංස්කෘතික අංශය

## 01. දත්ත හා තොරතුරු අංශය

අරමුණු

- රණවිරු දත්ත පද්ධතිය පවත්වා ගැනීම.
- තොරතුරු විශ්ලේෂණය හා විග්‍රහ කිරීම.

### 01. රණවිරු දත්ත පද්ධතිය

රණවිරු සේවා අධිකාරි පනතේ 6 වන පරිච්ඡේදයේ (අ) සහ (ආ) වගන්ති ප්‍රකාර ව සේවා ආයතනයන්ගේ විස්තර හා තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකසා ගැනීම හා එය නිරන්තර ව යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම දත්ත හා තොරතුරු අංශයේ එක් ප්‍රධාන අරමුණකි.

- **දත්ත පද්ධතිය සැකසීම**

මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ අනුග්‍රහය ද ලබා මෘදුකාංග පද්ධතියක් සකසා ඇත. ඒ අනුව අදාල ප්‍රශ්නාවලිය රණවිරු ප්‍රජාවගේ සමස්ත ආර්ථික හා සාමාජීය තොරතුරු ද ඇතුළත් කොට සකස් කර ඇති අතර ඔවුන්ගේ නිවෙස්වලට ගොස් අදාල තොරතුරු ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහයෝගය ලබාගෙන ඇත.

**2012 වර්ෂයේ දී දත්ත සමීක්ෂණ කටයුතු අවසන් කොට දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ.**

| අනු අංක | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | අභ්‍යන්තර තොරතුරු රැස් කිරිම | 90% අවසන් |
| 02 | සාමාජිකත්ව සමීක්ෂණය සඳහා නිපුණතාවක් ඇති රාජ්‍ය ආයතනයක් තෝරා ගැනීම. | අවසන් |
| 03 | තොරතුරු පත්‍රිකාවක් සැකසීම. ( මනෝ සාමාජයීය ආර්ථික තොරතුරු සමඟ ) | අවසන් |
| 04 | අධිකාරියේ අධීක්ෂණයෙන් යුතුව මෘදුකාංග පද්ධතියක් සකසා ගැනීම | අවසන් |
| 05 | පළාත් නිළධාරින් විසින් සමීක්ෂකයින් 15 බැගින් තෝරා ගැනීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම. | අවසන් |
| 06 | මුලික සමීක්ෂණයක් සිදුකිරිම හා එය සමාලෝචනය | අවසන් |
| 07 | දත්ත රැස් කිරිම ( සංසද, ග්‍රා.නි හා ප්‍රා.ලේ සහතිකය සමඟ ) | කටයුතු සිදු කරමින් පවති |
| 08 | අභ්‍යන්තර පරිඝණක ජාලගත කිරිම | මුලික කටයුතු සිදු කරමින් ඇත. |

වගුව 1. රණවිරු දත්ත පද්ධතිය සැකසීම.

## 2012 වසරේ දී පහත සදහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

- තොරතුරු පරිසණක ගත කිරිම
- 10% නියදි පරීක්ෂාවක් සිදු කිරිම
- ඒ ඒ ව්‍යාපෘති තොරතුරු එසැනින් පරිසණක ගත කිරිම
- සමස්ත ක්‍රමවේදය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරිම.
- මෘදුකාංගය මගින් ලබා දෙන පණිවිඩ සඳහා ප්‍රතිචාර දැක්වීම.
- සාමාජික තොරතුරු යාවත්කාලීන කිරිම.
- ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා විශ්ලේෂණය සිදුකිරිම.
- මාසිකව පළාත් කාර්යාල මෘදුකාංග යාවත්කාලිව කිරිම හා අන්තර්ජාලය ඔස්සේ දිනපතා පලාත්භාර දිස්ත්‍රික් නිළධාරින් වෙත යොමු කිරිම.

- **නාමලේඛණ ( ගැසට් කිරිම සඳහා ) පරිවර්ථනය කර පරිසණක ගත කිරීම.**

උත්තම පූජා ප්‍රණාම පදක්කම ලබා දී ඇති දිස්ත්‍රික්කයන් හි නාම ලේඛණ ගැසට් කිරිම සඳහා සැකසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ මහනුවර, පුත්තලම, පොළොන්නරුව, කොළඹ, කළුතර, ගම්පහ, මඩකළපුව, ත්‍රිකුණාමළය, බදුල්ල, කැගල්ල, අනුරාධපුරය, කුරුණෑගල, හම්බන්තොට, නුවරඑළිය වේ.

| ඉලක්ක ගත ප්‍රමාණය | වසර තුළ ප්‍රගතිය |
|---|---|
| 44781<br>( දළ වශයෙන්) | 25264 |

වගුව 2. නාමලේඛණ ( ගැසට් කිරිම සඳහා ) පරිවර්ථනය කර පරිසණක ගත කිරිම




ප්‍රස්ථාර 1. නාමලේඛණ ( ගැසට් කිරිම සඳහා ) පරිවර්ථනය කර පරිසණක ගත කිරිම

## ප්‍රමුඛතා ලබා දීමේ අරමුණින් රණවිරු ළඟම ඥාති හැඳුනුම්පත් සැකසීම

රණවිරු ප්‍රජාව ප්‍රාදේශීය වශයෙන් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළුවක් වන රණවිරු ප්‍රමුඛතාව ලබා දීමේ අරමුණින් රණවිරු ප්‍රජාවගේ ඉල්ලීමකට හා ආරක්ෂක අමාත්‍යාංශයේ මගපෙන්වීමකට අනුව රණවිරු ළඟම ඥාතීන් වෙත රණවිරු පවුල් සාමාජිකයෙකු ලෙස හඳුනා ගැනීමේ පත්‍රයක් නිකුත් කිරීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව 2011 වසරේදී නව හැඳුනුම්පත් 1000 ක් රණවිරු ළඟ ම ඥාතීන් වෙත ලබා දීමට අපේක්ෂා කරන ලද අතර හැඳුනුම්පත් 1043 ක් නිපදවා ලබා දීමට හැකියාව ලැබිණි.

| වර්ෂය | ඉලක්ක ගත ප්‍රමාණය | වසර තුළ ප්‍රගතිය |
|---|---|---|
| 2011 | 1000 | 1043 |
| 2010 | 2000 | 2131 |

වගුව 3. ප්‍රමුඛතා ලබා දීමේ අරමුණින් රණවිරු ළඟම ඥාති හැඳුනුම්පත් සැකසීම




ප්‍රස්ථාර 2. ප්‍රමුඛතා ලබා දීමේ අරමුණින් රණවිරු ළඟම ඥාති හැඳුනුම්පත් සැකසීම

රණවිරු හැඳුනුම්පත් සැකසීම සඳහා ඉදිරිපත් වන ආකාරය හා එහි සිට හැඳුනුම්පත සැකසීම තෙක් ගතවන කාලය හා සිදුකිරීමට ඇති කාර්යන් සළකා බැලීමේ දී සමස්තය ලබා දීමට විශාල කාලයක් ගනු ඇත. ඒ අනුව විකල්ප ක්‍රමයක් ලෙස දත්ත ගබඩාව උපයෝගී කරගෙන රණවිරු ඥාතීන් වෙත හැඳුනුම්පත් ලබා දීමට 2012 වසරේ සිට කටයුතු කිරීමට අපේක්ෂිත ය.

## රණවිරුවෙකු දිවිපිදීමේ දී හා වෙනත් හදිසි ආපදාවන් හිදි මූල්‍ය ආධාර ලබා දීම.

ක්‍රියාන්විත සේවයේ දී ජීවිතය පූජා කරන රණවිරුවෙකු වෙනුවෙන් ළඟ ම ඥාතියා/ මෘත දේහය තබන ළඟ ම ඥාතියා/ තුන්මාස දානය පැවැත්වෙන ළඟම ඥාතියා යන කාරනා අතරින් වැඩිදායකත්වයක් ලබන ළඟ ම ඥාතියා වෙත රුපියල් 10,000 ක මුදලක් ලබා දෙමින් ක්ෂණික සහනයක් ලබා දීම හා ඒ සමඟ අදාල රණවිරු පවුල රණවිරු සංසද ක්‍රමවේදය වෙත බඳවා ගැනීම මෙහි මුල් අරමුණ විය.

ඒ අනුව පහත පරිදි මූල්‍ය ආධාර ලබා දෙන ලදි.

| වර්ෂය | ඉලක්ක ගත ප්‍රමාණය | වසර තුළ ප්‍රගතිය |
|---|---|---|
| 2010 | 800 | 802 |
| 2011 | 800 | 1340 |

වගුව 4. රණවිරුවෙකු දිවිපිදීමේ දී හා වෙනත් හදිසි ආපදාවන් හිදි මූල්‍ය ආධාර ලබා දීම.




ප්‍රස්ථාර 3 රණවිරුවෙකු දිවිපිදීමේ දී හා වෙනත් හදිසි ආපදාවන් හිදි මූල්‍ය ආධාර ලබා දීම.

ඒ අනුව 2011 වර්ෂය අවසානයේ දී මෙය යටතේ සියළු ගෙවීම් සිදු කර අවසන් කරන ලදී.

## උත්තම පූජා ප්‍රණාම පදක්කම සඳහා දායකත්වය ලබා දීම.

උත්තම පූජා ප්‍රණාම පදක්කම ලබා දීම සඳහා අවශ්‍ය නාමලේඛණ හා තොරතුරු ලබා දීම සිදු කරන ලදී. එය යටතේ හම්බන්තොට හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි නාමලේඛණ මුද්‍රණය කර ලබා දීම හා තොරතුරු සාරංශයන් ලබා දීම සිදු කරන ලදි.

## 01. කායික හා මානසික සෞඛ්‍ය සවිබල ගැන්වීමේ අංශය

### I. මනෝ සමාජීය ව්‍යාපෘතිය

01. වෛද්‍ය සායන

| 2011 වර්ෂයේ දී වෛද්‍ය සායන පැවැත්වීම | |
|---|---|
| අනු අංකය | ස්ථානය හා දිනය |
| 01 | 2011/01/ 27 - මොණරාගල දිස්ත්‍රික් සංසද සාමාජිකයින් සඳහා බුත්තල ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ දී පැවති වෛද්‍ය සායනය (දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමී ව ) |
| 02 | 2011/06/10 - කළුතර දිස්ත්‍රික් සංසද සාමාජිකයන් සඳහා නාගොඩ ෆැමිලි කෙයාර් රෝහලේ දී පැවති වෛද්‍ය සායනය (ජාතික රණවිරු මාසයට සමගාමී ව) |
| 03 | 2011/12/13 - කැබැතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලයේ පැවැත්වීමට නියමිත වූ වෛද්‍ය සායනය හදිසි රාජකාරී කටයුතු යෙදීම නිසා කල්තැබීමට සිදු විය. |

**02.** බාහිර ආයතනවල උපදේශකවරුන් සහය කර ගැනීමේ වැඩසටහන

මූලික සම්බන්ධිකරණ කටයුතු සිදු කරගත් නමුත් වැඩසටහන් ව්‍යුහය නැවත ප්‍රතිසංස්කරනය කිරීමට තීරණය වූ බැවින් (සභාපතිතුමියගේ උපදෙස් පරිදි) 2012 වසරේ දී ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**03.** මනෝ විද්‍යාත්මක වැඩසටහන්

| කණ්ඩායම් උපදේශනය | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | ස්ථානය හා දිනය | වැඩසටහන | වැඩසටහන් ගණන |
| 01 | බස්නාහිර | කොළඹ | | | - |
| 02 | | ගම්පහ | 2011/12/17 - මහර ප්‍රාදේශිය කාර්යාලය | මනෝ විද්‍යාත්මක වැඩමුළුව | 01 |
| 03 | | කළුතර | | | - |
| 04 | දකුණ | ගාල්ල | | | - |
| 05 | | මාතර | | | - |
| 06 | | හම්බන්තොට | | | - |
| 07 | මධ්‍යම | මහනුවර | | | - |
| 08 | | මාතලේ | | | - |
| 09 | | නුවරඑළිය | | | - |
| 10 | ඌව | බදුල්ල | | | - |
| 11 | | මොණරාගල | | | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | සබරගමුව | කෑගල්ල | | | - |
| 13 | | රත්නපුරය | | | - |
| 14 | උතුරු මැද | අනුරාධපුරය | 2011/12/04,05 - අභිමංසල සුව සේවා නිකේතනය - අනුරාධපුරය. | ආබාධිත රණවිරු දෙදින නේවාසික පුහුණු වැඩමුළුව | 01 |
| 15 | | පොළොන්නරුව | | | - |
| 16 | නැගෙනහිර | අම්පාර | | | - |
| 17 | | ත්‍රිකුණාමලය | | | - |
| 18 | වයඹ | කුරුණෑගල | 2011/10/13 - කුලියාපිටිය ශිල්ප ශාලිකා ශාලාව | මනෝ විද්‍යාත්මක වැඩමුළුව | 01 |
| 19 | | පුත්තලම | 2011/11/22 - හලාවත සුදසුන ශාලාව | මනෝ විද්‍යාත්මක වැඩමුළුව | 01 |
| එකතුව | | | | | 04 |

<u>වැඩමුළු සංවිධානයේ දී මතු වූ ප්‍රායෝගික දුෂ්කරතා</u>

එක් එක් පළාත සඳහා ඇවැසි වැඩසටහන් සංවිධානය කර ව්‍යාපෘතිය දැනුවත් කරන ලෙස පළාත් නිළධාරීන්හට දැනුම් දී තිබු නමුත් එම කාර්යය නිසියාකාර ව සිදු කිරීමට අපොහොසත් වු පසුබිමක් තුළ අපේක්ෂිත ප්‍රමාණයෙන් වැඩසටහන් පවත්වා ගැනීමට අපහසු වී තිබේ.

## 05. වෛද්‍ය ආධාර ලබා දීම

බරපතල රෝගාබාධයන්ට ලක්ව ප්‍රතිකාර / සැත්කම් සිදුකිරීමට නියමිත එහෙත් ඒ සඳහා මුල්‍ය ගැටළු ඇති අඩු ආදායම්ලාභී රණවිරුවන්ට හා රණවිරු පවුල්වල සාමජිකයින්ට මුල්‍ය ආධාර පහසුකම් ලබා දීමට මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරෙණි. එක් අයෙකුට ආධාර වශයෙන් ලබා දෙන උපරිම මුදල රු.50,000.00 කි.

- 2011 වසරේ ඉලක්ක ගත ආධාර සංඛ්‍යාව - ඉල්ලීම් ලැබෙන පරිදි
- 2011 වසර සඳහා වෙන් කළ මුදල - රු. 800,000/- කි.
- 2011 වසරේ ලබා දී ඇති ආධාර සංඛ්‍යාව - 18
- 2011 වසර සඳහා නිකුත් කළ අයදුම්පත් ගණණ - 20
- 2011 වසර සඳහා ලැබී ඇති ඉල්ලීම් ප්‍රමාණය
- ලිඛිත ඉල්ලීම් - 18
    - දුරකථනයෙන් ලැබුනු ඉල්ලීම් (දළ වශයෙන්) - 10

| වෛද්‍ය ආධාර වැඩසටහන | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | අයදුම්කරුගේ | | රණවිරුවාගේ | |
| | නම | සංසදය/ ප්‍රා.ලේ | නම | සේවය/ සේවා අංකය |
| 01 | ඩබ්.එම්.නිලන්ති කුමාරි මිය | අඹගමුව | ආර් එම් සිරිවර්ධන මයා | යුද සෙ/508593 |
| 02 | එච් ජී ජයවර්ධන මයා | අඹගමුව | එච් ජී ජයවර්ධන මයා | යුද/4158810 |
| 03 | ඩබ් ජී එස් ජයසූරිය මයා | මැදදුම්බර | ඩබ් ජී එස් ජයසූරිය මයා | යුද සෙ/ 174908 |
| 04 | ඩී එම් නිමල් කුමාරතංග මයා | තලාව | ඩී එම් නිමල් කුමාරතංග මයා | යුද සෙ/ 236678 |
| 05 | ප්‍රේමා කුමාරි ඇහැලේපොල මිය | මාතලේ | තිස්ස මානිංගමුව මයා | යුද සෙ/ 30986 |
| 06 | එච් ජී සිසිර කුමාර මයා | කුරුවිට | එච් ජී සිසිර කුමාර මයා | යුද සෙ/ 300693 |
| 07 | ඩී එම් කේ බී දිසානායක මයා | මීගහකිවුල | ඩී එම් කේ බී දිසානායක මයා | යුද සෙ/ 33439 |
| 08 | එස් එම් අයි ජී ජී රත්නායක මයා | යටිනුවර | එස් එම් අයි ජී ජී රත්නායක මයා | යුද සෙ/ 30286 |
| 09 | ආර් ජී සොපි නෝනා මිය | හොරණ | ආර් ජී සුනිල් මයා | යුද සෙ/ 100482 |
| 10 | බී එච් පී විමලරත්න මයා | ගල්ගමුව | බී එච් පී විමලරත්න මයා | යුද සෙ/ 66331 |
| 11 | පර්සි වීරසිංහ මයා | හොරම්භාව | පර්සි වීරසිංහ මයා | යුද සෙ/ 05501 |
| 12 | ආර් ජී යු ආර් එස් රාජමන්ත්‍රී මයා | පාතදුම්බර | ආර් ජී යු ආර් එස් රාජමන්ත්‍රී මයා | යුද සෙ/ 501142 |
| 13 | කේ එම් එම් බී කුලතුංග මයා | නැගෙනහිර නුවර පළාත | කේ එම් එම් බී කුලතුංග මයා | ගුවන් 7616 |
| 14 | කේ ජී ධර්මපාල මයා | කැස්බෑව | කේ ජී ධර්මපාල මයා | නාවික EC 7673 |
| 15 | එච් එම් කුසුමලතා මිය | අලව්ව | පී එල් වසන්ත කුමාර මයා | යුද සෙ/ 108253 |
| 16 | එම් පී ඩී නිමල් සුරවීර මයා | කුලියාපිටිය බටහිර | එම් පී ඩී නිමල් සුරවීර මයා | යුද සෙ/ 225426 |
| 17 | බී එම් ආර් කේ බස්නායක මයා | තලාව | බී එම් ආර් කේ බස්නායක මයා | නාවික XS/ 11452 |
| 18 | ආර් පී රත්නායක මයා | මාවනැල්ල | ආර් පී රත්නායක මයා | යුද සෙ/ 14192 |

<u>විශේෂ කරුණු</u>

01. මෙම වැඩසටහන සඳහා ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වු බැවින් වර්ෂය මුල දී වෙන්කර තිබූ මුදල් ප්‍රමාණවත් නොවුනු අතර, මෙම වසරේ ක්‍රියාත්මක නොවූ බාහිර සමාජය රණවිරුවා වෙනුවෙන් සංවේදී කිරීමේ වැඩසටහන සඳහා වෙන්කර තිබූ රු.300,000/- මුදල කළමණාකරන මණ්ඩල අනුමැතිය ඇතිව වෛද්‍ය ආධාර වැඩසටහන සඳහා වෙන් කර ගන්නා ලදී.

02. එම් පී ඩී නිමල් සුරවීර මහතාගේ ශල්‍යකර්මය සඳහා විශාල මුදලක් වැය වු බැවින් කළමණාකරන මණ්ඩලයේ විශේෂ අවසරයක් ලබා ගෙන රු.100,000/- මුදලක් වෛද්‍ය ආධාර වශයෙන් ලබා දෙන ලදී.

03. ප්‍රතිකාර සඳහා මුලා ඇස්තමේන්තුවක් නිශ්චිත ව ඉදිරිපත් කිරීමට අපහසු වූ අවස්ථාවලදී සහ මාසික ප්‍රතිකාර ලබාගැනීම් සඳහා ලබා දිය හැකි ආධාර පිළිබඳව තීරණය කිරීම විශේෂ කමිටුවක් මගින් සිදු කිරීමට කළමණාකරන මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

## 06. වෛද්‍ය ණය ලබාදීම

- 2011 වසරේ ඉලක්ක ගත ණය සංඛ්‍යාව - 20
- 2011 වසරේ ලබා දී ඇති ණය සංඛ්‍යාව - 05
- 2011 වසර සඳහා නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව - 20
  - 2011 වසර සඳහා ලැබී ඇති ඉල්ලීම් ලිපි ප්‍රමාණය
  - ලිඛිත ඉල්ලීම් - 08
  - දුරකථනයෙන් ලැබුනු ඉල්ලීම් (දළ වශයෙන්) - 07
  - ව්‍යාපෘතිය කරා පැමිණ කළ සෘජු ඉල්ලීම් - 05

| වෛද්‍ය සහන ණය වැඩසටහන | | | |
|---|---|---|---|
| අනු අංකය | අයදුම්කරු | සේවය/සංසදය | සේවා අංකය |
| 01 | පී.පී තිලකරත්න මයා | නාවික | 55129 |
| 02 | එච්.ඒ.පී.පී.කේ හේවාවසම් මයා | යුධ | O/61458 |
| 03 | ජේ.ඒ.ක්‍රිස්ටෝපර් මයා | පොලිස් | උප පොලිස් පරීක්ෂක |
| 04 | ටී.ඩබ්.තුසිත මයා | යුධ | 468627 |
| 05 | එච්.ජී.ධර්මසේන මයා | යුධ | 2 G 00579 |

වෛද්‍ය ණය වැඩසටහන සඳහා පසුගිය වසරවල දී ඉල්ලුම් කළ අයගේ බහුතරයක් සේවයේ යෙදී සිටින රණවිරුවන් ය. 2011 වසර සඳහා යුද හමුදා සුභ සාධක මගින් සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයින් වෙනුවෙන් විශේෂ වෛද්‍ය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කළ හෙයින් අනෙක් වසරවල ට සාපේක්ෂ ව මෙම වසරේ වෛද්‍ය ණය සඳහා අප වෙත ඉල්ලුම් ප්‍රමාණය අඩු වී ඇත.

<u>ඇතැම් අයදුම්කරුවන් අතරමග දී ණය ලබා නොගැනීම කෙරෙහි බලපාන හේතු</u>

01. වෛද්‍ය සහන ණය අයදුම්කරන බොහෝ දෙනෙකු හට ඉදිරියට ඇති සේවා කාලය අවම වීම නිසා ණය නිකුත් කිරීමේ දී එය අවහිරයක් වීම.

02. අයැදුම්කරුවන්ට සැත්කම් සඳහා ප්‍රමාණවත් මුදල් ආධාර ලැබීම නිසා ණය ලබා ගැනීමේ අවශ්‍යතාව අවමවීම.

03. සැත්කම සිදු කිරීමට ප්‍රථම ණය මුදල් ලබා ගැනීමේ අපහසුව

04. හදිසියේ සැත්කම් සිදු කළ අවස්ථාවන් හී දි ණය මුදල් ලබා ගැනීමට නො හැකිවීම නිසා අයදුම්කරුවන් විසින් ණය ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම.

## 07. රණවිරු දූ දරු කුසලතා වැඩසටහන

මෙය ආබාධිත, මියගිය, හා අතුරුදහන් හා සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ දූ දරුවන්ගේ හා සහෝදර සහෝදරියන්ගේ කුසලතා ඇගයීමේ වැඩසටහනයි.

2009 වර්ෂයේ ආරම්භයේ සිට 2010 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වැඩසටහන සඳහා අයදුම්පත් ගෙන්වා ගත් අතර, එම අයදුම්පත් අතරින් විවිධ මට්ටම් අනුව ජයග්‍රාහකයින් තෝරා වර්ග කරන ලදී. ප්‍රධාන උත්සවය 2011/04/07 වන දින කොළඹ 07 පිහිටි ජෝන් ද සිල්වා සමරු රඟහලේ දී පවත්වන්නට යෙදුනි.

මේ සඳහා අධ්‍යාපන, ක්‍රීඩා, සෞන්දර්ය, භාෂා හා විෂය බාහිර කටයුතුවලින් කැපී පෙනෙන ජයග්‍රහණ ලබා ගත් දූ දරුවන් 310 ක් අයත් විය.

ජයග්‍රාහකයන්ට පදක්කමක්,සහතිකයක්,රු.500/- බැගින් වූ මුදල් ත්‍යාග පිරිනමන ලදී. අතිවිශිෂ්ට දක්ෂතා දැක් වූ දරුවන් 20ක් වෙනුවෙන් ෆැන් ඒෂියා බැංකුවේ අනුග්‍රාහයෙන් රු.500/- ක් වටිනා ඉතිරි කිරීමේ ගිණුමක් විශේෂ ත්‍යාගයක් ලෙස ලබා දීමට කටයුතු කරන ලදී.

2010 දූ දරු කුසලතා ඇගයීමේ වැඩසටහන සඳහා තෝරා ගත් ජයග්‍රාහකයින් පළාත් මට්ටමින් වර්ග කළ විට මෙසේය.

| අනු අංකය | පළාත | ජයග්‍රාහකයින් ගණන |
|---|---|---|
| 01 | බස්නාහිර | 114 |
| 02 | මධ්‍යම | 51 |
| 03 | දකුණ | 45 |
| 04 | උතුරු මැද | 17 |
| 05 | සබරගමුව | 18 |
| 06 | වයඹ | 49 |
| 07 | ඌව | 10 |
| 08 | නැගෙනහිර | 06 |
| **එකතුව** | | **310** |






| අනු අංකය | ජයග්‍රාහී මට්ටම | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | **අතිවිශිෂ්ට දක්ෂතා** | 20 |
| 02 | **විශිෂ්ට දක්ෂතා** | 73 |
| 03 | **පළාත් මට්ටමේ** | 29 |
| 04 | **කලාප මට්ටමේ දක්ෂතා** | 28 |
| 05 | **කොට්ඨාශ මට්ටමේ දක්සතා** | 11 |
| 06 | **පාසැල් මට්ටමේ දක්ෂතා** | 149 |
| | **එකතුව** | **310** |

## 08.කේවල උපදේශන කටයුතු (මනෝ උපදේශන සහාය)

වසර පුරා වරින් වර මනෝ සමාජීය අංශය වෙත යොමු කරන ලදුව, තමන්ගේ හා තම පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා පවුල් ගැටළු සම්බන්ධයෙන් උපදේශන සේවා සහාය අවශ්‍ය වූ රණවිරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා කේවල උපදේශන සහයෝගය ලබා දී ඇත.

තාවකාලික ව රැදී සිටින ප්‍රධාන කාර්යාලයේ සුදුසු ස්ථානයක් නොමැති බැවින් කේවල උපදේශන කටයුතු සිදු කළ යුතු පුද්ගලයින් සමීපතම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිටින සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපදේශන කටයුතු සිදු කළ යුතු පුද්ගලයින් සමීපත ම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිටින සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපදේශන නිළධාරියා වෙත යොමු කිරීමට සිදුවිය.

## ආයතනයේ වෙනත් ව්‍යාපෘතීන් හා සම්බන්ධ ව නිරත වූ කටයුතු

01. 2011/01/05,06 දිනයන් හී දී දැයට කිරුල වැඩසටහනට සමගාමී ව මොනරාගල දිස්ත්‍රික්කයේ විවෘත කිරීමට නියමිත ව ගොඩනගිමින් තිබූ නිවාස සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීම.

02. 2011/01/07 වන දින මොනරාගල දිස්ත්‍රික් වැල්වාය සංසද රැස්වීම සඳහා රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් සහභාගී වීම.

03. රණවිරු දිනය මුලික සංවිධාන කටයුතු සඳහා සහය ලබා දීම හා රණවිරු දිනය සඳහා සහභාගී වීම.

04. ආබාධිත රණවිරු සුභ සාධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කළ ත්‍රී රෝද රථ බෙදාදීමේ උළෙලෙහි සංවිධාන කටයුතු සඳහා සහය ලබා දීම හා එම උත්සවය සඳහා සහභාගී වීම.

05. උත්තම පූජා ප්‍රණාම පදක්කම් උළෙලෙහි ලිපි යැවීමේ කටයුතු සඳහා ලබා දීම.

## බාහිර ආයතන සම්බන්ධීකරණයෙන් සිදු කළ කටයුතු

| ආයතනය | ස්ථානය හා දිනය | වැඩසටහන |
|---|---|---|
| පවුල් සංවිධාන සංගමය හා එක් ව සංවිධානය කළ වැඩසටහන් | 2011/09/13 - අනුරාධපුර නදර්න් කැම්ප් | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/09/14 මැදවච්චිය කාන්තා බලකාය | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/09/15 ඔඞ්ඩුසුඩාන් යුද හමුදා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/10/04 - මාන්කුලම් යුද හමුදා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/10/05 - කිලිනොච්චිය යුද හමුදා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/10/06- කන්කසන්තුරේ යුද හමුදා කාන්තා බලකා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/10/18 - දෙහිඅත්ත කණ්ඩිය යුද හමුදා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |
| | 2011/11/03 - ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුර | වෛද්‍ය සායනය හා උපදේශන වැඩසටහන |

පොදු දුෂ්කරතා

01. පොදුවේ ප්‍රධාන කාර්යාලයෙන් බැහැර වැඩමුළු සංවිධානය කිරීමේ දී ඇතැම් පළාත් නිළධාරීන්ගෙන් ප්‍රමාණවත් සහයක් නොලැබීම.

02. හදිසි විශේෂ වැඩසටහන් සංවිධානය කිරීමට සිදුවීම මත වැඩසටහන් පැවැත්වීමට ඇති කාලය ඒ වෙනුවෙන් වැයවීම.

03. කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් තරම් කාර්යාලයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා ගැටළු මතුවීම.

04. ව්‍යාපෘතියේ සිටින තිදෙනා ම කාන්තාවෝ වෙති. බාහිර වැඩමුළු සංවිධානයේ දී හා කටයුතු කිරීමේ දී තාක්ෂණික කටයුතු කිරීමේ දී තාක්ෂණික කටයුතු හා අනෙකුත් කටුයුතු සඳහා නිළධාරියෙකුගේ අවශ්‍යතා මතුවේ.

## II. ආබාධිත රණවිරු සුභසාධන ව්‍යාපෘතිය

### 01. ත්‍රී රෝද රථ ලබා දීම - 2011

| පළාත | යුධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | පොලීසිය | එකතුව |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 31 | 1 | 1 | | 33 |
| මධ්‍යම | 25 | 1 | | 4 | 30 |
| වයඹ | 34 | 1 | | | 35 |
| දකුණ | 25 | 1 | 2 | | 28 |
| සබරගමුව | 22 | | | 1 | 23 |
| ඌව | 18 | | 1 | | 19 |
| උතුරු මැද | 19 | | | | 19 |
| නැගෙනහිර | 5 | | | 3 | 8 |
| උතුර | 1 | | | | 1 |
| එකතුව | **180** | **4** | **4** | **8** | **196** |




<u>අරමුණු</u>

ආබාධිත තත්ත්වයට පත්වීම හේතුවෙන් රණවිරුවන් මුහුණදෙන ප්‍රවාහන දුෂ්කරතා මගහරවා ඔවුන්ගේ පවුල්වල ප්‍රවාහන කටයුතු පහසු කරවා නිදහස් කරගත් දේශයේ සංවර්ධනයට දායකවීමට අවකාශ සලසමින් ''රණවිරුවා'' සහ ඔහුගේ පවුලේ උදවිය මානසික වත් ආර්ථිකවත් ශක්තිවන්ත ව සමාජය තුළ සිටිනු දැකීම ය.

<u>ඉලක්කගත කණ්ඩායම</u>

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී ආබාධිත වීම හේතුවෙන් වෛද්‍ය නිර්දේශයන් මත විශ්‍රාම ගන්වා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසීයේ ආබාධිත වූ රණවිරුවන් සහ වෛද්‍ය හේතුන් මත නිවෙස් ගත කර ඇති ත්‍රිවිධ හමුදවේ සහ පොලිසියේ ආබාධිත රණවිරුවන්.

### <u>ප්‍රගතිය</u>

මෙම වසරේ අපේක්ෂිත ඉලක්කය සපුරා ඇත.



**<u>සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම් 2011</u>**

| | පළාත | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | මධ්‍යම | බස්නාහිර | දකුණ | වයඹ | උතුරු මැද | සබරගමුව | ඌව | නැගෙනහිර | එකතුව |
| ජනවාරි | 1 | 1 | | 4 | 1 | | 9 | 1 | 17 |
| පෙබරවාරි | 2 | 7 | 9 | 7 | 4 | 1 | 1 | 1 | 32 |
| මාර්තු | | | | | | | | | 0 |
| අප්‍රේල් | 1 | 1 | 1 | 6 | 2 | | 1 | 1 | 13 |
| මැයි | 12 | 3 | 17 | 16 | 14 | 4 | 9 | 4 | 79 |
| ජුනි | 6 | 6 | 2 | 2 | 3 | | 2 | | 21 |
| ජුලි | 13 | | | | 1 | 4 | | | 18 |
| අගෝස්තු | 3 | 3 | 10 | 2 | 5 | 2 | 3 | 2 | 30 |
| සැප්තැම්බර් | | | | | | | | | 0 |
| ඔක්තෝම්බර් | 23 | 14 | 2 | 20 | 6 | 2 | 1 | 1 | 69 |
| නොවැම්බර් | 5 | 1 | 5 | 2 | 1 | 3 | | 2 | 19 |
| දෙසැම්බර් | 10 | 1 | 5 | 3 | 1 | 2 | | 1 | 23 |
| එකතුව | 76 | 37 | 51 | 62 | 38 | 18 | 26 | 13 | 321 |



**අරමුණු**

විවිධ ආබාධයන් ට ලක් ව තම දෛනික කටයුතුවල දී අපහසුතාවයන්ට  මුහුණදෙන රණවිරුවන් එයින් මුදවා ගැනීමේ එක් පියවරක් ලෙස ආරක්ෂිත වැට සහිත ව නාන කාමරයක් සාදවා ගැනීමට මුදලින් ආධාර ලබා දීම.

රණවිරුවාගේ නිවස ට යාමේ ගමන් පහසුව සලසාදීමට අවශ්‍ය කටයුතු සඳහා කටයුතු කිරීම.

ඉලක්කගත කණ්ඩායම

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී වෛද්‍ය නිර්දේශයන් මත විශ්‍රාම ගන්වා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ආබාධිත වූ රණවිරුවන්.

සේවාව

උපරිමය රු.50000/- ක් දක්වා ආධාර මුදල් ලබාදෙන අතර, වාරික දෙකකින් ප්‍රතිලාභීයාගේ ගිණුමට බැර කරනු ලබයි.

**ප්‍රගතිය**

**මෙම වසරේ අපේක්ෂිත ඉලක්කය සපුරා ඇත.**

## ආබාධිත උපකරණ ලබා දීම - 2011

| උපකරණය | ප්‍රමාණය |
|---|---|
| කෘතිම පාද | 30 |
| අත්වාරු | 132 |
| රෝද පුටු | 28 |
| ශ්‍රවණාධාර | 1 |




රණවිරුවනගෙ ආබාධත තතතවයන හෙතුවෙන ඔවුන මුහුණපාන දුෂකරතා මගහරවා ලම පණස ඔවුනට අවශ්‍ය ආබාධික උපකරණ වන කෘතිම පාද/ රෝද පුටු / අත්වාරු/කිහිලිකරු/ වතුර මෙට්ට/ශ්‍රවණාධාර ආදිය දෙස් විදෙස් දානපතියන් සම්බන්ධීකරණයෙන් ලබා දෙනු ලබයි.

**ඉහත සඳහන් උපකරණ සියල්ල දායපතියන්ගෙන් ලද ආධාර මගින් ලබා දී ඇති අතර, එක් කෘතිම පාදයක් පමණක් අධිකාරිය වෙතින් ලබා දී ඇත.**

## <u>අබාධිත රණවිරු නේවාසික පුහුණු වැඩමුළු - 2011</u>

### <u>අරමුණු</u>

අබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සැලසීම, ආර්ථිකය වර්ධනය කර ගැනීම උදෙසා ස්වයං රැකියා ආදියෙහි නියැලීමට උද්යෝගිමත් කිරීම, චිත්ත ධෛර්යය සහ අධ්‍යාත්මික සුවය ලබා ගැනීම උදෙසා භාවනායෝගී ක්‍රම සඳහා මග පෙන්වීම, ඔවුන්ගේ විනෝදාශ්වාදය උදෙසා සංස්කෘතිමය අංගයන් ඉදිරිපත් කිරීම ආදී සේවාවන් යටතේ සිදු කරන අතර, දේශන පැවැත්වීම සඳහා අවශ්‍ය සම්පත්දායකයින් ගෙන්වා ගෙන පළාත් මට්ටමෙන් මෙම වැඩමුළු නේවාසික ව දින දෙකක් පවත්වනු ලබයි.

### ප්‍රගතිය

ඌව පළාතේ මොණරාගල දී වැඩසටහනක් සාර්ථක ව පවත්වන ලදී.



## 03. අධ්‍යාපන, නිපුණතා හා ආර්ථික සංවර්ධන අංශය

### I. නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

**<u>හැඳින්වීම -</u>**

අප දේශයේත්, ජනවාතගේත් ආරක්ෂාව වෙනුවෙන් දිවිපිදූ, අතුරුදහන්, ආබාධිත විශ්‍රාමික හා දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ පවුල්වල කුසලතා දක්ෂතා හා අධ්‍යාපන සුදුසුකම් අනුව විවිධ ක්ෂේත්‍රයන් හී ප්‍රායෝගික න්‍යායාත්මක දැනුම ලබා දී, හැකියාවන් වර්ධන කොට ඔවුන්ගේ ඉපයීමේ ශක්තිය නගා සිටුවීම.

<u>දැක්ම</u>

රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ හැකියාවන් හා සහජ කුසලතා අනුව ඔවුන්ගේ ඉපයීමේ හැකියාව වර්ධනය කිරීම.

**<u>මෙහෙවර</u>**

රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආත්ම විශ්වාසය වර්ධනය කරමින් ඔවුන්ගේ කුසලතා හඳුනා ගනිමින් ඊට ගැලපෙන කාර්මික, තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දීම සඳහා පාඨමාලා සහ ක්‍රියාකාරකම්වලට යොමු කිරීමත්, ඔවුන් ආදායම් උත්පාදනය ක්‍රියාවලියට යොමු කිරීමට මග පෙන්වා දී එ මගින් යහපත් ජීවන පසුබිමක් ඇති කිරීම.

අරමුණු

- රණවිරු පවුල්වල සාමාජිකයින් තුළ ආකල්පමය වෙනසක් ඇති කර ඒ මගින්, ඔවුන් ආත්ම විශ්වාසයෙන් කුසලතාවයෙන් යුතු පිරිසක් බවට පත් කිරීම.
- රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සහජ කුසලතා හා දක්ෂතා පදනම් ව පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් කාර්මික හා තාක්ෂණික දැනුම, පුහුණුව සඳහා මග පෙන්වීම හා අවස්ථා සලසා දීම.
- රැකියාවලට යොමු කිරීම, ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීම.
- රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම හා ඉතිරි කිරීම් වර්ධනය කිරීම.

## නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

- පරිගණක මධ්‍යස්ථාන සංවර්ධනය
- අධ්‍යාපන වෘත්තීය පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබා දීම්.
- ගම්මාන උපදේශක දීමනා ලබා දීම
- භාෂා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම
- ස්වයං රැකියා ආධාර ලබා දීම්
- පළාත්බද ස්වයං රැකියා වැඩමුළු පැවැත්වීම
- ස්වයං රැකියා ණය ලබා දීම්
- කුසලතා ප්‍රවර්ධන ණය ලබා දීම්
- නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ අවශ්‍යතා සඳහා විවිධ ආයතන සමග සම්බන්ධ වීම.
- **නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබූ විශේෂ ව්‍යාපෘති**

- නව පරිගණක මධ්‍යස්ථාන හා පවතින පරිගණක මධ්‍යස්ථාන සංවර්ධන කිරීම.

රණවිරු දූ දරුවන්ගේ හා ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ පරිගණක දැනුම වර්ධනය කොට ඔවුන් නවීන ලෝකය විවිධ තාක්ෂණික හැකියාවන් සමග මුසු කිරීම නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ තවත් උදාර කර්තව්‍යයකි. 2011 වසර අවසාන වන විට පරිගණක මධ්‍යස්ථාන 50ක් ලංකාව පුරා ඉතා සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලැබේ.

පරිගණක මධ්‍යස්ථානවල පරිගණක නඩත්තු කටයුතු බොහොමයක් ව්‍යාපෘතියේ දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් අමතර පිරිවැයකින් තොර ව සිදු කිරීමට හැකි විය. පරිගණක මධ්‍යස්ථානවල ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාකර බැලීමේ කටයුතු මේ වසරේත් සිදු කෙරෙනු අතර, ඒවායේ ප්‍රගතිය හා අඩුපාඩු අධිකාරියේ සභාපතිතුමිය,ව්‍යාපෘති කළමනාකරු ට හා අදාළ පළාත් නිළධාරීන් ට ලිඛිත ව දැනුම් දෙන ලදී. එසේම පරිගණක මධ්‍යස්ථානවල උපදේශක දීමනා ගෙවීම් නියමිත පැය ගණන් සම්පූර්ණ කරමින් අධ්‍යාපන කටයුතු සිදු කරනු ලැබූ උපදේශකවරුන් හට පමණක් ගෙවන ලදී.
පරිගණක පාඨමාලා නිම කළ සිසුන් සඳහා පරිගණක මධ්‍යස්ථානවල විභාග කටයුතු සිදු කෙරෙණු අතර සාර්ථක ව පාඨමාලාව නිමකළ සිසුන් 200 කට ආසන්න සංඛ්‍යාවකට 2011 වසරේ දී සහතික පත්‍ර ලබා දීම සිදු කරන ලදී.
විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ වසරේ දී ද පරිගණක මධ්‍යස්ථානවල යටිතල පහසුකම් දියුණු කර ගැනීමට තම අනුග්‍රහය දැක්විය.

පරිගණක උපදේශක පුහුණු වැඩමුළු පැවැත්වීම

මොරටුව විශ්ව විද්‍යාලය සමග එක්ව රණවිරු සේවා අධිකාරියේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් ලංකාව පුරා පවත්වා ගෙන යනු ලබන පරිගණක මධ්‍යස්ථානවල සිටින පරිගණක උපදේශක උපදේශකවරු පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011 වර්ෂයේ දෙසැම්බර් මස 3,4 යන දෙදින තුළ මොරටුව විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලදී.
මේ සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමාගේ හා තොරතුරු තාක්ෂණ පීඨයේ පීඨාධිපතිතුමන් ඇතුළු ආචාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය ලැබුණි.

පළාත් අනුව පරිගණක මධ්‍යස්ථාන වර්ගීකරණය

| බස්නාහිර පළාත | සබරගමුව |
|---|---|
| **1.** අගලවත්ත | 1. මැවනැල්ල |
| **2.** නුගේදොලවත්ත | 2. නිවිතිගල |
| **3.** උඩුපිල දෙල්ගොඩ | 3. බලන්ගොඩ |
| **4.** කැරගල | 4. කෑගල්ල |
| **5.** වතුපිටිවල | 5. අඹිලිපිටිය |
| **6.** කොස්ගම | 6. රඹුක්කන |
| **7.** දොඩම්ගොඩ | |
| **8.** දොඹගොඩ | |
| **9.** දොම්පේ | |
| **10.** ගම්පහ | |
| **11.** වල්බෝතලේගම | |
| **මධ්‍යම** | ඌව |
| **1.** බලගොල්ල | 1. මඩුල්ල |
| **2.** වලපනේ | 2. පෙරහෙට්ටිය |
| **3.** හගුරන්කෙත | 3. මහියංගනය |
| **4.** ගඟ ඉහළ කෝරලය | 4. වැල්ලවාය |
| **5.** උකුවෙල | 5. පස්සර |
| **6.** ගලේවෙල | 6. මැදගම |
| | 7. කතරගම |
| **වයඹ** | දකුණ |
| **1.** ඉබ්බාගමුව | 1. මාලපගම |
| **2.** නිකවැරටිය | 2. ලුණුගම්වෙහෙර |
| **3.** ආණමඩුව | 3. වැලිගම |
| **4.** මල්ලවපිටිය | 4. ලුණම |
| **5.** පොල්පිතිගම | 5. නෙළුව |
| **6.** නාරම්මල | |
| **උතුරු මැද** | නැගෙනහිර |
| **1.** රඹෑව | 1. කන්තලේ |
| **2.** කැකිරාව | 2. ගෝමරණ්කඩවල |
| **3.** ගල්නෑව | 3. නවගම්පුර |
| **4.** මැදවච්චිය | 4. දෙහිඅත්තකණ්ඩිය |

පරිගණක මධ්‍යස්ථාන පවතින ප්‍රදේශ

















පරිගණක පුහුණු වැඩමුළුව - මොරටුව විශ්ව විද්‍යාලය















- ඉංග්‍රීසි පුහුණු වැඩමුළු පැවැත්වීම

රණවිරු සේවා අධිකාරියේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් රණවිරු සංසද ගම්මාන සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමේ අරමුණු ඇති ව සසංද හා ගම්මාන මගින් තෝරා ගත් ඉංග්‍රීසි උපදේශකවරු පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011 දෙසැම්බර් මස 12හා 13 යන දෙදිනයන් හීදි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.

මේ සඳහා ඉංග්‍රීසි උපදේශකවරු 13 දෙනෙකු සහභාගී විය.











## අධ්‍යාපන වෘත්තීය පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබා දීම.

### අධ්‍යාපන ආධාර ලබා දීම්

රණවිරු පවුල්වල දුදරුවන්ගේ කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනික හා වෘත්තීය නිපුණතාවයන් වැඩි දියුණු කොට ඔවුන් ට ඉදිරි අනාගතයේ දී සාර්ථක වෘත්තියක් කරා යොමු කරවීම මෙහි අරමුණයි.

මේ යටතේ දී ලංකාවේ පිළිගත් ආයතන මගින් සිදුකරනු ලබන ඕනෑ ම පාඨමාලාවක් හැදෑරීම සඳහා එම පාඨමාලා ගාස්තුවෙන් (මුදල රු.20,000ක උපරිමයකට යටත් ව) අඩක් අප අධිකාරිය මගින් ගෙවීම සිදු කරනු ලබයි.

### අධ්‍යාපන වෘත්තීය නිපුණතා සඳහා ආධාර ලබාදීම දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 2 |
| ගම්පහ | 2 |
| පුත්තලම | 1 |
| කුරුණෑගල | 5 |
| ගාල්ල | 2 |
| හම්බන්තොට | 1 |
| රත්නපුරය | 5 |
| අනුරාධපුරය | 1 |
| බදුල්ල | 3 |
| මාතලේ | 3 |
| **එකතුව** | **25** |



## ගම්මාන උපදේශක දීමනා ලබා දීම

ගම්මානයෙහි දූ දරුවන්ගේ ශිල්පීය ඥානය නිපුණතාව සහ විවිධ අංශයන් සඳහා ප්‍රවීනත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය මුල්‍ය දායකත්වය උපදේශනය සහ ඒ සඳහා යොමු කිරීමට මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

උපදේශක දීමනා වශයෙන් මාසික ව රු.4000 ක මුදලක් දිරිදීම වශයෙන් ලබා දේ. නෘත්‍ය, සංගීත, පරිගණක, පෙර පාසැල්, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය වැනි පාඨමාලා මේ සඳහා යොදා ගැනේ.

<u>පහත සඳහන් ගම්මානවල ඉහත සඳහන් කල මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබයි.</u>

බස්නාහිර

1. වතුපිටිවල
2. කෑරගල

03. කොස්ගම
04. උඩුපිල

මධ්‍යම

1. බලගොල්ල

උතුරු මැද

1. රඹෑව
2. කැකිරාව
3. ගල්නෑව

ඌව

1.පෙරහෙට්ටිය
2. වැලිමඩ

වයඹ

1. ඉබ්බාගමුව

නැගෙනහිර

1. කන්තලේ
2. නවගම්පුර

දකුණ

1. මාපලගම

## ස්වයං රැකියා ආධාර ලබා දීම - 2011

දිවිපිදූ අතුරුදන් ආබාධිත විශ්‍රාමික රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන් ට හා සේවයේ යෙදී සිටිය දී ක්‍රියාන්විත නොවන හේතූන් මත මිය යන සහ ආබාධිත වන රණවිරු පවුල්වල සාමාජික සාමාජිකයන් ට ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩි දියුණු කර ගැනීම සඳහා ආධාර ලබා දීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව විශේෂ ආර්ථික අපහසුතාවයෙන් යුත් රණවිරු පවුල් ප්‍රමුඛතා පදනම මත අදාළ පළාත් නිළධාරී මාර්ගයෙන් තෝරා ගෙන ඔවුන් සඳහා රු.30,000ක උපරිමයකට යටත් ව ආධාර මුදල් ලබා දීම මේ යටතේ සිදු කෙරේ. 2011 වසරේ ස්වයං රැකියා ලබා දීමේ ඉලක්කය වූයේ 40 කි. 2011 වසර අවසාන වන විට දී ප්‍රතිලාභීන් 40 දෙනෙකුට මෙම ආධාර ලබා දීමට හැකි විය.

### ස්වයං රැකියා ආධාර ලබා දීමේ ප්‍රගතිය පළාත් අනුව

| පළාත | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| උතුරු මැද | 5 |
| දකුණ | 4 |
| මධ්‍යම | 5 |
| බස්නාහිර | 9 |
| සබරගමුව | 8 |
| නැගෙනහිර | 3 |
| වයඹ | 4 |
| ඌව | 2 |
| එකතුව | 40 |



**<u>ස්වයං රැකියා ආධාර ලබා දීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව</u>**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 3 |
| ගම්පහ | 4 |
| කළුතර | 2 |
| රත්නපුරය | 4 |
| කෑගල්ල | 4 |
| මහනුවර | 4 |
| මාතලේ | 1 |
| අනුරාධපුරය | 5 |
| කුරුණෑගල | 4 |
| ගාල්ල | 2 |
| මාතර | 2 |
| අම්පාර | 3 |
| බදුල්ල | 2 |
| එකතුව | 40 |



**ස්වයං රැකියා ආධාර ලබා දීමේ ප්‍රගතිය කර්මාන්ත අනුව**

| කර්මාන්ත | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ඇදුම් මැසීම | 9 |
| සත්ව පාලනය | 4 |
| මනාලියන් හැඩගැන්වීම | 1 |
| ගඩොල් කැපීම | 2 |
| අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 3 |
| සිල්ලර වෙළදාම | 6 |
| පලතුරු  වෙළදාම | 2 |
| බිම්මල් වගාව | 2 |
| ඇදුම්  වෙළදාම | 1 |
| බ්‍රවුන්පේපර් බෑග් ඇලවීම | 1 |
| පහන් තිර ඇඹරීම | 1 |
| පාපිසි මැසීම | 1 |
| මල් වගාව | 1 |
| රටඉදි පැකට් කිරීම | 1 |
| සෙල්ලම් බඩු  වෙළදාම | 1 |
| රස කැවිලි  වෙළදාම | 1 |
| ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 1 |
| හුණු පැකට් කිරීම | 1 |
| කරවල පැකට් කිරීම | 1 |
| **එකතුව** | **40** |

**ස්වයං රැකියා ආධාර ලබා දීමේ ප්‍රගතිය සේවාව අනුව**

| සේවාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| යුධ | 26 |
| ගුවන් | 2 |
| නාවික | 2 |
| පොලිස් | 10 |
| **එකතුව** | **40** |




වර්ෂය අනුව ස්වයං රැකියා ආධාර ලබා දීම්




| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 2006 | 70 |
| 2007 | 60 |
| 2008 | 50 |
| 2009 | 50 |
| 2010 | 40 |
| 2011 | 40 |
| එකතුව | 310 |

## 4. ස්වයං රැකියා වැඩමුළු පැවැත්වීම

ලංකාවේ විවිධ ප්‍රදේශවලට ආවේණික විවිධ වූ ස්වයං රැකියාවන් පිළිබඳ ව හඳුනා ගෙන ඒවා ස්වයං රැකියාවන් පිළිබඳ ව හඳුනා ගෙන ඒවා ස්වයං රැකියාවන් ලෙස ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන රණවිරු පවුල්වලට අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම ලබා දීම මේ යටතේ දී සිදු කරනු ලබයි.

ඒ අනුව 2011 වර්ෂය තුළ දී පළාත් ආශ්‍රිත ව ස්වයං රැකියා වැඩමුළු හතරක් (04) පවත්වන ලදී.

- වයඹ පළාත
  බතික් කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩමුළුවක් ද
- මධ්‍යම පළාත
  පාසැල් ගම්, වැසිකිළි පවිත්‍රකාරක දියර , අත්සෝදන සබන් නිෂ්පාදන හා ව්‍යවසායකත්වය පිළිබඳ වැඩමුළුවක් ද
- සබරගමු පළාත
  රස කැවිලි නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුවක් ද
- බස්නාහිර පළාත
  සම්භාණ්ඩ නිෂ්පාදන පිළිබඳ වැඩමුළුවක් ද වශයෙන්
  වැඩමුළු 04 ක් පවත්වන ලදී.

## 05. ස්වයං රැකියා ණය ලබා දීම

දිවිපිදූ, අතුරුදහන්, ආබාධිත විශ්‍රාමික රණවිරු පවුල්වල සාමාජිකයින්ට ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩි දියුණු කර ගැනීම සඳහා පහසුකම් ලබා දීම මේ යටතේ සිදු කෙරේ. එහි දී ස්වයං රැකියා ණය ප්‍රතිලාභියෙකුට හිමිවන ණය මුදල රු.100,000/= ක් වන අතර, සියයට 5 ක සේවා ගාස්තුවක් මේ සඳහා අය කෙරේ.

2011 ස්වයං රැකියා ණය ලබා දීමේ ඉලක්කය 25 ක් වූ අතර 2011 වසර අවසන්වන විට දී ප්‍රතිලාභීන් 19 දෙනෙකු සඳහා ස්වයං රැකියා ණය ලබා දීමට හැකි විය.

### ස්වයං රැකියා ණය ලබා දීමේ ප්‍රගතිය පළාත් අනුව

| පළාත | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| දකුණ | 4 |
| මධ්‍යම | 2 |
| බස්නාහිර | 6 |
| වයඹ | 5 |
| ඌව | 2 |
| උතුරු මැද | 0 |
| සබරගමුව | 0 |
| නැගෙනහිර | 0 |
| එකතුව | 19 |




**<u>ස්වයං රැකියා ණය ලබා දීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව</u>**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කළුතර | 6 |
| නුවර | 2 |
| කුරුණෑගල | 4 |
| බදුල්ල | 2 |
| ගාල්ල | 3 |
| මාතර | 1 |
| පුත්තලම | 1 |
| **එකතුව** | **19** |

## ස්වයං රැකියා ණය ලබා දීමේ ප්‍රගතිය කර්මාන්ත අනුව

| කර්මාන්ත | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| සිල්ලර වෙළදාම | 04 |
| ඇදුම් මැසීම | 07 |
| ගෙවතු වගාව | 03 |
| වඩු කර්මාන්තය | 01 |
| බුලත් වගාව | 01 |
| සෙල්ලම් බඩු වෙළදාම | 01 |
| ඇන්තුරියම් වගාව | 01 |
| බෑග් මැසීම | 01 |
| එකතුව | **19** |

## ස්වයං රැකියා ණය ලබා දීමේ ප්‍රගතිය සේවාව අනුව

| සේවාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| යුධ | 17 |
| ගුවන් | 02 |
| පොලිස් | 00 |
| නාවික | 00 |
| එකතුව | **19** |




<u>කුසලතා ප්‍රවර්ධන ණය ලබා දීම</u>

තම දේශය වෙනුවෙන් තම ජීවිතය පුජා කල හා දැනට සේවයේ යෙදී සිටිමින් තම මෙහෙවර නිබඳ ව රට වෙනුවෙන් ලබා දෙන රණවිරුවන්ගේ පවුල්වල ළගම ඥාතීන් (දුව/පුතා/බිරිඳ) හට ද රණවිරුවා අවිවාහකයකු නම් දෙමාපියන්ට හා අවිවාහක සහෝදර සහෝදරියන් ට ද ඔවුන්ගේ දස්කම් අනුව රටට කීර්තියක් ගෙන දීමේ අරමුණ ඇති ව ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා සහභාගී වීමටත් " කුසලතා ප්‍රවර්ධන ණය වැඩසටහන" යටතේ 2011 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 13 දෙනෙකු වෙත කුසලතා ප්‍රවර්ධන ණය ලබා දීම සිදු කර ඇත.

**<u>2011 වර්ෂයේ දී ලබා දෙන ලද කුසලතා ප්‍රවර්ධන ණය ලබා දීම</u>**

1. කාම්බෝජයේ පැවති 2011 ආබාධිතවූවන්ගේ ලෝක ශුරතා වොලිබෝල් තරගාවලිය සඳහා සහභාගී වීම සඳහා ද
2. චීනයේ බීජිං නුවර පැවති ආබාධිත අයවලුන්ගේ වාඩි වී සිට ක්‍රීඩා කිරීමේ ප්‍රථම වොලිබෝල් තරගාවලියට සහභාගී වීම සඳහා අවශ්‍ය ගුවන් ටිකට්පත් මිළ දී ගැනීම සඳහා ද
3. ඉන්දියාවේ පැවති කරාටේ තරගයකට සහභාගීවීම සඳහා ද
4. ඉන්දියාවේ පැවති කරාටේ තරගයකට සහභාගීවීම සඳහා ද ණය ලබා දී ඇත.
5. ප්‍රතිලාභීන් 08 දෙනෙකු සඳහා පරිගණක මිළ දී ගැනීම වෙනුවෙන් රු.50,000.00 ක් බැගින් ණය මුදල් ලබා දෙන ලදී.

<u>නිපුණතා සංවර්ධන වයාපෘතිය මගින් රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ අවශ්‍යතා සඳහා විවිධ ආයතන සමග සම්බන්ධ වීම.</u>

මේ යටතේ නිපුණතා සංවර්ධන වයාපෘතිය මගින් රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන් විවධ අවශ්‍යතා වශයෙන් හඳුනා ගෙන ඇති රැකියා අවස්ථා, රැකියා ස්ථිර කර ගැනීම්,විවිධ අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා හැදෑරීම, කලා කුසලතාවයන් වැඩි දියුණු කර ගැනීම, වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම ආදිය සඳහා විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග රණවිරු පවුල්වල සාමාජිකයන් සම්බන්ධ කරවීමට අවශ්‍ය කටයුතු සලස්වන ලදී.

ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා 2011 වසරේ දී විවිධ ආයතන සඳහා සම්බන්ද වී විවිධ උපකාරයන් ලබා ගත් අයවලුන් පහත දැක්වේ.

| දිස්ත්‍රික්ක | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 10 |
| ගම්පහ | 05 |
| කළුතර | 15 |
| මහනුවර | 07 |
| නුවරඑළිය | 05 |
| කුරුණෑගල | 08 |
| බදුල්ල | 05 |
| මොනරාගල | 05 |
| කෑගල්ල | 04 |
| අනුරාධපුරය | 05 |
| පොළොන්නරුව | 04 |
| අම්පාර | 05 |
| ත්‍රිකුණාමලය | 04 |
| රත්නපුරය | 04 |
| ගාල්ල | 05 |
| මාතර | 03 |
| හම්බන්තොට | 03 |
| එකතුව | **97** |

## නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබූ විශේෂ ව්‍යාපෘති

දැයට කිරුළ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි සැලක් ඉදිරිපත් කිරීම.

2011 වර්ෂයේ දී බුත්තල ප්‍රදේශයේ පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා නිපුණතා හා ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියා ප්‍රතිලාභීන්ගේ නිර්මාණ ඇතුළත් අලෙවිසැලක් පවත්වනු ලැබූ අතර, එහි දී ස්වයං රැකියා ප්‍රතිලාභීන්ගේ නිර්මාණ ඇතුළත් අලෙවිසැලක් පවත්වනු ලැබූ අතර, එහි දී ස්වයං රැකියා සිදු කරන ලද ප්‍රතිලාභීන් 15 දෙනෙකුගේ නිර්මාණ දැයට කිරුළ ප්රදර්ශනය කිරීම හා අලෙවි කිරීම සිදු කරන ලදී.












## වාර්ෂික ප්‍රගතිය සාරාංශගතව

| පළාත් | ස්වයං රැකියා ආධාර | ස්වයං රැකියා ණය | අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා ආධාර | කුසලතා ප්‍රවර්ධන ණය |
|---|---|---|---|---|
| බස්නාහිර | 9 | 6 | 4 | 1 |
| මධ්‍යම | 5 | 2 | 3 | |
| සබරගමුව | 8 | 0 | 5 | 2 |
| නැගෙනහිර | 3 | 0 | 0 | 0 |
| වයඹ | 4 | 5 | 6 | 0 |
| ඌව | 2 | 2 | 3 | 0 |
| දකුණ | 4 | 4 | 3 | 8 |
| උතුරු මැද | 5 | 0 | 1 | 2 |




## II. නිවාස ණය

**අරමුණ**

**රණවිරු පවුල් ආර්ථික වශයෙන් හා මානසික වශයෙන් නගා සිටුවීම සඳහා නිවාස ණය වැඩසටහන යටතේ සහන පදනමක් මත ණය ලබා දීම මෙහි අරමුණයි.**

<u>නිවාස ණය ලබා දීම</u>

- සංසද නිවාස ණය ලබා දීම
- ගම්මාන නිවාස ණය ලබා දීම
- සේවයේ නියුතු වූවන් සඳහා නිවාස ණය ලබා දීම

<u>නිවාස ණය වැඩසටහන - සංසද</u>

රණවිරු සංසදවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනගා ගැනීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතු ව රණවිරු සේවා අධිකාරිය විසින් නිවාස ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව පහත සඳහන් කාරණා සඳහා සංසද නිවාස ණය ලබා දීම සිදු කරනු ලබයි.
අ. නව නිවසක් ඉදි කර ගැනීමට
ආ. නිවස වැඩි දියුණු කර ගැනීමට
ඇ. අලුත්වැඩියා කර ගැනීමට

- සංසදවල සිටින පහත සදහන් රණවිරු සාමාජික සාමාජිකාවන් සදහා සංසද නිවාස ණය ලබා දවීම සිදු කරනු ලබයි.

  01. ක්‍රියාන්විතයේ දී ජීවිත පුද කළ රණවිරුවන්ගේ ළගම ඥාතීන්

  02. ක්‍රියාන්විතයේ දී අතුරුදන් රණවිරුවන්ගේ ළගම ඥාතීන්

  03. ක්‍රියාන්විතයේ දී ආබාධිත විශ්‍රාමික වූ රණවිරුවන්

<u>සංසද නිවාස ණය ලබා දීම 2011 - දිස්ත්‍රික්ක අනුව</u>

| දිස්ත්‍රික්ක | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුරය | 28 |
| කුරුණෑගල | 27 |
| මහනුවර | 11 |
| හම්බන්තොට | 1 |
| මොනරාගල | 28 |
| බදුල්ල | 7 |
| මාතලේ | 4 |
| ගාල්ල | 4 |
| කෑගල්ල | 11 |
| කොළඹ | 8 |
| අම්පාර | 5 |
| ගම්පහ | 6 |
| කළුතර | 7 |
| පොළොන්නරුව | 6 |
| රත්නපුරය | 23 |
| මාතර | 2 |
| පුත්තලම | 3 |
| එකතුව | 181 |




<u>සංසද නිවාස ණය ලබා දීම - සේවාව අනුව</u>

| සේවාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| යුධ | 167 |
| ගුවන් | 2 |
| නාවික | 7 |
| පොලිස් | 5 |
| එකතුව | **181** |



**<u>ගම්මාන නිවාස ණය ලබා දීම</u>**

රණවිරු ගම්මානවල පදිංචි ව සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනගා ගැනීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතු ව රණවිරු සේවා අධිකාරිය විසින් නිවාස ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව පහත සඳහන් කාරණා සඳහා ගම්මාන නිවාස ණය ලබා දීම සිදු කරනු ලබයි.

අ. නව නිවසක් ඉදි කර ගැනීමට

ආ. නිවස වැඩි දියුණු කර ගැනීමට

ඇ. අලුත්වැඩියා කර ගැනීමට

- ගම්මානවල සිටින පහත සඳහන් රණවිරු සාමාජික සාමාජිකාවන් සඳහා ගම්මාන නිවාස ණය ලබා දීම සිදු කරනු ලබයි.

01. ක්‍රියාන්විතයේ දී ජීවිත පූජා කළ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්
02. ක්‍රියාන්විතයේ දී අතුරුදන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන්
03. ක්‍රියාන්විතයේ දී ආබාධිත විශ්‍රාමික වූ රණවිරුවන්

2011 වර්ෂය තුළ දී පහත සඳහන් රණවිරු ගම්මාන සඳහා ගම්මාන නිවාස ණය ලබා දීම සිදු කර ඇත.

| ගම්මානයේ නම | ලබා දී ඇති ණය ප්‍රමාණය |
|---|---|
| පැළැඳගොඩ | 2 |
| පස්යාල | 3 |
| පෙරහෙට්ටිය | 1 |
| ලුණුගම්වෙහෙර | 1 |
| එකතුව | 7 |

## 2011 වර්ෂයේ ගම්මාන නිවාස ණය ලබා දීමේ ප්‍රගතිය




03. නිවාස ණය වැඩසටහන - සේවයේ නියුතු

**දැනට සේවයේ නියුතු ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ රණවිරුවන්ට තමන්ගේ නිවාස අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා නිවාස ණය වැඩසටහන යටතේ සහන පදනමක් මත ණය ලබා දීම මෙහි අරමුණයි.**

**සේවයේ නියුතු සන්නද්ධ සේවා හා පොලිස් අංශවල සාමාජිකයන් සඳහා වූ සහනදායී නිවාස ණය ක්‍රමය**

**යුද - 40% නාවික - 15% ගුවන් - 15% පොලිස් - 25% වශයෙන් නිකුත් කරනු ලැබේ.**

**සේවයේ නියුතුවූවන්ගේ ණය අයදුම්පත් ඒ ඒ සේවාවන්වල සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගත යුතුය.**

<u>ප්‍රතිලාභ ලබන පාර්ශව</u>

01.සන්නද්ධ සේවාවන් හී අවම වශයෙන් වසර 12 ක සේවා කාලයක් නිම කළ රණවිරුවන්
(ඉදිරියට සේවා කාලය වසර 05)

02. පොලිස් සේවාවේ අවුරුදු 20 ක අවම සේවා කාලයක් නිම කළ රණවිරුවන්
(ඉදිරියට සේවා කාලය වසර 05)

## නිවාස ණය වැඩසටහන - සේවයේ නියුතු

| සේවාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| --- | --- |
| යුධ | 16 |
| ගුවන් | 5 |
| නාවික | 5 |
| පොලිස් | 10 |
| **එකතුව** | **36** |



## III. අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

හැඳින්වීම

දේශයේත් ජනතාවගේත් ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාන්විත සේවයේ නියුතු ව සිය ජීවිතය පූජා කරන ලද, අතුරුදහන් වූ, ආබාධිත වූ විශ්‍රාමිකවූ හා දැනට ආබාධිත ව සේවයේ නියුතු රණවිරුවන්ගේ දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු උසස් අධ්‍යාපනය දක්වා සාර්ථක කර ගැනීමට ආධාර දීමක් වශයෙන් රණවිරු සේවා අධිකාරියේ අධ්‍යාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ .

මේ යටතේ ක්‍රියාත්මක කරන ලද ශිෂ්‍යත්ව ක්‍රම

1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය

- 2005 වසරේ සිට ආරම්භ කෙරෙනු මෙය ජාතික ඉකිරි කිරීමේ බැංකුව හා අනුබද්ධිත ව රණවිරුවන්ගේ 6 වසරේ සිට අපොස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. මෙම දූදරුවන් ගේ අපොස සා/පෙළ අධයාපන කටයුතු සහ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු.12,000/= ක ඉතුරුම් මුදලක් ලැබෙන සේ මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබයි.

හැඳින්වීම

රණවිරු සේවා අධිකාරියේ අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය යටතේ අපොස සාපෙළ හා උපෙළ අධ්‍යාපනය ලබන දරු දැරියන් සඳහා වන ශිෂ්‍යත්ව ආධාර ක්‍රමයට ඉදිරියේ දී ඇතුළුවීමට අපේක්ෂිත ඉහළ කුසලතාත් ඇති එනම් 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ දරු දැරියන් සඳහා පෙර ආයෝජනයක් ලෙස ඔවුන්ගේ පහළ වයස්වල දී ම ඉතුරුම් ගිණුමක් ආරම්භ කොට මූලික මුදලක් රණවිරු සේවා අධිකාරිය මගින් තැන්පත් කිරීම මෙහි ක්‍රමවේදය වේ. ඒ අනුව ප්‍රතිලාභී දරු දැරියන් සාපෙළ හා උපෙළ පංතිවලට එළඹීමේ දී ඔවුනට මාසික ව අවම වශයෙන් රු.500/= ක් ලබා ගැනීමේ හැකියාව ඇති වන පරිදි මෙම ආරම්භක තැන්පතුව ගණනය කෙරේ.

මෙය එම දරුවා ඉගෙන ගනු ලබන පංතිය අනුව අපොස සා/පෙළ පංතියේ දී රු. 12000/- ක ඉතුරුම් ගිණුමක් ලැබෙන සේ මුදල් තැන්පත් කරනු ලැබේ. එනම් 6 වසර දරුවෙකු වෙනුවෙන් මසකට රු.205/- බැගින් වසර 04 ක් ද 7 වසර දරුවෙකු වෙනුවෙන් මසකට රු. 333ග33 බැගින් වසර 03ක් ද 8 වසර දරුවෙකු වෙනුවෙන් මසකට රු 500/- බැගින් වසර 02 ක් ද 9 වසර දරුවෙකු වෙනුවෙන් මසකට රුග1000/- බැගින් වසරක් ද මුදල් තැන්පත් කරනු ලැබේ.

එම ඉතුරුම් ගිණුමට පෞද්ගලික ව දායක වීමට ගිණුම් හිමියාට ද හැකියාවක් ඇති බැවින් ඉතුරුම් ක්‍රමය සඳහා ඔවුන් හුරු කිරීමක් ද මේ මගින් බලාපොරොත්තු වේ. රණවිරු සේවා අධිකාරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය යටතේ දැනට අපොස සාපෙළ හා උපෙළ පංතිවල අධයාපනය ලබන දරු දැරියන් සඳහා මාසිකව රු 500/- ක් ලබා දීමෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වන අමතර වියදම් දැරීමට යම් අයුරකින් දායක වේ. එම මුදල ලබා දීම හුදෙක් ශිෂයාවගේ හෝ ශිෂ්‍යයාගේ අධ්‍යාපන කටයුතු සඳහා ම පමණක් වන අතර, පවුලේ ආදායම වැඩි කර ගැනීම සඳහා නොවනු ඇත.

එසේම බොහෝ රණවිරු දරු දැරියන් වර්තමානයේ ඉතා ලාබාල වයස් සීමාවන් හී සිටින අතර, ඔවුන් ඉහළ පංති වලට පැමිණීම රණවිරුවා වසර 12ක් හෝ 22 ක් සම්පූර්ණ කොට සේවයෙන් ඉවත් වන අවස්ථාවට හා සමපාත වේ. තව ද රණවිරුවා සේවයෙන් ඉවත් වීමත් සමග එම පවුලට ලැබෙමින් තිබූ ආදායම් පහළ වැටීමක් ද පහළ වැටීමක් ද සිදුවේ. නමුත් මෙය සිදුවනුයේ දරුවාගේ අධයාපනය සඳහා මුදල් අවශ්‍යතාව බෙහෙවින් අධික වන අවධියේ දී ය.

මෙම කරුණු සැලකිල්ලට භාජනය කරමින් ඉහත දැක් වු දුෂ්කරතාවට මුහුණ දීමේ පෙර සුදානමක් ලෙස අදාල දරු දැරියන් ඉලක්ක කොට ගෙන යම් කිසි ආයෝජනයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙහි ආරම්භයක් ලෙස රණවිරු දරු දැරියන්ගේ ඉහළ කුසලතා ඇති දරුවන් සඳහා එසේ ආයෝජන ක්‍රමයක් ඇරඹීමට ඉතුරුම් ක්ෂේත්‍රයේ පුරෝගාමී රාජ්‍ය ආයතනයක් වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා එක්ව වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

- 2011 වසර සඳහා රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ලබා දීමේ ප්‍රගතිය.

| | අපේක්ෂිත ව යොමු කෙරෙනු | ලබා දුන් |
|---|---|---|
| සංසද සාමාජිකයින් | 500 | 345 |

- සංසද සාමාජිකයන් සඳහා යොමු කරන අයදුම්පත් සම්පූර්ණ කොට සංසද සාමාජිකත්වය හරහා ලබා ගත් අතර එ මගින් ලැබුනු සියළු ම අයදුම්පත් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම සිදු කෙරුණි.

- ඒ ඒ සේවාවාවන් සඳහා ශිෂ්‍යත්ව බෙදී ගිය ආකාරය

| සේවාව | ලබා දුන් ප්‍රමාණය |
|---|---|
| යුධ | 288 |
| නාවික | 04 |
| ගුවන් | 06 |
| පොලිස් | 42 |
| වි.කා.බ | 5 |
| | 345 |



➢ දිස්ත්‍රික්ක අනුව ශිෂ්‍යත්ව බෙදී යාම

| පළාත | දිස්ත්‍රික්කය | ලබා දුන් ප්‍රමාණය |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 64 |
| | ගම්පහ | 27 |
| | කළුතර | 18 |
| වයඹ | කුරුණෑගල | 61 |
| | පුත්තලම | 8 |
| සබරගමුව | රත්නපුරය | 19 |
| | කෑගල්ල | 15 |
| ඌව | බදුල්ල | 21 |
| | මොණරාගල | 13 |
| මධ්‍යම | මහනුවර | 30 |
| | මාතලේ | 15 |
| | නුවරඑළිය | 8 |
| දකුණ | ගාල්ල | 10 |
| | මාතර | 12 |
| | හම්බන්තොට | 04 |
| උතුරු මැද | අනුරාධපුරය | 43 |
| | පොළොන්නරුව | 06 |
| උතුරු සහ නැගෙනහිර | අම්පාර | 11 |
| | මඩකලපුව | 02 |
| | වව්නියාව | 01 |
| | ත්‍රිකුණාමලය | 06 |




2. අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය

- යුධ, නාවික, ගුවන් හා පොලිසියේ සිට ක්‍රියාක්විතයේ දී මිය ගිය, අතුරුදහන් හා ආබාධිතවුත් රණවිරුවන්ගේ අපොස සා/පෙළ හා උපෙළ හදාරන දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට දිරිදීමක් ලෙස මසකට රු.500/- ක මුදලක් ලංකා බැංකුව හරහා ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත යවනු ලබයි. මෙය ශිෂ්‍යයා ඉගෙන ගනු ලබන වසර අනුව අවුරුද්දක් හෝ අවුරුදු 2ක් ප්‍රදානය කරනු ලබයි.

➢ 2011 වසර සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දීමේ ප්‍රගතියන්

| | අපේක්ෂිතව යොමු කෙරුනු | ලබා දුන් |
|---|---|---|
| සංසද සාමාජිකයින් | 160 | 112 |

➢ ඒ ඒ සේවාවන් සඳහා ශිෂ්‍යත්ව බෙදී ගිය ආකාරය

| සේවාව | ලබා දුන් ප්‍රමාණය |
|---|---|
| යුධ | 89 |
| නාවික | 01 |
| ගුවන් | 02 |
| පොලිස් | 20 |
| | **112** |




➢ දිස්ත්‍රික්ක අනුව ශිෂ්‍යත්ව බෙදී යාම

| පළාත | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක වලට හිම වන ශිෂ්‍යත්ව සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 8 |
| | ගම්පහ | 09 |
| | කළුතර | 03 |
| වයඹ | කුරුණෑගල | 13 |
| | පුත්තලම | 2 |
| සබරගමුව | රත්නපුර | 11 |
| | කෑගල්ල | 05 |
| ඌව | බදුල්ල | 05 |
| | මොණරාගල | 07 |
| මධ්‍යම | මහනුවර | 08 |
| | මාතලේ | 07 |
| | නුවරඑළිය | 03 |
| දකුණ | ගාල්ල | 04 |
| | මාතර | 11 |
| | හම්බන්තොට | 02 |
| උතුරු මැද | අනුරාධපුරය | 08 |
| | පොළොන්නරුව | 0 |
| උතුරු සහ නැගෙනහිර | අම්පාර | 4 |
| | වව්නියාව | 0 |
| | ත්‍රිකුණාමලය | 2 |



3. ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව පැවැත්වීම

| දිනය | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2011/03/01 | කුවේට් රජයෙන් ලබා දුන් ශිෂ්‍යත්ව | 30 |
| 2011/04/11 | කොළඹ (කොස්ගම) | 37 |
| 2011/04/24 | පුත්තලම | 50 |
| 2011/06/13 | ගාල්ල | 150 |
| 2011/07/05 | කුරුණෑගල | 350 |
| 2011/07/19 | නුවර/නුවරඑළිය | 190 |
| 2011/07/20 | මාතලේ | 50 |
| 2011/08/04 | අම්පාර | 80 |
| 2011/08/08 | බදුල්ල | 90 |
| 2011/08/18 | අනුරාධපුරය | 100 |
| 2011/08/22 | කළුතර | 120 |
| 2011/08/20 | 2011 5 වසර ශිෂ්‍යත්ව සමත් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | 90 |

**ශිෂ්‍යත්ව ව්‍යාපෘතියේ වාර්ෂික ප්‍රගති සංක්ෂිප්තය**

| අනු අංකය | වැඩසටහන | ලබා දුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධ්‍යාපන ශිෂ්‍යත්ව (අපොස සා/පෙළ හා උපෙළ) | 112 |
| 02 | රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව | 345 |
| 03 | ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව<br>ශිෂ්‍යත්වලාභීන් ගණන | 13<br>1337 |

## IV. මාපිය කැපකරු වැඩසටහන

<u>හැඳින්වීම</u>

**දේශයේ ඒකීයභාවය සුරක්ෂිත කරනු වස් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවයේ නියුතු ව සිට දිවිපිදූ, අතුරුදහන් සේම දැනට ආබාධිත තත්ත්වයෙන් පුසවන රණවිරුවන් සහ එම පවුල් මානසික හා සමාජීය වශයෙන් ශක්තිමත් ව අභිමානවත් දැක්මක් ඇති සමාජයක් ලෙස ගොඩනැගීමේ අරමුණින් ආර්ථික අපහසුතාවලින් පෙළෙන රණවිරු දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආධාර මුදල් දේශිය හා විදේශිය පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රාහකත්වය යටතේ ලබා දීම සිදු කෙරේ.**

**මෙහි දී රණවිරු සේවා අධිකාරිය මගින් පරිත්‍යාගශීලියෙකු හමුවන තෙක් මසකට රු.500/- ක ආධාර මුදලක් දරුවන් වෙත ලබා දෙන අතර එම දරුවන් වෙනුවෙන් හැකිතාක් දුරට පරිත්‍යාගශීලීන් සොයා ගැනීමට කටයුතු කෙරේ. එහි දී එම දරුවන් වෙත පරිත්‍යාගශීලීන්ගේ අභිමතය පරිද මසකට රු.1000/- හෝ ඊට වැඩි මුදලක් ලබා දේ. පරිත්‍යාගශීලීන් විසින් ආධාර මුදල් ලබා දීම නතර කරනු ලැබුවහොත් නැවත අධිකාරියේ මුදල් යෙදවීම මත එම ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබේ. දරුවන් උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වන කාලය තෙක් ආධාර මුදල් ලබා දීම සිදු කරනු ලබන අතර ඉන් පසු ආධාර මුලප් ලබා දීම අත්හිටවනු ලැබේ.**

<u>අරමුණු</u>

1. අඩු ආදායම්ලාභී රණවිරු පවුල්වල අධ්‍යාපනය ලබන වයසේ පසුවන දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු උසස් අධ්‍යාපනය දක්වා සාර්ථකව නිම කිරීමට අතහිත දීම.
2. රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් අතහිත දෙන දේශිය හා විදේශිය පරිත්‍යාගයන් රණවිරු පවුල්වලට ලබා දීම.
3. රණවිරු පවුල්වල සිටින ආබාධිත හෝ රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙණ රණවිරු දරුවන් වෙනුවෙන් පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රාහකත්වය යටතේ ආධාර මුදල් ලබා දීම.

<u>**ඉලක්කගත කණ්ඩායම**</u>

1. ක්‍රියාන්විත නොවන හේතුන් මත මිය ගිය හෝ ආබාධිත තත්ත්වයට පත් අඩු ආදායම්ලාභී රණවිරු පවුල්වල අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරවන්.
2. පූර්ණ ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන්.
3. දැනට සේවයේ යෙදී සිටින/ මියගිය/ ආබාධිත හෝ අතුරුදහන් රණවිරුවන්ගේ ආබාධිත හෝ රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන රණවිරු දරුවන්.

## 2011/ වර්ෂයේ දී රණවිරු දරුවන් වෙනුවෙන් අලුතින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයන්

| මාසය | අධිකාරියේ මුදල් යෙදවීම මත ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව | පරිත්‍යාගශිලීන්ගේ ආධාර මුදල් මගින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 05 | - | 05 |
| පෙබරවාරි | 05 | 08 | 13 |
| මාර්තු | - | 03 | 03 |
| අප්‍රේල් | - | 01 | 01 |
| මැයි | 04 | - | 04 |
| ජුනි | 04 | 03 | 07 |
| ජූලි | 05 | 02 | 07 |
| අගෝස්තු | - | 03 | 03 |
| සැප්තැම්බර් | 15 | 04 | 19 |
| ඔක්තෝම්බර් | - | 01 | 01 |
| නොවැම්බර් | 06 | 04 | 10 |
| දෙසැම්බර් | 05 | - | 05 |
| **මුළු එකතුව** | **49** | **29** | **78** |

## 2011 වර්ෂයේ දී මුදල් ගෙවීම අවසන් කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයන්

| මාසය | අවසන් කරන ලද ශිෂ්‍යත්ව ගණන |
|---|---|
| ජනවාරි | - |
| පෙබරවාරි | 03 |
| මාර්තු | 12 |
| අප්‍රේල් | 04 |
| මැයි | 01 |
| ජුනි | 01 |
| ජූලි | - |
| අගෝස්තු | 02 |
| සැප්තැම්බර් | 08 |
| ඔක්තෝම්බර් | 01 |
| නොවැම්බර් | - |
| දෙසැම්බර් | 04 |
| **මුළු එකතුව** | **36** |

මෙම ශිෂ්‍යත්ව ලබා ගත් දරුවන් අධ්‍යාපන කටයුතු අවසන් කිරීම හේතුවෙන් හා දරුවන් දෙදෙනෙක් මිය ගොස් ඇති බැවින් ආධාර මුදල් ලබා දීම අත්හිටවන ලදී.

**2011/ජනවාරි මාසයේ සිට 2011/ දෙසැම්බර් මාසය දක්වා ශිෂ්‍යාධාර මුදල් තැන්පත් කිරමේ දී වැය වී ඇති මුදල් ප්‍රමාණයන් (අධිකාරිය මගින් ඇස්තමේන්තුගත කරන ලද මුදල් සහ පරිත්‍යාගශීලීන් වෙතින් ලද ආධාර මුදල් ඇතුළත්ය )**

| අනු අංකය | මාසය | ලබා දුන් මුළු ශිෂ්‍යත්ව ගණන | වැය වු මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ජනවාරි | 640 | රු .489,500.00 |
| 02 | පෙබරවාරි | 642 | රු 488,500.00 |
| 03 | මාර්තු | 630 | රු .479,500.00 |
| 04 | අප්‍රේල් | 627 | රු .467,500.00 |
| 05 | මැයි | 630 | රු .469,000.00 |
| 06 | ජුනි | 633 | රු .475,000.00 |
| 07 | ජූලි | 639 | රු .477,500.00 |
| 08 | අගෝස්තු | 638 | රු .461,500.00 |
| 09 | සැප්තැම්බර් | 646 | රු .476,250.00 |
| 10 | ඔක්තෝම්බර් | 645 | රු .475,250.00 |
| 11 | නොවැම්බර් | 652 | රු .479,750.00 |
| 12 | දෙසැම්බර් | 653 | රු .476,750.00 |
| | **මුළු එකතුව** | **7675** | රු **.5,716,000.00** |

අධිකාරියේ මුදල් යෙදවීම මත ලබා දෙන ශිෂ්‍යත්ව සඳහා සඳහා වැය වී ඇති
මුදල් ප්‍රමාණය - රු.2,333,500.00

පරිත්‍යාගශීලීන්ගේ ආධාර මුදල් මගින් ලබා දෙන ශිෂ්‍යත්ව සඳහා වැය වී ඇති
මුදල් ප්‍රමාණය - රු.3,382,500.00

ලබා දී ඇති ශිෂ්‍යත්ව ආධාරවල සමස්ත වටිනාකම - **රු.5,716,000.00**

**ආබාධිත හා රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන හා රණවිරු දරුවන් වෙනුවෙන් ලබා දුන් වෛද්‍යාධාර මුදල්**

| ලිපි ගොනු අංකය | රණවිරුවාගේ නම හෝ දරුවාගේ නම | ආබාධිත තත්ත්වය හෝ රෝගී තත්ත්වය | ඉටු කර දී ඇති සේවාව හෝ ලබා දුන් මුදල |
|---|---|---|---|
| FPS/UK/80/81 | යූ ජේ අරුණ නන්දන | පූර්ණ ආබාධිත රණවිරුවෙකි. | රු 25,566.50ක මුදලක් ප්‍රතිකාර සඳහා ලබා දී ඇත. |
| FPS/MEDS/16 | තාරුකා තරිදිනී | දකුණු පාදය අහිමි රණවිරු දියනියකි. | රු.25,566.50<br>රු .10,000.00<br>රු .25,000.00<br>රු .10.000.00<br>රු .20.000.00<br>මෙම මුදල් තවම ගිණුම් අංශයේ තැන්පත් කර ඇති අතර කෘතිම පාදයක් ලබා ගැනීමට අවශ්‍ය මුළු මුදල සම්පූර්ණ වූ පසු ලබා දෙන බවට ලිපියක් ලබා ලබා දී ඇත. |
| FPS.MEDS.10 | සනුග බිහන්සිත් | මාංශ පේශි දියවීමේ රෝගයෙන් පෙළෙන රණවිරු දරුවෙකි. | රු .15.000.00 |
| FPS/UK/85 | වාසනා මධුමාලී | අස්ථි ආබාධයකින් පෙළෙන දරුවෙකි. | රු .21,000.00 |
| FPS/MEDS/17 | සනාලි හංසිකා | අක්ෂි ආබාධයකින් පෙළෙන දරුවෙකි. | රු .17.576.00 |
| J.M.S.T.ජයසුන්දර රණවිරු දරුවාගේ ශෛල්‍යකර්මය සඳහා පරිත්‍යාගශීලීන් විසින් රු.350,000/- ක මුදලක් පරිත්‍යාග කර ඇති අතර එම මුදල් දැනට අධ්‍යාපන ගිණුමට බැර කර ඇති අතර ඉදිරියේ දී එම මුදල් ලබා දෙනු ලැබේ. | | | |

**2011 වර්ෂයේ දී අලුතින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව එක් එක් දිස්ත්‍රික්ක අනුව බෙදී යන ආකාරය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ලබා දී ඇති ප්‍රමාණය |
|---|---|---|
| 01 | කොළඹ | 02 |
| 02 | කළුතර | 03 |
| 03 | ගම්පහ | 11 |
| 04 | මහනුවර | 10 |
| 05 | මාතලේ | 04 |
| 06 | නුවරඑළිය | 01 |
| 07 | ගාල්ල | 02 |
| 08 | මාතර | 03 |
| 09 | හම්බන්තොට | - |
| 10 | කුරුණෑගල | 13 |
| 11 | පුත්තලම | 01 |
| 12 | අනුරාධපුරය | 05 |
| 13 | පොළොන්නරුව | 01 |

| | | |
|---|---|---|
| 14 | බදුල්ල | 13 |
| 15 | මොණරාගල | 03 |
| 16 | රත්නපුර | - |
| 17 | කෑගල්ල | 04 |
| 18 | යාපනය | - |
| 19 | කිලිනොච්චිය | - |
| 20 | මන්නාරම | - |
| 21 | වවුනියාව | - |
| 22 | මුලතිව් | - |
| 23 | මඩකලපුව | - |
| 24 | අම්පාර | 2 |
| 25 | ත්‍රිකුණාමලය | - |

<u>**2011 වර්ෂයේ දී**</u>

- ➔ ව්‍යාපෘතිය වෙත අයදුම්පත් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් විය. එහෙත් ඉන් විශාල ප්‍රමාණයක් අඩුපාඩු සහිත ව ඉදිරිපත් වීම නිසා එම අයදුම්පත් ආපසු හරවා යැවීමට කටයුතු කර ඇත.

- ➔ ශිෂ්‍යත්ව සඳහා තෝරා ගත් සෑම දරුවෙකු වෙත ම අදාල මුදල් තැන්පත් කිරීමෙන් පසු දැනුම්දීමේ ලිපි ශිෂ්‍යත්ව සඳහා තෝරා ගත් මාසයේ දීම යැවීමට කටයුතු කර ඇත.

- ➔ රණවිරු දරුවන් වෙත ආධාර ලබා දෙන පරිත්‍යාගශීලීන් වෙත යැවීමට කටයුතු කර ඇත. සෑම පරිත්‍යාගශීලීයෙක් වෙතම ආධාර ලබා දීමෙන් පසුව ඒ වෙනුවෙන් ස්තුතිය පළ කර ලිපියක් සහ මුදල් ලද බවට අදාල කුවිතාන්සිය ද සමග යැවීමට කටයුතු කර ඇත.

- ➔ 2011 වර්ෂයේ දී ශිෂ්‍යාධාර ලබා දීමට අමතර ව රණවිරු මවකගේ නිවසට විදුලිය ලබා ගැනීමට අවශ්‍ය මුදල් පරිත්‍යාගශීලීන්ගේ ආධාර මුදල් මගින් ලබා දීමට කටයුතු කරනු ලැබූ අතර එක් රණවිරු දරුවෙක් වෙනුවෙන් පාසැල් උපකරණ ලබා ගැනීමට අවශ්‍ය මුදල් පරිත්‍යාගශීලීන්ගේ ආධාර මුදල් මගින් ලබා දීමට කටයුතු කරනු ලැබීය.




## V. මාපිය සුරැකුම වැඩසටහන

නව ප්‍රතිලාභින්ගේ දත්ත

| නව ප්‍රතිලාභීන් ප්‍රමාණය | ප්‍රතික්ෂේප අයදුම්පත් ප්‍රමාණය | 2011 වසරට ලබාදුන් ප්‍රමාණය |
|---|---|---|
| 121 | 08 | 113 |
| | | |

අදාල වර්ෂය සඳහා ඉලක්කගත නව ප්‍රතිලාභින් ගණන - 150
ලබාදුන් ප්‍රමාණය - 113
නව ප්‍රතිලාභින් වෙනුවෙන් ගෙවා ඇති මුදල - රු. 317 500.00

- නව ප්‍රතිලාභින් 150 කට මාපිය සුරැකුම ලබා දීමට අපේක්ෂා කළ ද නව අයදුම්පත් දිස්ත්‍රික්කවලින් නොලැබීම හේතුවෙන් 2011 වසර තුළ ලබා දීමට හැකි වූයේ නව පුතිලාභින් 113 දෙනෙකු සඳහා පමණි.

**නව ප්‍රතිලාභින් පලාත් අනුව බෙදී ගොස් ඇති ආකාරය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආධාර ලබාදුන් ප්‍රතිලාභින් ගණන |
|---|---|---|
| 01 | මධ්‍යම | 24 |
| 02 | බස්නාහිර | 05 |
| 03 | නැගෙනහිර | 04 |
| 04 | දකුණ | 28 |
| 05 | උතුරුමැද | 11 |
| 06 | සබරගමුව | 15 |
| 07 | ඌව පලාත | 15 |
| 08 | වයඹ | 11 |
| එකතුව | | 113 |



## පැරණි ප්‍රතිලාභින් සඳහා ගෙවීම්

මාපිය සුරැකුම ප්‍රතිලාභී දෙමව්පියන් සඳහා වසරකට දෙවරක් (මාස 06කට වරක්) මුදල් තැනපත් කරයි.

| | මුල් මාස (ජන/ජුනි) ප්‍රමාණය | වැය වූ මුදල | අග මාස (ජූලි/දෙසැ) ප්‍රමාණය | වැය වූ මුදල | ප්‍රමාද වී තැන්පත් කිරීම් | වැයවූ මුදල (ජන/ජූනි) | ප්‍රමාද වී තැන්පත් කිරීම් | වැයවූ මුදල (ජූලි/දෙසැ) |
|---|---|---|---|---|---|---|---|---|
| 750 බැගින් | 502 | රු2259000/- | 494 | රු2223000/- | 08 | රු25500/- | 07 | රු58500/- |
| 500 බැගින් | 672 | රු2016000/- | 655 | රු1965000/- | 02 | රු 9000/- | 12 | රු66000/- |
| එකතුව | 1174 | රු4275000/- | 1149 | රු4188000/- | 09 | රු34500/- | 19 | රු124500/- |

2011 වසර සඳහා පැරණි ප්‍රතිලාභින් වෙත ගෙවා ඇති මුදල - රු 8,622,000.00

<u>කාර්යභාරයන් හා දෛනික වගකීම් :</u>

- මාපිය සුරැකුම සියළු ප්‍රතිලාභී දෙමව්පියන්ගේ ගිණුම් අරඹා ඇත්තේ කිරුළපන ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ බැවින් එම ගිණුම් සම්බන්ධයෙන් බැංකුව සමග සම්බන්ධ වී කටයුතු කිරීම
- මුදල් ලබාගැනීමෙන් අනතුරු ව ගිණුම් පොත් තම දිස්ත්‍රික්කයේ ඇති ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් බැංකු ශාඛා වෙත යවන ලෙස දෙමව්පියන් දැනුවත් කිරීම
- බැංකුව සමග සම්බන්ධ වි සියළු තැපැල් කාර්යාල සඳහා බැංකුව මගින් දැනුවත් කිරීමේ ලිපි යැවීමට කටයුතු කිරීම
- මාපිය සුරැකුම ලබාගන්නා සියළු ප්‍රතිලාභී දෙමව්පියන්ගේ තොරතුරු ඇතුළත් කර දත්ත ගොනුවක් (data base) සැකසීම
- වැටුපෙන් 25%ක් ලැබෙන දෙමව්පියන්ගේ නාම ලේඛනය වැටුප් හා ලේඛන අංශය මගින් යාවත්කාලීනව ලබා ගැනීමට කටයුතු කිරීම හා ඒ අනුව වැටුප් ලැබෙන දෙමව්පියන්ගේ මාපිය සුරැකුම ගිණුම් අහෝසි කිරීමට කටයුතු කිරීම
- මියගිය දෙමව්පියන්ගේ ගිණුම් අහෝසි කිරීමට කටයුතු කිරීම
- නව ප්‍රතිලාභින්ගේ නාම ලේඛනයක් සියළු සංසද නිළධාරින් වෙත යැවීමට කටයුතු කිරීම
- ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරුවන්ගේ දෙමව්පියන්ට ද මාපිය සුරැකුම ලබා දීමට අදාල තොරතුරු කළමණාකරන මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළද එම ඉල්ලීම ප්‍රතික්ෂේප වීම
- ව්‍යාපෘති වාර්තා සැකසීම
- දෙමව්පියන් විසින් එවන ලද විවිධ ගැටළු සහිත ලිපි අවශ්‍ය තැන්වලට යොමු කිරීමට කටයුතු කිරීම හා විසදිය හැකි ගැටළු සඳහා පිළිතුරු ලිපි යැවීම

ප්‍රතිලාභින්ගෙන් ලැබෙන දුරකථන ඇමතුම්වලට නිසි පරිදි පිළිතුරු ලබා දීම හා අදාල බැංකු ශාඛා සමග සම්බන්ධ වී කටයුතු කිරීම

- මාපිය සුරැකුම වැඩසටහනට දායක වී ඇති දෙමව්පියන් වයෝවෘධ පිරිසක් බැවින් ඔවුන්ගේ ගිණුම් සම්බන්ධයෙන් කොපමණ දැනුවත් කිරීම සිදු කළ ද වැඩි පිරිසකට අවබෝධ නොවන හෙයින් නිතර නිතර ඔවුන්ගේ ගිණුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වේ.

## VI. නිවාස ආධාර ව්‍යාපෘතිය

### 2011 වසර සඳහා නව ගෙවීම්

| අපේක්ෂිත ප්‍රමාණය | ප්‍රතික්ෂේප ප්‍රමාණය | ගෙවන ලද ප්‍රමාණය |
|---|---|---|
| 150 | 07 | 140 |

අදාල වර්ෂයට ඉලක්ක ගත නව ප්‍රතිලාභින් ප්‍රමාණය - 150
ලබා දුන් ප්‍රමාණය - 140

### නව ප්‍රතිලාභින් බෙදී ගොස් ඇති ආකාරය

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආධාර ලබා දුන් ප්‍රතිලාභින් ගණන |
|---|---|---|
| 01 | මධ්‍යම | 22 |
| 02 | වයඹ | 24 |
| 03 | අනුරාධපුර | 38 |
| 04 | සබරගමුව | 15 |
| 05 | ඌව | 17 |
| 06 | නැගෙනහිර | 14 |
| 07 | දකුණ | 02 |
| 08 | බස්නාහිර | 15 |
| | එකතුව | 140 |

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැයට කිරුල වැඩසටහන අරමුණු කරගෙන ප්‍රතිලාභීන් 38කට නිවාස ආධාර ලබා දීමට කටයුතු කර ඇත.

- 2011 වසරට ආධාර ලබා දුන් නව ප්‍රතිලාභින් 16 දෙනෙකුගේ වාරික ගෙවීම ද අවසන් කර ඇත.

- මධ්‍යම හා සබරගමුව පළාත්වල නිවාස ආධාර චෙක්පත් ආණ්ඩුකාරතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් ලබාදීමට එම දිස්ත්‍රික් නිළධාරින් විසින් සිදුකර ඇති අතර අදාල ප්‍රතිලාභින් දැනුවත් කිරීම ව්‍යාපෘතිය මගින් සිදුකර ඇත.




**2011 වසරට පෙර ලබා දී ඇති නිවාස ආධාරවල වාරික ගෙවීම (2011 ජනවාරි සිට ජූලි දක්වා)**

| අනු අංකය | පළාත | 2 වාරික ප්‍රමාණය | 3 වාරික ප්‍රමාණය | මුදල |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර | 02 | 04 | රු 160,000/- |
| 02 | සබරගමුව | 06 | - | රු 240,000/- |
| 03 | දකුණ | 08 | 01 | රු 340,000/- |
| 04 | නැගෙනහිර | 07 | 05 | රු 380,000/- |
| 05 | මධ්‍යම | 11 | - | රු 440,000/- |
| 06 | වයඹ | 06 | - | රු 240,000/- |
| 07 | උතුරු මැද | 02 | - | රු 80,000/- |
| 08 | ඌව | 06 | - | රු 240,000/- |
| | **එකතුව** | **28** | **10** | **රු2,120,000/-** |

වගකීම් හා කාර්යභාරයන් ඃ

- නිවාස ආධාර නව ප්‍රතිලාභින්ගේ ලිපිගොනු සැකසීම හා ලිපිගොනුවල පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීම
- 2011 වසරේ ලෙජරය ගිණුම් අංශයේ උපදෙස් අනුව සැකසීම හා දිස්ත්‍රික් අනුව සියළු ලිපිගොනු වෙන් කර සැකසීම
- නිවාස ආධාර පැරණි ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයක් සැකසීම
- පැරණි ප්‍රතිලාභීන් සියළු දෙනාට නිවාස ආධාර ලබා ගත් වාරික මුදලින් ඉටුකර ඇති වැඩ කොටස පිළිබඳ ප්‍රගතිය ලබා ගැනීම
- සියළුම සංසද සභාපතිවරුන්ට නිවාස ආධාර සම්බන්ධයෙන් ලිපි යැවීම

- ක්‍රියාත්විත නොවන හේතුන්මත මියගිය රණවිරුවන්ගේ පවුල්වල ළගම ඥාතීන් බොහොමයක් නිවාස ආධාර ඉල්ලා ඇති බැවින් එම නාම ලේඛනය සැකසීම හා ඉදිරි පියවර ගැනිමට ව්‍යාපෘති කළමණාකරුට ලබා දීම

- නිවාස ආධාර ප්‍රතිලාභීන් දැනුවත් කිරීම

- නිවාස ආධාර සම්බන්ධයෙන් එවන ලිපිවලට පිළිතුරු යැවීම හා පළාත් නිළධාරින්ට යොමු කිරීම මෙන් ම දුරකථනයෙන් ලැබෙන ගැටළු සම්බන්ධයෙන් සොයා බැලීම



# 04. රණවිරු ගෞරවය හා අභිමානය අංශය

## I. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය

රණවිරු සේවා අධිකාරියේ ප්‍රධාන වුත් සුවිශේෂී වුත් අංශයක් වශයෙන් රණවිරු ගෞරවය හා අභිමානය අංශය හැඳින්විය හැක. සමාජය තුළ රණවිරුවා කෙරෙහි ගෞරවය හා රණවිරුවන් තුළ අභිමානයක් ඇති කරවීමත් එම සමාජ මට්ටම ඒකාකාරව පවත්වාගෙන යාමත් මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එකී අරමුණු සාක්ෂාත් කරනු වස් ව්‍යාපෘති කිහිපයකට මෙම අංශය වෙන් වෙන්ව ක්‍රියාත්මක වේ.

1. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ රණවිරු සැමරුම් උත්සව
2. රණවිරු ස්මාරක හා උද්‍යාන නඩත්තු හා ගෙවීම්
3. රණවිරු පොදු සුබසාධන කටයුතු

මෙකී ව්‍යාපෘති යටතේ විවිධ අනු වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක විය.

1. ජාතික රණවිරු දිනය
2. රණවිරු උත්තම පූජා පදක්කම් ප්‍රදානය
3. රණවිරු කොඩි පැළදවීම

4. පළාත් රණවිරු සමුළු
5. මයිලපිටිය උද්‍යානය නඩත්තු හා ගෙවීම් කටයුතු
6. රණවිරු නාමයට අහිතකර කටයුතු වැලැක්වීම
7. බාහිර ආයතන සමග සමරු වැඩසටහන්
8. ප්‍රාදේශීය සැමරුම් උද්‍යාන හා ශාලා

<u>වැඩසටහන් ක්‍රියාත්මක වූ ආකාරය</u>

ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ රණවිරු සැමරුම් උත්සව සහ වැඩසටහන්

- ජාතික රණවිරු දිනය 2011 මැයි 18පාර්ලිමේන්තු ක්‍රීඩා පිටියේදි උත්කර්ෂවත් ලෙස පැවැත්විනි.
- රණවිරු උත්තම පූජා පදක්කම් ප්‍රදානය දිස්ත්‍රික්ක 17 ක පැවැත්විනි.
- රණවිරු කොඩි පැලඳවීම පලාත් 8ක සිදු විය.
- පළාත් රණවිරු සමුළු 8ක් පවත්වන ලදී.
- බාහිර ආයතන සමග සමරු වැඩසටහනක් සිදු කරන ලදී.
- රණවිරු නාමයට අහිතකර කටයුතු වැලැක්වීම දරුස්මාන් වාර්තාව සම්බන්ධව ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීම් කටයුතු සිදු කරන ලදී.

<u>රණවිරු ස්මාරක හා උද්‍යාන නඩත්තු හා ගෙවීම්</u>

- මයිලපිටිය උද්‍යානය නඩත්තු
  - ජල බිල්පත්
  - විදුලි බිල්පත්
  - දුරකථන බිල්පත්
  - නඩත්තු සේවා සඳහා ගෙවීම්
  - නඩත්තු භාණ්ඩ සඳහා ගෙවීම් කටයුතු
- නව රණවිරු ස්මාරක ඉදි කිරීම සඳහා නියමිත ගෙවීම්

<u>රණවිරු පොදු සුබසාධන කටයුතු</u>

- රණවිරු සමීප ඥාතීන්ගේ, රාජ්‍ය සේවා ස්ථාන මාරුවීම්
- රණවිරු පවුල්වල දරුවන් පාසල් වලට ඇතුලත් කිරීමේදී නිර්දේශ ලිපි නිකුත් කිරීම හා අවශ්‍ය සහය සැපයීම
- රණවිරු පවුල් වල නිවාස ඉදිකිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සහන මිළට ලබාදීම සඳහා ලිපි යොමු කිරීම හා මැදිහත් වීම
- රණවිරුවන්ගේ නමින් මාර්ග නම් කිරීම සඳහා අදාල පාර්ශ්ව දැනුවත් කිරීම හා අදාල කටයුතු කිරීම

(මේ සඳහා දෛනිකව යොමු කෙරෙන අභියාචනා හා ඉල්ලීම් සඳහා නිර්දේශිත ලිපි නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කෙරනි. )




<u>විශේෂ සටහන්</u>

- 2011 වර්ෂය පුරා රණවිරු සමීප ඥාතීන් වෙනුවෙන් උත්තම පූජා පදක්කම් ප්‍රදානෝත්සව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වූ අතර මේ වන විට දිස්ත්‍රික් 17ක් ආවරනය කරමින් පැවැත් වූ මෙම පදක්කම් ප්‍රදානෝත්සවය පදනම් කරගෙන රණවිරුවා නමින් රණවිරු ඥාතීන්ට ගෞරවය හා අභිමානය ඇති කිරීම සඳහා මෙම වැඩසටහන ඉමහත් පිටිවහලක් විය.
- ජාතික රණවිරු දිනය පෙර මෙන් අභිමානවත් අයුරින් පාර්ලිමේන්තු ක්‍රීඩාංගනය අබියස ඇති රණවිරු ස්මාරකය අබියස පවත්වන ලද අතර අතිගරු ජනාධිපතිතුමාගේ හා ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වින.
- දිස්ත්‍රික්ක පුරා ප්‍රාදේශිය හා පලාත් රණවිරු සැමරුම් පැවැත් වූ අතර ඒ තුලින් සමාජය තුලින් කෙමෙන් ගිලිහී යන රණවිරු අභිමානවත් මතක අවදි කරමින් ඔවුන් සමාජයේ ගරුබුහුමන් ලැබිය යුතු විරුවන් ලෙසත් ඔවුන්ගේ පවුල් වීර පවුල් ලෙස අභිමානයක් ඇති කරලීම ට එම දිස්ත්‍රික්, පළාත්, ප්‍රාදේශීය සැමරුම් උත්සව වලට හැකි විය.

## II. ඉඩම් ව්‍යාපෘතිය

❖ හැඳින්වීම

රණවිරු සේවා අධිකාරියේ කාර්යයභාරය රණවිරුවන් හා එම පවුල් සඳහා ඉටු කිරීමේ දී වඩාත් විශේෂ වූ හා සංකීර්ණ වූ අංශයක් ලෙස අදාළ පවුල් සඳහා වාසස්ථානයක් සපයාදීම දැක්විය හැකිය.

එහෙත් බෝහෝ විට නිවාස හා සහන ණය ව්‍යාපෘතීන් මාර්ගයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරිදුන්න ද එම නිවස ගොඩනැගීම සඳහා ස්ථානයක් (ඉඩමක්) හිමි ව නැති අවස්ථාවන්වල දී රණවිරුවා හා එම පවුල් මහත් අසීරුතාවයකට පත් වේ. ඉඩමක් නොමැතිවීම වෙනත් සුබසාධන අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා බාධාවක් ද වනවා ඇත.

ඒ අනුව රණවිරු සේවා අධිකාරියේ ඉඩම් ව්‍යාපෘතිය ඇති කරන ලද අතර ඒ තුළින් රණවිරුවන් සඳහා පදිංචියට ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා චක්‍රව සහයෝගය ලබා දීම ද සිදු කරනු ලබයි.

❖ දැක්ම
නිවසක් ඉදිකර පදිංචවවීම සඳහා සුදුසු ඉඩමක් ලබා දීම.

❖ මෙහෙවර ප්‍රකාශය
රණවිරුවන් සහ එම පවුල් සඳහා වාසයට සුදුසු පහසුකම් සහිත පරිසරයක ඉඩමක් ලබා දීම.

❖ අරමුණු

අ. ඉඩම් නොමැති රණවිරුවන් හා එම පවුල් හඳුනා ගැනීම.
ආ. රණවිරුවන් වෙත බෙදා දිය හැකි රජයේ හෝ වෙනත් ඉඩම් හඳුනාගැනීඹ හා බෙදා දීමට සුදුසු තත්ත්වයට ගෙන ඒම.

ඇ. රණවිරුවන් වෙත බෙදා දීමට නියමිත ඉඩම් සංවර්ධනය කිරීම.
ඈ. අදාළ ආයතන සමග එක්ව රණවිරුවන් හට ඉඩම් ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම.

**1.**ඉඩම් ලබා ගැනීම

රණවිරුවන් වෙත බෙදා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉඩම් වෙන් කර ගැනීම මේ යටතේ සිදුවේ.

- සෑම දිස්ත්‍රික්කයකම හඳුනානොගත් ඉඩම් කොටස් සම්බන්ධයෙන් තොරතුරු රැස්කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යොමු කිරීම.

- එසේ යොමු කරන ලද ලිපිවලට අනුව හඳුනාගත් ඉඩම් පහත පරිදි වේ.

| අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉඩමේ නම | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | කළුතර | බණ්ඩාරගම | මහහේන | අක්කර 1 1/2 |
| 02 | අනුරාධපුර | හොරොව්පතාන | මොරවැව ගම්මානය | හෙක් 300 |
| 03 | අනුරාධපුරය | රාජාංගණය | - | - |
| 04 | කුරුණෑගල | ගිරිබාව | නිරාවියගම | - |
| 05 | කුරුණෑගල | රස්නායකපුර | 303 - උඩහේනේගම | - |
| 06 | කුරුණෑගල | පොල්පිතිගම | කඩහතවැව 1871 හි අංක 08 සහ 11 දරණ ඉඩම | අක්කර 40 රූඩ් 02 පර් 28 |
| 07 | පුත්තලම | ආරච්චිකට්ටුව | • තණබිම<br>• කුඩාවෙරන්කට්ටුව | අක්කර 35<br>අක්කර 40 |
| 08 | පුත්තලම | ආණමඩුව | • 649 කොට්ටුකච්චිය පුරාණගම<br>• 658 සී දිවුල්වැව | අක්කර 40<br>අක්කර 28<br>අක්කර 100 |
| 09 | බදුල්ල | රිදිමාලියැද්ද | • බුබුලපිටිය | අක්කර 40 |
| 10 | බදුල්ල | පස්සර | • ඉහළ අඹතැන්න පතන | අක්කර 10 |
| 11 | අම්පාර | අම්පාර | - | - |

- දැනට අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද ඉඩම්වල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක් ව බෙදා දීමට නියමිත ඉඩම් එළිපෙහෙළි කිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක අමාත්‍යාංශය සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කිරීම සංවිධානය කර ඇත.

- එම ඉඩම්වල මිණුම් කටයුතු සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයෙන් අනුමත රජයේ මිණුම් නිලධාරීන්ගේ සහය ලබා ගැනීමට කටයුතු සංවිධානය කර ඇත.

**3.** ඉඩම් ලබා දීම

- **01.** මදුරාවල නාගහකන්ද වත්ත ඉඩම රණවිරුවන් වෙත බෙදාදීම සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් රණවිරුවන් 210 දෙනෙකුගේ නම් නිර්දේශ කර මදුරාවල ප්‍රාේදශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම.

මදුරාවල " නාගහකන්ද වත්ත" ඉඩම

- ප්‍රමාණය - අක් 19.77
- බෙදා දිය හැකි ඉඩම් කොටස් සංඛ්‍යාව - 210

**02.** බදුල්ල - මීගහකිවුල ඉඩම

- ඉඩම් කොටස් ලබා ගැනීම සඳහා අප අධිකාරිය වෙත යොමු කර ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන් 241 ක ගේ නාම ලේඛණය නිර්දේශ කර මීගහකිවුල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම.

03.රණවිරුවන් වෙත බෙදා දීමට නියමිත ඉඩම් සංවර්ධනය කිරීම.

- ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා එක්ව රණවිරුවන් වෙත බෙදාදීමට කටයුතු කරන ඉඩම්වල සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත මුදල් ලබා දීම.

✓ දමන හිඟුරාන පැරණිගම රණවිරුවන් වෙත ලබා දීමට යෝජිත ඉඩමේ එළිපෙහෙළි කිරීමේ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දමන වෙත රු 133,868.64 මුදලක් ලබා දීම.

✓ ලංකාවේ දිස්ත්‍රික් ගණනාවක් පුරා විසිරී පවතින සංවර්ධනය නොවූ ඉඩම් හඳුනා ගනිමින් ඒවා කඩිනමින් රණවිරු පවුල් වෙත බෙදාදීමේ අරමුණින් 2011.09.11 වන දින සිට 2011.09.21 වන දින දක්වා ඉඩම් නිරීක්ෂණ චාරිකාව සඳහා රු.35,378.00 ක මුදලක් වැයවිය.

✓ ඒ අනුව පහත සඳහන් දිස්ත්‍රික්කවලට අයත් ඉඩම් පිළිබඳ නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

✓ ඩේසිවැලිවත්ත ඉඩම අක්මීමන - ගාල්ල
✓ යාකබැද්ද අකුරැස්ස - මාතර
✓ සූරියගහවෙල ඉඩම - හම්බන්තොට
✓ මීගහකිවුල ඉඩම - බදුල්ල
✓ තෙල්බැද්දවත්ත ඉඩම - බදුල්ල
✓ ඩ්‍රොපින්වත්ත ඉඩම - බදුල්ල
✓ හිඟුරාන පැරණිගම දමන - අම්පාර
✓ බලංගොඩ මැදකොරලේගම ඉඩම - රත්නපුරය

**4.**රණවිරුවන් හට ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම සහ ඔවුන්ගේ ඉඩම් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

**ඉඩම් ලබා ගැනීම සඳහා නිර්දේශයන් ලබා දීම**

මේ යටතේ රණවිරුවන් මහවැලි අධිකාරිය වෙතින් ඉඩම් ලබා ගැනීම සඳහා අප අධිකාරියේ නිර්දේශ ලබා දෙන ලෙස ඉල්ලීම් කරයි.

මෙලෙස ඉල්ලීම් කරන රණවිරුවන් වෙත අයදුම්පත් යොමුකර ඔවුන්ගේ තොරතුරු ගෙන්වා ගන්නා අතර ඉන්පසු එම තොරතුරු සුබ සාධක අධ්‍යක්ෂ මණ්ඩල වෙත යවා නිර්දේශ ගෙන්වා ගැනීමෙන් අනතුරුව අදාළ ආයතන වෙත නිර්දේශ ලිපි යැවීම සිදු කෙරේ.

මේ අයුරින් මෙම වසර පුරා නිර්දේශ ලිපි ලබා දීම පහත පරිදි වේ.

| සේවාව / ආයතනය | යුධ | නාවික | ගුවන් | පොලිස් | එකතුව |
|---|---|---|---|---|---|
| මහවැලි අධිකාරිය | 16 | 02 | - | 06 | **24** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 10 | - | 01 | 02 | **13** |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 04 | - | - | 01 | **05** |
| ඉඩම් කොමසාරිස් කාර්යාලය | 04 | - | - | - | **04** |
| එකතුව | **34** | **02** | **01** | **09** | ***46*** |

☞ **රණවිරුවන්ගේ ඉඩම් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.**

පදිංචි ඉඩම් සඳහා ඔප්පු/බලපත්‍ර ලබා ගැනීම, ඉඩමේ නිවසක් ඉදිකර ගැනීම සඳහා අවසර ලබා ගැනීම ආදී විවිධාකාර ඉඩම් ගැටලු නිරාකරණය කර ගැනීමට රණවිරුවන් ඉදිරිපත් කරන ලිපි වලට අනුව එම ඉල්ලීම් වලට ප්‍රමුඛතාව ලබා දෙන ලෙස දන්වා අදාළ ආයතන වෙත ලිපි යොමු කිරීම සිදුවේ.

මෙම වසර පුරා ඒ අයුරින් ඉදිරිපත් කළ ලිපි පහත පරිදි වේ .

| ලිපි යොමු කළ කාරණය / ආයතනය | ඔප්පු/බලපත්‍ර ලබා ගැනීම | ඉඩම් ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා | නිවාස ඉදි කරගැනීමට අවසර ලබා ගැනීම | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| මහවැලි අධිකාරිය | 09 | 01 | - | **-** | **10** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 20 | 09 | 02 | 14 | **45** |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 09 | - | - | - | **09** |
| ඉඩම් කොමසාරිස් කාර්යාලය | 04 | - | - | 02 | **06** |
| නිවාස සංවර්ධන අධිකාරිය | 01 | - | - | 02 | **03** |
| ඉඩම් අමාත්‍යාංශය හා වෙනත් ආයතන වෙත | - | - | - | 03<br>03 | **06** |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | - | - | 15 | **-** | **15** |
| එකතුව | **43** | **10** | **17** | **24** | **94** |

# 05. සමාජීය හා සංස්කෘතික අංශය

## I. සංසද ව්‍යාපෘතිය

වැය ශීර්ෂය 1 : සංසද පොකුරු වැඩසටහන්

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන වියදම (රු) |
|---|---|---|---|
| වැඩසටහන් 28 | වැඩසටහන් 12 | ❖ 2011.04.21 දින පැවැත්වූ කුරුණෑගල දිස්ත්‍රික් සංසද සාමාජිකයින්ගේ සුහදතා වර්ධන වැඩසටහන් සිදු කිරීම.<br>❖ 2011.04.24 දින පැවැත්වූ පුත්තලම දිස්ත්‍රික් සංසද සාමාජිකයින්ගේ සුහදතා වර්ධන වැඩසටහන් සිදු කිරීම.<br>❖ 2011.04.22 දින පැවැත් වූ ගම්පහ දිස්ත්‍රික් සංසද සාමාජිකයින්ගේ සුහදතා වර්ධන වැඩසටහන් සිදු කිරීම.<br>❖ 2011.04.22 දින පැවැත්වූ කොළඹ දිස්ත්‍රික් සංසද සාමාජිකයින්ගේ සුහදතා වර්ධන වැඩසටහන් සිදු කිරීම.<br>❖ නාත්තන්ඩිය රණවිරු සංසදය මගින් ඉදිකරන ලද රණවිරු ස්මාරකය විවෘත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානයන් සිදු කිරීම.<br>❖ හගුරන්කෙත රණවිරු සංසදය මගින් ඉදිකරන ලද ස්මාරකය විවෘත කිරීමේ උත්සවය 2011.06.07<br>❖ පූජාපිටිය රණවිරු සංසදය මගින් ඉදිකරන ලද රණවිරු ස්මාරකය විවෘත කිරීමේ උත්සවය පැවැත්වීම 2011.06.09<br>❖ හංවැල්ල රණවිරු සංසදය මගින් සංවිධානය කරන ලද පිරිත් පිංකම වෙනුවෙන් මුදල් ලබා දීම.<br>❖ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වූ ඉන්දුනීසියානු සංස්කෘතික වැඩසටහනට රණවිරු බිරින්දෑවරුන් සහභාගී කරවීම 2011.09.07<br>❖ රූපවාහිනී සංස්ථාවේ පැවැතු වූ වැඩසටහනට රණවිරුවන් සහභාගී කරවීම 2011.09.21 | 40,000.00<br>30,000.00<br>30.000.00<br>30,000.00<br>5,000.00<br>6,500.00<br>20,000.00<br>250.00<br>490.00 |
| | | ❖ දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීමට පූර්වගාමී ව දොඩම්ගොඩ පිවිසුම් ස්ථානයේ දී සංසද සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් උත්සවයක් පැවැත්වීම 2011.11.19<br>❖ රණවිරු සේවා අධිකාරිය හා බස්නාහිර පළාත් රණවිරු සංසද එක් ව හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී බෝධි පූජා වැඩසටහනක් පැවැත්වීම 2011.11.24<br>මුළු එකතුව | 3,450.00<br>64,367.50<br>**230,057.50** |

සංසද පොකුරු වැඩසටහන්




වැය ශිර්ෂය 2 : දිස්ත්‍රික් දැනුවත් කිරීම

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන වියදම (රු) |
|---|---|---|---|
| 19 | 11 | ❖ 2011.05.07,08 යන දිනයන් හී ඌව පළාතෙ හි බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම.<br>❖ මහනුවර දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම 2011.07.18<br>❖ මාතලේ දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.07.19<br>❖ පුත්තලම දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.07.25.<br>❖ අම්පාර දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.08.04<br>❖ බදුල්ල දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.08.08<br>❖ අනුරාධපුර දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.08.18<br>❖ කළුතර දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.08.22<br>❖ ගම්පහ දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.09.29<br>❖ පොළොන්නරුව දිස්ත්‍රික් කමිටු රැස්වීම පැවැත්වීම. 2011.10.24 | 21,936.00<br>17,524.00<br>12,446.00<br>13,100.00<br>18,832.00<br>21,105.00<br>90.00<br>16,197.50<br>38,124.43 |
| | | මුළු එකතුව | **159,354.93** |

දිස්ත්‍රික් කමිටු රැස්වීම්




වැය ශිර්ෂය 3 : ආධ්‍යාත්මික හා සමාජීය වැඩසටහන්

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන වියදම (රු) |
|---|---|---|---|
| 12 | 04 | පුනි මස අමාවක පොහෝදින ආගමික වැඩසටහන කැබිතිගොල්ලෑව බෝධිරාජ විහාරස්ථානයේ දී පැවැත්වීම 2011.06.28 | 11,980.00 |
| | | කොටවෙහෙර රණවිරු සසංදයේ මුලිකත්වයෙන් පැවැත් වු ආගමික වැඩසටහනට සහභාගී වීම. | 4,750.00 |
| | | ඔක්තෝම්බර් මස අමාවක පොහෝ දින ආගමික වැඩසටහන කහටගස්දිගිලිය විහාරස්ථානයේ දී පැවැත්වීම. | 19,870.00 |
| | | රණවිරුවන්ගේ අධ්‍යාත්මික ගුණ වගාව වර්ධනය කිරීමේ අරමුණින් ආබාධිත රණවිරුවන් සහභාගීකරගෙන පොල්ගස්ඕවිට ශ්‍රී සුදර්ශනාරාමයේ දී භාවනා වැඩසටහනක් පැවැත්වීම 2011/12/20 | 6,717.10 |
| | | මුළු එකතුව | **43,317.10** |

ආධ්‍යාත්මික හා සමාජීය වැඩසටහන්



වැය ශීර්ෂය 04 : සාමාජිකත්වය රදවා ගැනීම හා සංසද ක්‍රියාකාරිත්වය සාක්ෂාත් කිරීම.

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන රු. |
|---|---|---|---|
| | | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල අක්‍රිය වී පවතින රණවිරු සංසද ක්‍රියාකාරී කිරීම හා රණවිරු සංසද නැවත පිහිටුවීමට කටයුතු කිරීම. 2011.08.01-07<br>මුන්දලම රණවිරු සංසදයේ උද්ගත වූ තත්ත්වයක් පිළිබඳ සොයා බැලීම සඳහා සභාපතිතුමිය විසින් නිරීක්ෂණ චාරිකාවක් සිදු කිරීම. 2011.11.16 | 25,610.00<br>7,580.00 |
| | | මුළු එකතුව | **රු.33,190.00** |

වැය ශීර්ෂය 05 : හදිසි ආපදාවන්දී දී මුල්‍ය ආධාර ලබා දීම.

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන |
|---|---|---|---|
| 1235 | 17 | ආධාර 17 | රු. 170,000.00 |
| | | මුළු එකතුව | **රු. 170,000.00** |

වැය ශීර්ෂය 06 : නායකත්ව පුහුණු වැඩමුළු

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන වියදම (රු) |
|---|---|---|---|
| 08 | 01 | | 77,892.00 |
| | | මුළු එකතුව | **77,892.00** |

වැය ශීර්ෂ 07 : ජාතික හා ප්‍රාදේශිය උත්සව කටයුතු

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | සටහන වියදම (රු) |
|---|---|---|---|
| | | ❖ දැයට කිරුළ වැඩසටහන සම්බන්ධයෙන් අනුරාධපුර ඔයාමඩුව හි පැවති සාකච්ඡාවට සහභාගීවීම.<br>(2012 දැයට කිරුළ වැඩසටහන ) | 4,870.00 |
| | | මුළු එකතුව | **4,870.00** |

වෙනත් සටහන්

- 2011 ජාතික රණවිරු දිනයට සංසද සාමාජිකයින් සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු කිරීම.
    - දිවයින පුරා සියලුම සංසදවල සභාපතිවරුන් හා ලේකම්වරුන් වෙත ලිපි යවා ජාතික රණවිරු දින උත්සවය පිළිබඳ දැනුවත් කිරීම.
    - සියලුම සංසදවලින් සහභාගීවන සාමාජිකයින්ගේ නාම ලේඛන ගෙන්වා ගැනීම.
    - එම සාමාජිකයින් වෙත අවසර පත් නිකුත් කිරීම.
    - ජාතික රණවිරු දින උත්සව දිනයේ දී සංසද සාමාජිකයින් උත්සවයට සහභාගී කරවීමට අදාළ කටයුතු සිදු කිරීම.
- රණවිරු සංසද ගිණුම් තොරතුරු ලබා දෙන ලෙස දන්වා සියලුම සංසද ලේකම්වරුන් වෙත ලිපි යැවීම.
- 2011/11/15 වන දින පැවැති ජාතික රුක් රෝපණ වැඩසටහන පිළිබඳ දැනුවත් කර දිවයින පුරා සංසද සභාපතිවරුන් වෙත ලිපි යැවීම.
- දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීමට පූර්වගාමීව දොඩම්ගොඩ පිවිසුම් ස්ථානයේ පැවති රණවිරු සංසද උත්සවයට පැමිණෙන ලෙස දන්වා අගලවත්ත, පාලින්දනුවර, දොඩම්ගොඩ, බුලත්සිංහල, මතුගම, වලල්ලාවිට,කළුතර යන සංසදවල සියළු ම සාමාජික සාමාජිකාවන් වෙත ලිපි යැවීම.
- පළාත් නිළධාරීන් වෙත මාසික ප්‍රවාහන හා සංයුක්ත දීමනා ගෙවීමට අදාළ කටයුතු සිදු කිරීම.
- පළාත් කාර්යාලවලට අනුයුක්ත ව සේවයේ යෙදී සිටින ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ පුහුණු ශිෂ්‍යයින් හට මාසික දීමනා ගෙවීමට අදාළ කටයුතු සිදු කිරීම.
- පළාත් නිළධාරීන් විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල පවත්වනු ලබන සංසද රැස්වීම් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

විශේෂ කරුණු :-

- 2011 වර්ෂය සඳහා සමාජීය හා සංස්කෘතික අංශය වෙනුවෙන් වෙන්කරන ලද වැය ශීර්ෂ 06ක මුදල් කිසිදු කටයුත්තක් සඳහා මවැය නොවුව ද එම වැඩසටහන් වලින් රණවිරු සේවා අධිකාරියේ බලාපොරොත්තු වන ඉලක්ක සාධනය කර ගැනීමෙහි ලා කටයුතු කිහිපයක් සමාජීය හා සංස්කෘතික අංශය මගින් ගත් බව පැවසිය හැකිය.

- රණවිරු සේවා අධිකාරියේ සියලු ම වැඩසටහන් පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන අතර එම ක්‍රියාවලිය ගොඩනැගී ඇත්තේ පළාත් භාර දිස්ත්‍රික් නිළධාරීන් හා රණවිරු සංසද අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළිනි. ඒ අනුව 2011 වර්ෂයේ අප අංශයෙන් සියලුම වැඩසටහන් සම්බන්ධවත් අදාළ වැය ශීර්ෂ ඒ ඒ පළාත් මට්ටමින් බෙදුණු අයුරුත් එම වැඩසටහන් සංවිධානය කිරීම සම්බන්ධවත් පළාත්භාරව සිටින දිස්ත්‍රික් නිළධාරීන් ව දැනුවත් කරන ලදී.

- මෙම වැඩසටහන් අතුරින් රණවිරු සංසද සම්මේලනය හා වාර්ෂික දැනුවත් කිරීමේ වැඩසටහන ඉතා වැදගත්කමක් උසුලන වැඩසටහනක් වන නිසා රණවිරු සංසද මට්ටමින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අප කටයුත කරන ලදී. මෙහි දී රණවිරු සංසද නිළධාරීන් පිළිබඳවත් රණවිරු සංසද නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම්වල තොරතුරුත් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

- රණවිරු දෙමාපියන් වෙනුවෙන් ආර්ථික සංවර්ධන අංශය යටතේ මාපිය සුරැකුම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම,දෙමාපියන් ප්‍රතිලාභ සඳහා තෝරා ගැනීම වැනි මුලික කටයුතු රණවිරු සංසද හා පළාත් භාරව ක්‍රියා කරන දිස්ත්‍රික් නිළධාරී මගින් සිදුවන අතර මෙහි දී වැය ශීර්ෂ ගත වැඩසටහන සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගෙන ඇත.

❖ දූ දරුවන් සම්බන්ධ ව ශිෂ්‍යත්ව ව්‍යාපෘතියෙන් ද මානසික සබිවලකරණ අංශයෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක වේ. අපගේ අංශයෙන් මේ සඳහා වෙන් කරන ලද වැය ශිර්ෂයෙන් අදාළ වැඩසටහන් විශේෂයෙන් ම තොරතුරු ලබා ගැනීම හැර, සංවිධානය කර ගැනීමට මේ නිසා අප අපොහොසත් වූ බව ද පැවසිය යුතුය.

## II. රණවිරු ගම්මාන ව්‍යාපෘතිය

වැය ශිර්ෂය 1 ඃ රණවිරු ගම්මාන ගෙවතු වගා වැඩසටහන් **(RVSA/08/01)**

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | වියදම (රු.) |
|---|---|---|---|
| 15 | 4 | 1.නවගම්පුර රණවිරු ගම්මානයේ ගෙවතුවගා වැඩසටහන් පවත්වා ගෙනයාම සඳහා උපකරණ හා බීජ ගැනීමට මුදල් ගෙවීම | 14,328.00 |
| | | 2.වල්බෝතලේ රණවිරු ගම්මානයේ ගෙවතුවගා වැඩසටහන් ආරම්භ කිරීම සඳහා බීජ හා පැළ ලබා ගැනීමට මුදල් ගෙවීම. | 37,675.00 |
| | | 3.අම්පාර නවගම්පුර රණවිරු ගම්මානයේ ගෙවතු වගා තරගයේ 1,2,3,4,5 හා 6 ස්ථාන සඳහා මුදල් ත්‍යාග ලබා දීම. | 60,000.00 |
| | | 4.ඉබ්බාගමුව රණවිරු ගම්මානයෙහි ජේෂ කර්මාන්ත ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාල ව තෙවැනි වාරික මුදල් ලබා දීම. | 153,180.00 |
| | | 5.මාලපගම රණවිරු ගම්මානයේ ගෙවතු වගා තරගයේ ජයග්‍රාහයන් සඳහා ත්‍යාගම මුදල් ලබා දීම. | 90,000.00 |
| | | 6.වල්බෝතලේ රණවිරු ගම්මානයේ ගෙවතු වගා තරගයේ 1,2,3,4,5 හා 6 ස්ථාන සඳහා මුදල් ත්‍යාග ලබා දීම. | 60,000.00 |
| | | මුළු එකතුව | **415,183.00** |

වැය ශිර්ෂය 2 ඃ රණවිරු ගම්මාන සුභදතාවර්ධන වැඩසටහන් (**RVSA/08/04**)

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | වියදම (රු.) |
|---|---|---|---|
| 20 | 14 | 1.බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - වතුපිටිවල රණවිරු ගම්මානය | 18900.00 |
| | | 2. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - දිගන රජවැල් රණවිරු ගම්මානය | 18250.00 |
| | | 3. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - නුගේදොළවත්ත රණවිරු ගම්මානය | 20000.00 |
| | | 4. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - විරුසහන රණවිරු ගම්මානය | 20000.00 |
| | | 5. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම -ගල්නෑව රණවිරු ගම්මානය | 20000.00 |

| | | | |
|---|---|---|---|
| | | 6.පාසැල් බෑග් ලබා දීම - සාලාව රණවිරු ගම්මානය | 11550.00 |
| | | 7.ශබ්ද විකාශන යන්ත්‍රය ලබා දීම - සාලාව රණවිරු ගම්මානය | 22600.00 |
| | | 8. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - පැළෑදගොඩ රණවිරු ගම්මානය | 20000.00 |
| | | 9. බක්මහ උළෙල සඳහා ත්‍යාග ලබා දීම - මාලපගම රණවිරු ගම්මානය | 20000.00 |
| | | 10. අවිස්සාවේල්ල සාලාව රණවිරු ගම්මානයෙහි රණවිරු පවුල් සඳහා ඔප්පු ප්‍රදානය කිරීමේ උත්සවයට සහභාගී වීම. | 6760.00 |
| | | 11.2011.06.25-26 දිනයන් හී පැවති පිරිත් පිංකම සඳහා මුදල් ගෙවීම- පැළෑදගොඩ රණවිරු ගම්මානය | 20000.00 |
| | | 12. 2011.08.03 දිනයේ පැවති පිරිත් පිංකම සඳහා මුදල් ගෙවීම -ලුණම රණවිරු ගම්මානය | 20000.00 |
| | | 13.2011/10/27 දින ගල්ගමුව රණවිරු ගම්මානයේ නිවාස වැඩසටහනේ මුල්ගල තැබීමේ උත්සවයට සහභාගී වීම. | 6700.00 |
| | | 14.වතුපිටිවල රණවිරු ගම්මානයෙහි පෙර පාසැල් දරුවන්ගේ විවිධ ප්‍රසංගය සඳහා සහභාගී වීම හා වල්බෝතලේ රණවිරු ගම්මානයේ නිරීක්ෂණ කටයුතු සඳහා යාම. | 1340.00 |
| මුළු එකතුව | | | **226,100.00** |

වැය ශිර්ෂය 3 ඃ රණවිරු ගම්මාන සඳහා යටිතල පහසුකම් සැපයීම (**RVSA/08/05**)

| අපේක්ෂිත ප්‍රමාණය | අවසන් කර ඇති ප්‍රමාණය | ප්‍රගතිය | වියදම (රු.) |
|---|---|---|---|
| 33 | 14 | 1.නුගේදොලවත්ත රණවිරු ගම්මානයෙහි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ඉතිරි වාරික මුදල් ලබා දීම. | 490,000.00 |
| | | 2.වැල්ලවාය රණවිරු ගම්මානයෙහි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා මුදල් ලබා දීම. | 500,000.00 |
| | | 3.පෙරහෙට්ටිය රණවිරු ගම්මානයෙ හි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසාන වාරික මුදල් ලබා දීම. | 200,000.00 |
| | | 4. හුණුමුල්ල නාවික රණවිරු ගම්මානයෙහි ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීමේ ආරම්භක උත්සවය සඳහා සහභාගී වීම. | 3,733.00 |
| | | 5. නුගේදොලවත්ත රණවිරු ගම්මානයේ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල සමීක්ෂණ කටයුතු සිදු කිරීම.(අවස්ථා දෙකකදී) | 2,130.00 |
| | | 6.ගල්නෑව රණවිරු ගම්මානයේ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා පළමු වාරික මුදල් ලබා දීම. | 150,000.00 |

| | | | |
|---|---|---|---|
| | | 7. නුගේදොලවත්ත රණවිරු ගම්මානයෙහි ඉදි කරන ලද ප්‍රජා ශාලා ගොඩනැගිල්ල හා වතුපිටිවල,කැරගල හා උඩුපිල රණවිරු ගම්මානවල නිරීක්ෂණ කටයුතු සිදු කිරීම. | 1,405.00 |
| | | 8.පෙරහෙට්ටිය රණවිරු ගම්මානයේ පෙර පාසැල් දරුවන්ගේ විවිධ ප්‍රසංගය හා චිත්‍ර ප්‍රදර්ශනයේ දී දරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මුදල් ගෙවීම. | 20,000.00 |
| | | 9.ගල්නෑව රණවිරු ගම්මානයෙහි සෙල්ලම් මිදුල අළුත්වැඩියා කිරීම සඳහා මුදල් ගෙවීම. | 26,450.00 |
| | | 10.රණවිරු ගම්මාන සඳහා ලබාදීමට නර්තන භාණ්ඩ මිල දී ගැනීම. | 147,480.00 |
| | | 11.රණවිරු ගම්මාන සඳහා ලබාදීමට සංගීත භාණ්ඩ මිල දී ගැනීම. | 51,020.00 |
| | | 12.රණවිරු ගම්මාන සඳහා ලබාදීමට ක්‍රීඩා භාණ්ඩ මිල දී ගැනීම. | 99,822.00 |
| | | මුළු එකතුව | **1,692,040.00** |

වෙනත් සටහන් ඃ- 1.රණවිරු ගම්මානවලින් ලද ලිපිවලට අදාල ව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

2.දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට අදලාව කටයුතු සිදු කිරීම.

3.රණවිරු ගම්මාන සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම්, ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම සහ අවශ්‍යතාව අනුව බාහිර ආයතන සම්බන්ධීකරණයන් සිදු කිරීම.

4.කැකිරාව රණවිරු ගම්මානයේ ඉදි කරමින් පවතින පෙර පැසල් ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සඳහා ප්‍රාදේශිය සභාවට ලිපි යැවීම.

5.අයදුම් පත්‍රයක් යැවීම මගින් රණවිරු ගම්මානවල නව තොරතුරු ලබා ගැනීම හා ඒවා පරිගණක ගත කිරීම.

6. ජාතික රුක් රෝපණ දිනය නිමිත්තෙන් වැඩසටහන් ආරම්භ කිරීම සඳහා රණවිරු ගම්මාන දැනුවත් කර ලිපි යැවීම.

7.මහජන ආවරණය සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට මිල ගණන් ඇගයීම් කමිටුව වෙත යොමු කිරීම.

8.රණවිරු ගම්මානවල සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාල පොත් මිල දී ගැනීමට කටයුතු සිදු කිරීම.

රණවිරු ගම්මානවල ප්‍රජා ශාලා ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම (2011)

පෙරහෙට්ටිය රණවිරු ගම්මානය

- ඇස්තමේන්තු ගත මුදල - රු. 465,802.75
- රණවිරු සේවා අධිකාරියෙන් ලබා දීමට නියමිත මුදල - රු. 400,000.00

රණවිරු ගම්මාන සමිතිය මගින් ප්‍රජා ශාලාවේ සියලු ම වැඩ අවසන් කර ඇත. ඒ අනුව රණවිරු සේවා අධිකාරියේ මුදල් ලබා දී අවසන් කර ඇත.

- නුගේදොලවත්ත රණවිරු ගම්මානය
  - ඇස්තමේන්තු ගත මුදල - රු. 1,289,107.00
  - රණවිරු සේවා අධිකාරියෙන් ලබා දුන් නියමිත මුදල - රු. 1,289,107.00

රණවිරු ගම්මාන සමිතිය මගින් ප්‍රජා ශාලාවේ සියලු ම වැඩ අවසන් කර ඇත. ඒ අනුව රණවිරු සේවා අධිකාරියේ මුදල් ලබා දී අවසන් කර ඇත.

- වැල්ලවාය රණවිරු ගම්මානය
  - ඇස්තමේන්තු ගත මුදල - රු. 723,247.93
  - රණවිරු සේවා අධිකාරියෙන් ලබා දුන් මුදල - රු. 500,000.00

රණවිරු ගම්මාන සමිතිය මගින් ප්‍රජා ශාලාවේ සියලු ම වැඩ අවසන් කර ඇත. ඒ අනුව රණවිරු සේවා අධිකාරියේ මුදල් ලබා දී අවසන් කර ඇත.

- කැකිරාව රණවිරු ගම්මානය
  - ඇස්තමේන්තු ගත මුදල - රු. 499,995.32
  - රණවිරු සේවා අධිකාරියෙන් ලබා දීමට නියමිත මුදල - රු. 499,995.32
  - ගෙවා ඇති මුදල - රු. 399,996.27
  - ගෙවීමට ඇති මුදල - රු. 99999.05

වැඩ අවසන් කළ පසු ඉතිරි මුදල් ගෙවීමට කටයුතු කිරීමට නියමිත ව ඇත.

ඉබ්බාගමුව රණවිරු ගම්මානය

- ඇස්තමේන්තු ගත මුදල - රු. 1,071,864.28
- රණවිරු සේවා අධිකාරියෙන් ලබා දීමට නියමිත මුදල - රු. 510,707.26
- ගෙවා ඇති මුදල - රු. 459,540.00
- ගෙවීමට ඇති මුදල - රු. 51,167.26

මෙම රණවිරු ගම්මානයේ ප්‍රජා ශාලාව සඳහා වාරික තුනක ම මුදල් ලබා දී ඇති අතර, වැඩ අවසන් කළ පසු ඉතිරි වාරිකයේ මුදල් ගෙවීමට කටයුතු කිරීමට නියමිත ව ඇත.

ගල්නෑව රණවිරු ගම්මානය

- ඇස්තමේන්තු ගත මුදල - රු. 555,341.76
- රණවිරු සේවා අධිකාරියෙන් ලබා දීමට නියමිත මුදල - රු.500,000.00
- ගෙවා ඇති මුදල - රු. 150,000.00
- ගෙවීමට ඇති මුදල - රු. 350,000.00

වැඩ අවසන් කළ පසු ඉතිරි මුදල් ගෙවීමට කටයුතු කිරීමට නියමිත ව ඇත.

මෙයට අමතර ව පහත සඳහන් කටයුතු ද ගම්මාන සඳහා ක්‍රියාවට නංවන ලදී.

1. පෙර පාසැල් සඳහා ත්‍යාග ලබා දීම.
    - සාලාව රණවිරු ගම්මානය
2. ශබ්ද විකාශන යන්ත්‍ර ලබා දීම.
    - සාලාව රණවිරු ගම්මානය
3. අවුරුදු උත්සවය සඳහා මුල්‍ය දායකත්වය ලබා දීම.
    - වතුපිටිවල රණවිරු ගම්මානය
    - දිගන රජවැල්ල රණවිරු ගම්මානය
    - නුගේදොලවත්ත රණවිරු ගම්මානය
    - විරුසහන රණවිරු ගම්මානය
    - ගල්නෑව රණවිරු ගම්මානය
    - පැළෑදගොඩ රණවිරු ගම්මානය
    - මාපලගම රණවිරු ගම්මානය
4. පිරිත් පිංකම් පැවැත්වීම සඳහා මුදල් ලබා දීම.
    - පැළෑදගොඩ රණවිරු ගම්මානය
    - ලුණම රණවිරු ගම්මානය
5. සෙල්ලම් මිදුල අළුත්වැඩියා කර ගැනීම සඳහා මුදල් ලබා දීම.
    - ගල්නෑව රණවිරු ගම්මානය
6. ගෙවතු වගා සඳහා උපකරණ හා බීජ පැළ ලබා දීම .
    - නවගම්පුර රණවිරු ගම්මානය
    - මාපලගම රණවිරු ගම්මානය
    - වල්බෝතලේ රණවිරු ගම්මානය
7. රණවිරු ගම්මානවල ප්‍රජා ශාලා ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම.
    - ගල්නෑව රණවිරු ගම්මානය
    - වැල්ලවාය රණවිරු ගම්මානය

III. සංස්කෘතික

## 2011 සාහිත්‍ය කලා තරගාවලිය - රණවිරු සුවඳ

| වැඩසටහන | වියදම |
|---|---|
| 01. රණවිරු සුවඳ සාහිත්‍ය කලා තරගාවලිය තරග අංශ සහ අයදුම්පත සැකසීම සහ එය සිදු කරන ආකාරය මෙන්ම ඉහත සඳහන් සියල්ල අනුමත කර ගැනීම. | |
| 02.අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම නිර්මාණය සහ පුවත් පත් දැන්වීම් පළ කිරීම (මිල ගණන් කැඳවා සිදු කරන ලදී.) | දැන්වීම් නිර්මාණය සඳහා රු.28560.00<br>ඉරිදා ලංකාදීප රු. 588,000.00<br>ඉදිදා සිළුමිණ රු. 386,400.00 |
| 03. සංසද, ගම්මාන, සේවා වනිතා ඒකකවලින් සහ ආරක්ෂක සේවාවල සුභසාධක ආයතනවලින් ආරක්ෂක විද්‍යාලයෙන් නිර්මාණ ලබා ගැනීඹ සඳහා අයදුම්පත් මුද්‍රණය කර බෙදා දෙන ලදී. | |
| 04.ලැබෙන අයදුම්පත් තරග අංශවලට බෙදා පරිගණක ගත කිරීම. | |
| 05.තේරීම් තරග පැවැත්වීමට කටයුතු සූදානම් කිරීම. | |
| 06. ආහාර ලබා ගැනීම යුද හමුදාවෙන් සිදු කරන ලදී. | ආහාර සඳහා -<br>රු.32476.25 |
| 07 තේරීම් තරග පැවැත්වීම විනිශ්වය මණ්ඩල තෝරා ඔවුන් දැනුවත් කිරීම හා ගෙවීම් කිරීම. | ලිඛිත තරග හැර අනෙකුත් තරග විනිශ්වයකරුවන්ට සහ සහායක ශිල්පීන්ට ගෙවීම් කිරීම -<br>රු 85,000.00<br><br>ලිඛිත තරග සඳහා ගෙවීම් ගාස්තු<br>රු.72,000.00 |
| 08. තරග පැවැත්වෙන දින සම්බන්ධයෙන් ළමුන් දැනුවත් කිරීම. | |
| 09.තරග පැවැත්වීම | ශාලා ගාස්තු - රු..10,400.00<br>සී ඩී කැසට් යන්ත්‍රයක් ලබා ගැනීම - රු. 3500.00<br>ශබ්ද විකාශන පද්ධතිය රු.5000.00 |
| 10. තරග පවත්වා ප්‍රතිඵල ලේඛන සැකසීම | |
| 11. ජයග්‍රාහකයන් සඳහා මුදල් ත්‍යාග ලබා දීමට චෙක්පත් සැකසීම | ත්‍යාග මුදල් - රු.7,32,500.00 |
| මුළු වියදම් | **රු. 1,943,836.25** |

# සමාප්තිය

වසර එකොලහක පමණ කාල පරිච්ඡේදනක් තුළ රණවිරු සේවා අධිකාරිය අප රටට නිරතුරු ව ම රැකවරණ ලබා දීම උදෙසා ජීවිත පූජා කිරීම ඇතුළු අනේකවිධ පරිත්‍යාගයන් සිදු කරමින් අවශේෂ සහෝදර ජනතාවට ද ආදර්ශයක් ලබා දුන් දැයේ අභිමානවත් දූ දරුවන් ට ජාතියේ ප්‍රණාමය හා ගෞරවය ප්‍රායෝගික ව පුද කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබෙන සංවර්ධන වැඩ පිළිවෙල සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම කෙරෙහි විශේෂිත කැපකිරීමකින් යුතු ව සංවිධාන ශක්තිය යොදවනු ලබයි. ජාතියේ මෙම අභිමානවත් දූ දරුවන්ට හෙට දිනය වඩාත් යහපත් හා සුරක්ෂිත එකක් බවට පත් කිරීම රණවිරු සේවා අධිකාරියේ අභිප්‍රාය මුදුන් පත් කර ගැනීම සඳහා රණවිරු සේවා අධිකාරියේ ක්‍රියාකාරී වැඩ සැලැස්ම පියවරෙන් පියවර වඩාත් ඵලදායී තත්ත්වයකට නැංවීමට අවශ්‍ය පියවර 2011 වසර තුළ දී ගනු ලැබීමට හැකිවීම අප ලද ජයග්‍රහනයක් සේ සලකමු.

රණවිරු සේවා අධිකාරියේ දැක්ම රණවිරු නාමයට ජාතික කෘතගුණ දැක්වීම වන හෙයින් ඒ වෙනුවෙන් සුවිශේෂ අවධානයක් යොමු කරමින්, මෙතෙක් විසිරි තිබූ ව්‍යාපෘති ක්ෂේත්‍ර ඒකරාශි කොට ප්‍රධාන අංශ පහක් යටතේ ඒවා ක්‍රියාවට නැංවීම 2011 වසර තුළ කැපී පෙනෙන ලක්ෂණයකි. රණවිරු ජනතාවගේ ප්‍රධාන අවශ්‍යතා ඒ නිසා වඩාත් සාර්ථකව පසුරාලීමට හැකි වූ බව අපගේ විශ්වාසයයි. මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ අධිකාරයේ කාර්ය මණ්ඩලය අවම පහසුකම් යටතේ ඉහත කී අරමුණු ජය ගැනීම සඳහා කැපවීමෙන් ආදර්ශයක් ලබා දී තිබෙන බවයි.කාර්යාලයීය ගොඩනැගිල්ල සහ කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වයන් ඉදිරි වර්ෂය තුළ දී සාර්ථක කර ගැනීමට මෙම වසර තුළ පියවර රාශියක් ගෙන ඇති බැවින් ඉදිරි වර්ෂය තුළ වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් රණවිරු ප්‍රජාව වෙනුවෙන් ලබා දීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරමු.

අපගේ රණවිරුවන් රටට දායද කර තිබෙන ඔවුන්ගේ දූ දරුවන් අධ්‍යාපන කුසලතා වර්ධනය කිරීම සම්බන්ධයෙන් රණවිරු සේවා අධිකාරිය විශේෂ අවධානයක් යොමු කරයි.මේ අනුව රණවිරු දූ දරුවන්ගේ භාෂා දැනුම විශේෂයෙන් ඉංග්‍රීසි භාෂා දැනුම වැඩි දියුණුකිරීමටත් එසේම ඔවුන්ගේ සෞන්දර්යාත්මක කුසලතා වර්ධනය කිරීම සඳහා සංස්කෘතික වැඩසටහන් රණවිරු ගම්මානවල ක්‍රියාත්මක කිරීමටත්, ඔවුන්ට අවශ්‍ය පරිගණක දැනුම ලබා දීෂ සඳහා පරිගණක පාඨමාලා ක්‍රමවත්ව පවත්වා ගෙන යාමටත් මෙම වර්ෂය තුළ දී අවකාශ ලැබුණු බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙවැනි ගැඹුරු කාර්යභාරයන් රාශියක් ජාතියේ රණවිරුවන් වෙනුවෙන් ඉටු කිරීමට රණවිරු සේවා අධිකාරිය ක්‍රියාක්මක කරන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා විශේෂ අවධානයකින් යුක්තව මාර්ගෝපදේශ ලබාදුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්,ජනාධිපති ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්,ත්‍රිවිධ හමුදාපතිවරුන් හා පොලිස්පති ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය පමණක් නොව අධිකාරියේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා විවිධාකාරයෙන් සහයෝගය ලබා දුන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ද මෙහි දී කෘතවේදිත්වයෙන් යුතු ව සිහිපත් කරනු කැමැත්තෙමු.

ශ්‍රී ලංකාවේ උත්තරීතර නිදහස, ස්වෛරීභාවය,ස්වාධීනත්වය හා භෞමික අඛණ්ඩතාවත් සුරක්ෂිත කරමින් ලෝකයේ අන් රටවලට ද ආදර්ශයක් දෙමින් සියළු ම ජනකොටස්වලට රැකවරණය හා ආරක්ෂාව සලසමින් අතිශය දුෂ්කර එහෙත් වගකීම් සහිත ජාතික මෙහෙවරක් ඉෂ්ට කළ ජාතියේ රණවිරු ප්‍රජාවට ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිද්දෙන් යහපත් ජීවනතත්ත්වයක් නිර්මාණය කර දීම සඳහා රණවිරු සේවා අධිකාරිය සිය මෙහෙවර කැපවීමෙන් යුතුව ඉදිරියටත් ඉෂ්ට කරන බව සතුටින් සඳහන් කරමු.

☆☆☆☆☆

# 2011 දෙසැම්බර් 31 දිනෙන්

# අවසන් වර්ෂය සඳහා

# විගණකාධිපති වාර්තාව

# (සිංහල)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ජීඑ/ඩී/ආර්එස්/එෆ්ඒ / 2011 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2012 සැප්තැම්බර් [illegible] දින |

සභාපති,

රණවිරු සේවා අධිකාරිය.

රණවිරු සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ
මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති.

පිටපත් :-

01. ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
02. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

සභාපති,
රණවිරු සේවා අධිකාරිය

**රණවිරු සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

රණවිරු සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 9(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 ජුනි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම් එකතුව රු. 153,450 ක් නොනිසි ලෙස පොළී ආදායම් ගිණුමට හර කර ලැබිය යුතු පොළි ආදායම් ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම හා ශේෂපත්‍ර දිනට ලැබිය යුතු පොලී ආදායම රු.306,900 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) අධිකාරිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වෙනුවෙන් මසකට රු.200,000 බැගින් 2011 අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා කාලයට අදාල ගොඩනැගිලි කුලිය වූ රු.1,800,000 ක මුදලට අදාල ගැලපීම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබීම හේතුවෙන් රු.1,800,000 කින් ලාභය වැඩියෙන් දක්වන අතර ශේෂ පත්‍රයේ වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(ඇ) අධිකාරිය වෙත බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන භාණ්ඩ පරිත්‍යාගයන්හි වටිනාකම ගණනය කර ආදායමක් ලෙසත්, එය නැවත යම් පාර්ශවයකට ලබා දුන් පසු වියදමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 ජනවාරි 07 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සහනදායී ණය ව්‍යාපෘතියේ අයවිය යුතු ණය වටිනාකමින් වාර්ෂිකව 01% කට සමාන ප්‍රමාණයක් 2010 ජනවාරි 01 දින සිට අඩමාන ණය වශයෙන් වෙන් කිරීමට අනුමැතිය ලබා දී තිබුණද 2010 හා 2011 වර්ෂ අවසානයට එකතුව රු.4,648,204 ක් වූ අදාල වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිල්ල සඳහා 2011 දෙසැම්බර් 31 දින දක්වා රු 26,595,450 ක ද්‍රව්‍ය හා අනෙකුත් පිරිවැය දරා තිබුණි. මේ දක්වා දැරූ වියදම් නොනිම් වැඩ ගිණුමට ගලපනවා වෙනුවට ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ගලපා තිබුණි. තවද නොමිලේ ලැබෙන ශ්‍රම පිරිවැය වෙනුවෙන්ද ගැලපීම් කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ අධ්‍යාපන ව්‍යාපෘතියට හා රණවිරු අනුස්මරණ ව්‍යාපෘතියට අයත් ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම් තැබීමේදී වාර්ෂික පොලී ආදායම රු.91,034 කින්ද වර්ෂය මුල ලැබිය යුතු පොලී ආදායම රු. 5,137 කින්ද , වර්ෂය අග ලැබිය යුතු පොලී ආදායම රු.33,479 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. ඊට අදාල රඳවා ගැනීම් බදු ද රු.38,527 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

2.2.2 නොසැසඳුනු පාලන ගිණුම්

------------------------------

සහනදායී ණය ව්‍යාපෘතිය යටතේ ණය වාරික හා පොළිය අයකරගත් අවස්ථා 15 කට අදාලව පුරෝකථන ලේඛනයේ (මුදල් පොත අනුව සකසන ලද) ඇතුලත් කර තිබූ අගය ලෙජරයේ ඇතුලත් කල අගයට වඩා රු.1,098,657 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබූ අතර තවත් අවස්ථා 15 කට අදාලව පුරෝකථන ලේඛනයේ අගය ලෙජරයේ ඇතුලත් අගයට වඩා රු.899,952 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

(i) මූලය ප්‍රකාශනවල ආබාධිත රණවිරු ව්‍යාපෘතියට අදාලව ලැබිය යුතු ඉතිරිකිරීමේ ගිණුම් ආයෝජන පොලී ලෙස දක්වා තිබූ රු.44,748 ක්ද, ලැබිය යුතු තැන්පතු, ණය හා දුරකථන ගාස්තු රු.166,812 ක්ද වර්ෂ 2 කට අධික කාලයක සිට අයවිය යුතුව පවතී.

(ii) 2010-2011 වර්ෂ වලට අදාලව ලැබිය යුතු ජයවිරු ලොතරැයි ආදායම් වලින් රු. 100,837,139 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය වෙත ලැබිය යුතුව පවතී.

(iii) මූලය ප්‍රකාශන අනුව අධිකාරියේ අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය රු. 32,335,173 ක් වුවද ශේෂ සනාථ කිරීමට අනුව එහි ශේෂය රු. 32,467,260 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය යටතේ හා පොදු ගිණුම යටතේ ගෙවිය යුතු රු. 300,421 ක් හා රු. 13,548 ක් වර්ෂ 2 කට අධික කාලයක සිට පියවා නොතිබුණි.

2.2.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවිනි.

පහත සඳහන් ශීර්ෂ සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකල නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(අ) රු. 307,358 ක් වූ අවසාන තොගයේ උපලේඛනයක් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අධිකාරියට එරෙහිව හා අධිකාරිය විසින් පවරා ඇති නඩු පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.2.5 නීති, රීති, රෙගුලාසි සහ කලමනාකරණ තිරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කලමනාකරණ තිරණවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ.756 | අධිකාරිය සතු ස්ථාවර වත්කම් හා තොග වාර්ෂිකව සමීක්ෂණ මණ්ඩලයක් මගින් සමීක්ෂණය කර නොතිබුණි. |
| | (ii) මු. රෙ. 1645 | එක් එක් වාහනය සම්බන්ධව මාසික ධාවන සටහන් ඊළග මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත එවා නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධිකාරිය සතු වාහන සම්බන්ධයෙන් මාස 06 කට වරක් සිදුකලයුතු දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂණයන් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ අයවැය ගත ශේෂපත්‍රය අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ක්‍රියාකාරී සැලැස්ම ඇතුලත් කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842, 2002 නොවැම්බර් 28 දිනැති අංක IA1/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/02 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛන හා පරිගණක උපාංග ලේඛන නඩත්තු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,761,093 ක්වූ රජයේ දායකය ගනන් ගැනීමෙන් පසු රු.11,402,525 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.19,578,342 ක්වූ රජයේ දායකය ගනන් ගැනීමෙන් පසු රු.10,238,432 ක අතිරික්තයක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,164,093 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා රජයේ ප්‍රදාන ජයවිරු ලොතරැයි ආදායම හා රණවිරු කොඩි අලෙවි ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සැලකිය යුතු මට්ටමකින් වැඩිවී තිබීම බලපා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>ණය හා ආධාර ලබාදීම</u>

(i). අධිකාරියේ 2011 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සමග 2011 සැප්තැම්බර් 30 දිනට අධිකාරියේ ණය හා ආධාර ලබාදීමට අදාල කාර්ය සාධනය සැසඳීමේදී , අදාල ඉලක්කයන් ලගාකර ගැනීම ඉතා පහල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ණය වර්ගය | ක්‍රියාකාරී සැලැස්ම අනුව | | කාර්යසාධනය | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| | | රු | | රු |
| ස්වයංරැකියා ණය | 20 | 2,000,000 | 06 | 560,000 |
| ත්‍රීවිල් ණය | 200 | 60,000,000 | 01 | 300,000 |
| ස්වයංරැකියා ආධාර | 40 | 1,200,000 | 18 | 540,000 |
| නිවාස ආධාර | 150 | 15,000,000 | 13 | 960,000 |
| ආබාධිත උපකරණ හා අවශ්‍යතා සඳහා ආධාර | 300 | 17,310,783 | 122 | 4,642,083 |

- ❖ වාරික වශයෙන් ණය හා ආධාර නිකුත් කිරීම , කාර්යසාධන වාර්තා ඉදිරිපත්කිරීම හා ඊට අදාල අනෙකුත් වැදගත් කොන්දේසි සම්බන්ධයෙන්, ක්‍රියාවලිය ආරම්භයේ සිට අවසානය දක්වා පියවර ඇතුලත් කරමින් ක්‍රමවේදයන් සකස් කර නොතිබුණි. ඒ ඒ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාල පියවරවලට වගකීම් දරන නිලධාරීන් හඳුනාගෙන ඵලදායී කාර්යසාධනයකට හා පසුවිපරම් කටයුතු සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

- ❖ ප්‍රතිලාභීන් වෙත නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය නිලධාරීන් වෙත ලබාදෙනු ලබන චෙක්පත් අදාල පුද්ගලයන්ට ලබාදීම ප්‍රමාදවීම නිසා අවස්ථා 71 කදී රු 854,250 ක් වටිනා චෙක්පත් නැවත දින දීර්ඝ කිරීම සඳහා අධිකාරියේ ගිණුම් අංශය වෙත ආපසු ලැබී තිබුණි. මේ අනුව රණවිරු සුභසාධන කටයුතු විධිමත් ලෙස සිදු නොවන බව නිරීක්ෂණය විය.

- ❖ සම්බන්ධිකරණ නිලධාරීන් පවා පත්කර තිබියදී සහනදායී ණය අරමුදල යටතේ ණය ගෙන තිබූ ණයකරුවන් 4 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 163,804 ක් වටිනා ණය වාරික අයවීම 2011 නොවැම්බර් සිට නැවතී තිබුණි.

(ආ) රණවිරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් පිළිබඳ දත්ත හා තොරතුරු රැස්කර ලේඛනයක් පිළියෙල කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පනතේ 6 වගන්තිය අනුව රණවිරු සාමාජිකයන් හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛනයක් සකස්කර පවත්වා ගෙන යාම හා එය යාවත්කාලීන කිරීම කල යුතු වුවද එවැන්නක් සකස්කර ඉදිරිපත් කිරීමට අධිකාරිය මෙතෙක් අපොහොසත් වී තිබුණි.

(ii) රණවිරුවන් වෙනුවෙන්, මේ දක්වා ලබාදුන් ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබා ගත හැකි ලේඛන හෝ ක්‍රමවේදයක් අධිකාරිය සතුව නොතිබුණි.

(ඇ) රණවිරු ගම්මාන වැඩසටහන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගම්මානවලට අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් සැපයීම සැලැස්මකට අනුව සිදුවී නොතිබුණි.

(ii) ඒ හේතුවෙන් රණවිරු පවුල්, පදිංචිය අතහැර යාමටත්, ගම්මානවල පදිංචියට පැමිණීම ප්‍රතික්ෂේප කිරීමටත් පෙළඹී සිටි අතර ඊට අදාලව පසුවිපරම් කටයුතු සිදුකර එම තත්ත්වය අවම කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(iii) වර්ෂයකට 08 බැගින් රණවිරු ගම්මානවල ප්‍රජාශාලා ඉදිකිරීමට සැලසුම්කර තිබුණද ඒ අනුව ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි. ඊට අදාලව විධිමත් සැලැස්මක් නොතිබීමෙන් ආරම්භ කල ඉදිකිරීම් කටයුතු පවා බොහෝ කාලයක් ගතවනතුරු නිමකිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී තිබුණි. නිදසුනක් වශයෙන් ඉබ්බාගමුව රණවිරු ගම්මානයේ ප්‍රජාශාලාව හා කැකිරාව ගම්මානයේ පෙරපාසැල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් දැක්විය හැක.

(ඈ) කායික හා මානසික සවිබල ගැන්වීමේ අංශයේ ප්‍රගතිය

මනෝ සමාජයීය ව්‍යාපෘතිය වෙනුවෙන් 2011 වර්ෂයට වෙන්කර තිබූ ප්‍රතිපාදනය රු.5,020,106 කි. එම ප්‍රතිපාදනයෙන් 2011 සැප්තැම්බර් 30 දින වනවිට වැයකර තිබුණේ රු.1,524,418 ක් පමණ වන අතර මෙම ඌන උපයෝජනය හේතුවෙන් අපේක්ෂිත පහත සඳහන් කරුණු ඉටුකිරීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය විය.

(i) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුල පවතින මනෝ සමාජයීය විශේෂඥ යන තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණි. මේ අනුව මානසික ආතතියට ලක්වූ රණවිරුවන්ගේ මානසික සමබරතාවය ආරක්ෂා කරගැනීමට සුදුසු වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම තුලින් අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ii) රණවිරු පවුල්වල යැපෙන්නන් තුල ඇති මනෝ සමාජයීය ප්‍රශ්න සම්බන්ධව ඔවුන් සමග සාකච්ඡා කර අදාල ගැටළු හදුනාගෙන ඒ පිළිබදව ව්‍යාපෘතිභාර නිලධාරීව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් නොතිබුණි.

(iii) රණවිරු යැපෙන්නන්ගේ මානසික මට්ටම සවිබල ගැන්වීම සඳහා 2011 වර්ෂය මැද දී හදුනාගෙන තිබූ මනෝ විද්‍යාත්මක වැඩ සටහන් පැවැත්වීම , මනෝ උපදේශක සායන පැවැත්වීම , බාහිර ආයතනවල උපදේශකවරුන් පුහුණුකිරීම හා සම්බන්ධීකරණය , බාහිර සමාජය රණවිරුවා වෙනුවෙන් සංවේදි කිරීම සඳහා ක්‍රියාකිරීම ආදී වැඩසටහන් කිසිවක් 2011 වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) <u>ඉඩම් ව්‍යාපෘතිය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉඩම් ව්‍යාපෘතිය යටතේ රණවිරුවන් අතර බෙදා දීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අධිකාරියට ලැබී තිබුණු අක්කර 65 ක් පමණ වූ ඉඩම් 9 ක් අත්පත් කරගෙන වර්ෂ 2 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් ගතවී ඇතත් ඒවා සුදුසු පාර්ශවයන් වෙත බෙදා දීමට කටයුතු හා නොතිබුණි.

(ii) රණවිරු සුභසාධනය සඳහා රණවිරුවන් අතර බෙදා දීමට විවිධ පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගෙන් අධිකාරිය වෙත ලැබුණු අක්කර 39 ක් පමණ වූ ඉඩම් 7 ක් වර්ෂ 2 කටත් වැඩි කාලයක සිට එම අදාල කටයුතු සඳහා යොදා නොගෙන පැවතුනි.

(ඊ) <u>සමාජයීය හා සංස්කෘතික අංශයේ ප්‍රගතිය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වැඩසටහන් සංඛ්‍යාව 13 ක්වූ අතර ඒ සඳහා රු. 21,080,868 ක් ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් 2011 සැප්තැම්බර් 30 දින වන විට වැය කර තිබුණේ රු. 12,138,886 ක් වූ අතර එය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් 57.58% ක් පමණි.

(ii) නායකත්ව පුහුණු වැඩමුළු පැවැත්වීම , මාපිය කැපකරු දූදරු හමුව, සංසද සම්මේලනය හා වාර්ෂික දැනුවත් කිරීම්, දිස්ත්‍රික් දැනුවත් කිරීම්, සමාජිකත්වය රඳවා ගැනීමේ, වැඩසටහන්, පොකුරු වැඩසටහන්, රණවිරු දෙමාපියන් සඳහා වැඩසටහන් ළමා වැඩසටහන් ආදිය පැවැත්වීම සම්බන්ධයෙන් කාලවකවානු හා ස්ථාන ආදිය හඳුනාගනිමින් විධිමත් පරිදි සැලසුම්කර නොතිබූ අතර ඒවා ක්‍රියාත්මක කිරීමද දුර්වල මට්ටමක පැවතුනි.

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ සංසද සාමාජිකයන් සඳහා හදිසි ආපදාවන්හිදී මූල්‍ය ආධාර ලබාදීම සඳහා වෙන්කර තිබූ රු. 12,350,000 න් රු 12,070,000 ක්ම වැය කර තිබුණි. ඒ අනුව මූල්‍ය ආධාර හා ණය සැපයීම සිදුවූවත්, මනෝසමාජයීය ගැටළු කෙරෙහි දක්වන අවධානය ඉතාම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්

--------------------------------------------------------------------------

(i) එක් එක් ව්‍යාපෘතියට අදාලව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩ කොටස් හා ඊට අදාලව අනුගමනය කෙරෙන පටිපාටි හා ඊට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමයන් පිළිබඳ සටහන් 2011 නොවැම්බර් 16 දින සිට අවස්ථා කිහිපයකදීම විගණනය විසින් ඉල්ලා ඇතත් ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට මෙතෙක් අධිකාරිය අපොහොසත් වී ඇත.

(ii) අධිකාරියට අදාල සංයුක්ත සැලැස්මද විධිමත් ලෙස සකස් කර ගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද දැනුවත් කර ඇතත් එයද මෙතෙක් අධිකාරිය විසින් සම්පූර්ණ කරගෙන නොතිබුණි. තවද 2011 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මද විධිමත් පරිදි දින වකවානු හා ස්ථාන හඳුනාගැනීම් සිදුකර නොතිබුණි.

(iii) ඉහත නිරීක්ෂණ අනුව අධිකාරිය රජයේ මුදල් වැයකර රණවිරු සුභසාධනය ඇතිකිරීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයන්, ක්‍රියාකාරකම් හා පාලනක්‍රම හඳුනාගෙන නොමැතිබවත් ඒ අනුව ඊට අදාල සැලසුම් සැකසීම ඉතාම දුර්වල මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් විපතට පත් දරුවන් වෙනුවෙන් සංවිධානය කල වැඩමුළුවක් සඳහා දරුවන් 06 දෙනෙකු සහභාගී කරවීම සඳහා අධිකාරිය විසින් අධ්‍යාපන නිපුනතා හා ආර්ථික සංවර්ධන අංශය යටතේ රු. 161,900ක් වැය කර තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමක් හෝ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) මෙම අංශය භාරව ව්‍යාපෘති නිලධාරියෙකු සිටියදී ඔහුගේ අධීක්ෂණය යටතේ එම කටයුතු සිදුවී නොතිබුණි. ඊට අදාල සංවිධාන කටයුතු සිදු කර තිබුණේ ව්‍යාපෘති සහකාර විසිනි.

(iii) සිසුන් 06 දෙනා තෝරා ගත් ආකාරය පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් තිරීමට අධිකාරිය අපොහොසත් විය.

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා මූලයාධාර වශයෙන් බාහිර පාර්ශවයන්ගෙන් රු. 444,410 ක් ලැබී තිබූ අතර එම මුදල් අදාල කාර්යය සඳහා යොදවා ගත්තේද යන්න තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. තවද රු. 336,410 ක ලැබීම් අධිකාරියේ පොත්වල සටහන් වී නොතිබුණි.

(ආ) <u>කොඩි අලෙවි කර ආදායම් රැස්කිරීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රණවිරු කොඩි අලෙවි ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනයේ රු. 4,528,815 ක් දක්වා තිබූ අතර එය රැස්කරගත් හා ගණනය කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) මුද්‍රණය කරන ලද කොඩි ප්‍රමාණය , අලෙවිය සඳහා බෙදා දුන් කොඩි ප්‍රමාණය, අලෙවි කර මුදල් රැස්කර ගැනීමේ හා තවදුරටත් විකිණීම සඳහා ඉතිරිව තිබූ කොඩි ප්‍රමාණයන් පිළිබඳ විස්තර (සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය වෙනුවෙන්) විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අධිකාරිය අපොහොසත් විය.

(iii) විගණනය සඳහා ඉල්ලන ලද තොරතුරු ලබා ගැනීමට ප්‍රමාණවත් ලේඛන අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණු අතර ආදායම් රැස්කිරීමේදී යොදා ගන්නා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අනුගමනය කරන අභ්‍යන්තර පාලන ක්‍රමය ඉතාම දුර්වල මට්ටමක පවතින බවත් ඒ අනුව කොඩි අලෙවි ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවයක් නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) <u>ආධාර ලබා දීම</u>

(i) අධිකාරිය විසින් රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ආධාර ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් පරිදි මුදල් වැය කර තිබුණි

| | රු. |
|---|---|
| නිවාස ආධාර | 10,865,834 |
| ක්ෂණික ආධාර | 13,849,000 |
| ස්වයං රැකියා ආධාර | 1,220,000 |
| නාන කාමර ආධාර | 7,729,000 |

(ii) උක්ත වියදම රු. 33,663,834 ක් වූ අතර එය මුළු ව්‍යාපෘති මෙහෙයුම් වියදමින් 35% ක් විය. ඊට අදාල මෙහෙයුම් කටයුතු සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

- ❖ එක් අයෙකුට රු.100,000 බැගින් නිවාස ආධාරද රු.30,000 බැගින් ස්වයංරැකියා ආධාරද රු.20,000 සිට 50,000 දක්වා නානකාමර ආධාරද රු.10,000 බැගින් ක්ෂණික ආධාරද රණවිරුවන් වෙත නිකුත් කරනු ලැබුවත් ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් විධිමත් ලේඛන අධිකාරිය විසින් නඩත්තු කර නොතිබුණි.

- ❖ පලාත් නිලධාරී විසින් නිර්දේශ කර අදාල ඉල්ලුම්පත් අධිකාරිය වෙත යොමු කරනු ලැබුවද එක් අයෙකුට එක් වරක් පමනක් ආධාර මුදල් නිකුත්

කෙරෙන බව තහවුරු කරගත හැකිවන පරිදි සුපරීක්ෂණ පාලන ක්‍රමයක් හඳුන්වාදී නොතිබුණි.

- ආබාධිත රණවිරුවන් හා යැපෙන්නන් පිළිබඳ ලේඛනයක් සැකසීම හා යාවත්කාලීන කිරීම අධිකාරියේ මූලික අරමුණක් වුවද මෙතෙක් එම කාර්යය සම්පූර්ණවී නොමැති බැවින් ප්‍රතිලාභීන් හඳුනාගැනීමද අධිකාරිය විසින් විධිමත්ව හා විනිවිදභාවයකින් යුක්තව සිදුකර නොතිබුණි.

- සැපයූ ආධාර මුදල් නියමිත කාර්යය සඳහා යොදවනු ලැබුවේද යන්න තහවුරු කර ගැනීම සඳහා පසුවිපරම් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අධිකාරිය විසින් හඳුන්වා දී නොතිබුණි.

- ආධාර මුදල් වාරික වශයෙන් නිකුත් කරන අවස්ථාවලදී එකිනෙක වාරිකයෙන් නිමකල යුතු වැඩ කොටස් හා ඒවා නිම කිරීමට අදාල කාලවකවානු ඇතුලත් පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම නිසා අපේක්ෂිත අරමුණු කාර්යක්ෂම හා ඵලදායී ලෙස ලගාකර ගත හැකි වන පරිදි විනිවිදභාවයකින් යුක්තව අරමුදල් යෙදවීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

- 2010 හා 2011 වර්ෂ වල දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවියයුතු නිවාස ආධාර වශයෙන් රු 5,200,000 ක් දක්වා තිබූ අතර එය ගණනය කළ ආකාරය පිළිබඳ විස්තර ඇතුලත් උපලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අධිකාරිය අපොහොසත් විය. අධිකාරියේ නඩත්තු කර තිබෙන අසම්පූර්ණ වාර්තා පරීක්ෂා කිරීමේදී හා අදාල පාර්ශව සමග විමසීමේදී සමහර ප්‍රතිලාභීන් කවුරුන්ද යන්න දැනට සොයාගත නොහැකි තත්ත්වයකට ද අධිකාරිය දැනට මුහුණ පා සිටින බව අනාවරණය කර ගත හැකි විය.

(ඈ) <u>නව ගොඩනැගිල්ල සඳහා වියදම් දැරීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2009 වර්ෂයේදී රු. 90,000,000 ක් වැයකර සළුසල ආයතනයට අයත්ව තිබූ අර්ධ වශයෙන් වැඩ නිම කල දෙමහල් ගොඩනැගිල්ලක් අත්පත් කරගෙන තිබුණි.

(ii) ඉන්පසුව මෙම ගොඩනැගිල්ල සඳහා අමතර මහල් 03 ක් එකතු කිරීමට අධිකාරිය සැලසුම් සකස් කර ඒ සඳහා යුධ හමුදා ඉංජිනේරු අංශයේ ශ්‍රම දායකත්වය ලබා ගැනීමට (අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ) කටයුතු කර තිබුණු අතර ඒ සඳහා ගෙවීම් ද කර නොතිබුණි. ඉදිකිරීම් වෙනුවෙන් දෙපාර්ශවය අතර ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයට අදාල ප්‍රතිපාදන වලින්, ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිව හදිසි අවශ්‍යතාවයක් සේ සලකා 2011 දෙසැම්බර් මස මිළදී ගෙන තිබූ රු 1,937,133 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන 2012 මැයි 31 දින දක්වාම නිෂ්කාර්ය ලෙස අනාරක්ෂිතව රඳවා ගෙන තිබුණි. මේ අනුව එම වත්කම්වල වගකීම් කාලය නිකරුණේ ගතවී යාමෙන් හා නිකරුණේ වත්කම් රඳවා ගැනීමෙන් ආයතනය වත්කම් කළමනාකරණ කටයුතු හා මූල්‍ය පාලන කටයුතු ඵලදායී ලෙස සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

කාර්ය මණ්ඩල කළමනාකරණය

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය කාල පරාසය තුලදී , අධිකාරිය මගින් කලයුතු කාර්ය භාරය පුළුල් වී ඇතත් ඊට අනුකූල වන පරිදි සංවිධාන සැලැස්මක් සකස් කර අනුමත කරවා ගැනීමට හා ඊට අනුව කාර්ය මණ්ඩල බඳවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) අධිකාරිය යටතේ සහන ලබන්නන් යම් මානසික ආතතියකට පත් වූවන් කණ්ඩායමක් වන අතර ඔවුන්ට මූල්‍යමය සහන වලට අමතරව ප්‍රමුඛත්වය ලා සැලකිය යුත්තේ මානසික මට්ටම සමබරව තබා ගැනීම වූවද, ඒ සඳහා ගැලපෙන වැඩසටහන් සැකසීමට හැකියාවක් තිබෙන, මනෝ සමාජයීය විශේෂඥ තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවාගැනීමට 2003 දෙසැම්බර් 01 දින සිට මේ දක්වා අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2007 වර්ෂයේදී වැඩ තහනමකට ලක්කර තිබූ ගණකාධිකාරී තනතුර සඳහා එම පරීක්ෂණ කටයුතු නිම කිරීමට හෝ වෙනත් ස්ථිර නිලධාරියකු බඳවාගැනීමට අධිකාරිය මෙතෙක් අපොහොසත් වී තිබුණි.

(ඈ) මීට අමතරව පරිපාලන නිලධාරී ,නීති නිලධාරී , අභ්‍යන්තර විගණක , ව්‍යාපෘති කළමනාකාර යන තනතුරු සඳහාද ස්ථිර නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ඉ) අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කලයුතු වැඩ කොටස් යටතේ සිදුවිය යුතු ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා සම්බන්ධ වගකීම්, සේවකයන් වෙත පැවරෙන පරිදි රාජකාරි පැවරීම සිදුකර නොතිබුණි.

(ඊ) පුරප්පාඩු අනුව තනතුරේ ස්ථිර කල හැකිද යන්න සලකා බලා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් 2009 නොවැම්බර් 25 දිනැති අංක 20/2009 චක්‍රලේඛ විධිවිධාන අනුව ඔවුන් ස්ථිර කිරීම සඳහා හැකියාව ඇතත් 2004 ඔක්තෝබර් 01 දින සිට 2009 මැයි 31 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත අධිකාරියට බඳවාගෙන තිබූ කාර්ය මණ්ඩලයේ 19 දෙනෙකු සම්බන්ධයෙන් මෙතෙක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) ත්‍රිවිධ හමුදා හා පොලිසියේ නිලධාරීන් 30 දෙනෙකු රණවිරු සේවා අධිකාරියේ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇතත් එම නිලධාරීන් විසින් සිදුකල යුතු කාර්යභාරයන් හඳුනාගෙන ලිඛිතව වැඩ පැවරීම් සිදුකර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6. 5. 1. වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2012 අප්‍රේල් 10 දිනදීය. එසේ වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

2011-2016 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන චක්‍රලේඛය ප්‍රකාර සකස් කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

අධිකාරිය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මගින් අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමේදී ඒවා සම්බන්ධ වගකිවයුතු පාර්ශවයන් හා නිම කළයුතු කාලවකවානු දක්වා නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

